# දහම් පාසල

## 11 ශ්‍රේණීය

# බුද්ධ චරිතය

### පෙළපොත් ආශ්‍රිත කෙටි සටහන්



දන්ත වෛද්‍ය පීය බෞද්ධ සහෝදර සංගමයේ තිළිණයකි
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

පවතින COVID - 19
වසංගත තත්ත්වය
සැලකිල්ලට ගනිමින්
ඉගෙනුම් ඉගැන්වීම්
ක්‍රියාවලියේ පහසුව
වෙනුවෙන් මුල් කර්තෘනට
හානි නොවන අයුරින් දහම්
පාසල් පෙළපොත්
ආශ්‍රයෙන් කෙටිසටහන්
නිර්මාණය කරන ලදි.

තෙරුවන් සරණයි !

# පිදුම

ආදරණීය නංගියේ , මල්ලියේ...
ඔබේ දහම් නැණ වඩවාලන්නට...
පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය
දන්ත වෛද්‍ය පීඨ
බෞද්ධ සහෝදර සංගමයෙන්
පිදෙන
දහම් පඬුරකි මේ...!



# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01 | බුද්ධ කාලීන භාරතීය සමාජ පසුබිම | 1 |
| 02 | බුද්ධ කාලීන භාරතීය දේශපාලන පසුබිම | 5 |
| 03 | බුද්ධ කාලීන භාරතීය ආර්ථික පසුබිම | 10 |
| 04 | බුද්ධ කාලීන භාරතීය ආගමික හා දාර්ශනික පසුබිම | 13 |
| 05 | ශාක්‍යයන්ගේ හා කෝලියයන්ගේ සම්භවය | 20 |
| 06 | යොවුන්විය හා ගිහිගෙය කලකිරීම් | 22 |
| 07 | උදාන සහ සත්සතිය | 28 |
| 08 | බුදුරදුන් ලොවට හෙළිකළ ශ්‍රේෂ්ඨ ධර්මය | 32 |
| 09 | ධර්ම ප්‍රචාරක කටයුතු සහ බුදුසසුනේ ව්‍යාප්තිය | 38 |
| 10 | බුදුසසුනේ ශීඝ්‍ර ව්‍යාප්තිය | 42 |
| 11 | මෙහෙණි සස්න පිහිටුවීම | 44 |
| 12 | බුදුසසුනේ ස්ථිරත්වය සඳහා කටයුතු පිළියෙළ කිරීම | 49 |
| 13 | තථාගත ජීවිතයේ අවසාන සතිය | 53 |
| 14 | බුද්ධ චරිතයේ විශේෂ ලක්ෂණ | 58 |
| 15 | බුදුරජාණන් වහන්සේ තුළ පිහිටි ලොව්තුරු මහා ගුණ විශේෂයෝ | 60 |
| 16 | බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ නායකත්වය | 64 |
| 17 | බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ සමාජ ශෝධකත්වය | 66 |
| 18 | සිවුවනක් පිරිස හඳුනාගැනීම | 68 |
| 19 | භික්ෂුණී ශාසනය | 73 |
| 20 | බුද්ධ ශාසනයේ උපාසකවරු | 76 |
| 21 | බුද්ධ ශාසනයේ උපාසිකාවෝ | 81 |

# 1. බුද්ධ කාලීන භාරතයේ සමාජ පසුබිම

- බුදුරජාණන් වහන්සේ පහළ වුයේ ක්‍රි.පූ 6 වන සියවසේදීය.
- එය ඉතාමත් සංකීර්ණ සමාජ පරිසරයක් තිබූ කාලසීමාවකි.
- එකල සමාජ සම්භවය මුලුමනින්ම ආක්‍රමණය කර සිටියේ බ්‍රාහ්මණයන්ය.
- සමාජ ප්‍රභවය,සමාජ සංවිධාන තුල ඒ ඒ සමාජයට හිමි තැන,කාන්තාවන් සතු වගකීම් ආදියත් ඔවුනට හිමි තැනත් ආදි සමස්තය බමුණන් තීරණය කළහ.

## සමාජ ප්‍රභවය

- සමාජ ප්‍රභවය පිලිබඳව බමුණන්ට ආදාලව කරුණු අන්තර්ගත වනුයේ **වේදයෙහිය.** බමුණු සම්භවය සහ විකාශය පිළිබඳව ඍග්වේදයේ 10 වන මණ්ඩලයේ මෙසේ සඳහන් වේ.

**"බ්‍රාහ්මණෛයාසය මුඛමාසීද්**
**බාහු රාජන්‍යඃ කෘතඃ**
**ඌරු තදස්‍ය යද් වෛශ්‍ය**
**පද්භ්‍යාං ශුද්‍රො  අජායත "**

**මහා බ්‍රහ්මයාගේ,**

- **මුඛයෙන්-බ්‍රාහ්මණ**
- **බාහු -ක්ෂත්‍රීය**
- **කලවා-වයිශ්‍ය**
- **දෙපතුල්-ශුද්‍ර**

**වර්ණයෙන් උපන් බවයි.**

- මේ සියල්ලෙහිම අධිපති සර්ව බලධාරී මහා බ්‍රහ්මයා ය.



## සමාජ විශමතා

- ප්‍රධාන කුල 4 කි.
- බ්‍රාහ්මණ, ක්ෂත්‍රීය, වෛශ්‍යය, ශුද්‍ර යන මේවා චතුර්වර්ණය ලෙස හැඳින් වේ.
- ක්‍රි.පූ. 1500 පමණ මධ්‍ය ආසියාවේ සිට ඉන්දියාවට සංක්‍රමණය වූ මිනිසුන් පැහැපත් වූ අතර,ඉන්දියාවේ සිටි මුල් පදිංචිකරුවන් කාල වර්ණයෙන් යුක්ත විය.
- දෙපාර්ශය අතර වර්ණය පදනම් කරගෙන ආර්‍ය, අනාර්‍ය ලෙස වර්ණ භේදයක් ඇතිවිය.
- එසේම කුලය අනුව මිනිසා වර්ග කරයි.
- සම්මත කුලවල උපන් ජනයාට වරප්‍රසාද රැසක් හිමි වූ අතර පහත් කුල වල ජනයාට කිසිදු වරප්‍රසාදයක් හිමි නොවුණි.

## බ්‍රාහ්මණ කුලය

- උසස්ම ස්ථානය හිමි වුයේ බ්‍රාහ්මණයන්ටයි.
- ඔවුන් මහා බ්‍රහ්මයාගේ නියෝජිතයන් වේ.
- ඍග්,යජුර්,සාමන්,අථර්වන් වේද දැනුම බමුණන් සතු විය.
- ත්‍රිවේද විශාරද බමුණා වේදගු වේ.
- මනුස්මෘතියට අනුව දන් දීම, දන් පිලිගැන්වීම, යාග කිරීම - කරවීම, ඉගෙනීම - ඉගැන්වීම ක්‍රියා රැසක් බමුණන් විසින් සිදු කරන ලදි.
- අශ්ව මේධ, පුරුෂ මේධ, වාජපේය, නීරග්ගල ආදී යාගහෝම යන්හී අනුශාසකත්වය හා සංවිධානයද මෙහෙයවීමද ඇතිව බමුණන් විසින් යාගහෝම පැවැත්විය.
- මෙම යාගහෝම සඳහා තිරිසන් සතුන් සහ මිනිසුන් මරා බිලි දුන්හ.
- අස්සලායන සූත්‍රයේ ද බමුණන්ගේ සශ්‍රිකත්වය පිළිඹිබු කරයි.

"බ්‍රාහ්මණයෝ ශ්‍රේෂ්ඨය. සෙසු වර්ණයන් එසේ නොවෙයි සෙසු කුල පහත් ය............" ( අස්සලායන සූත්‍රය )





## ක්ෂත්‍රීය කුලය

- ක්ෂත්‍රීය වර්ණයට හිමි වුයේ රාජ්‍ය පාලනය සම්බන්ධ පාලන පිළිවෙත් කිපයකි.
- මනුෂ්‍ය ජාතියට අදාළව දන් දීම, යාග කිරීම, ඉගෙනීම, රාජ්‍ය පලනය, කාමයෙහි නොඇලීම යන ඒවාය.
- මෙහිදී නීති අණපනත් පිලිබදව ඔවුන් ඉගෙනිය යුතුය.

## වෛශ්‍ය කුලය

- වෛශ්‍ය වර්ණයෝ කෘෂි කර්මාන්තය, වෙලදාම, සත්ව පාලනය ආදි වූ ආර්ථික අංශය නියෝජනය කළහ.
- දන් දීම, යාග කිරීම, ඉගෙනීම, වෙලදාම, මුදල් පොලීකරණය, සත්ව පාලනය ආදිය ඔවුන්ට ලැබුනු ඝකියාවන් ය.



## ශුද්‍ර කුලය

- සමාජයේ පහත්ම කුලය වුයේ ශුද්‍ර වර්ණයයි.
- ඔවුන් ඉහත කුල 3ටම මෙහෙකරුවන් වශයෙන් කටයුතු කල යුතු විය.
- වේද පාඨ ගායනය කලහොත් හෝ ශ්‍රවණය කලහොත් දැඩි දඩුවම් හිමි වු අතර ඔවුන් වහල් සේවය, කසල ශෝදනය වැනි ක්‍රියාවල නිරත විය.



- ඉහත ප්‍රධාන කුල 4 හැරුනු විට ඉතාමත් පහත් ලෙස සලකන ලද්දේ පංචමයෝය.
- වේණ (කුලුපොතු කාරයෝ), නේසාද (වැද්දෝ), පුක්කුස (කසල ශෝද්කයෝ), චණ්ඩාල (සැඩොල්ලු), රථකාර (රිය තනන්නෝ) යනුවෙන් ඔවුන් හැඳින් වේ
- ඔවුන් ශුද්‍රයන්ට වඩා අතිශය කටුක ජීවිත ගත කළහ.

## ආශ්‍රම ධර්ම

- බ්‍රාහ්මණ ධර්මයට අනුව චතුර් ආශ්‍රම ධර්ම ලෙස පුද්ගලයෙකුගේ ජීවිතය අවස්ථා 4කට බෙදන ලදි.
- මුල් කොටස බ්‍රහ්මචාරී අවධිය නම් වේ. එනම් අධ්‍යාපනය ලැබිය යුතු වකවානුවයි.
- බ්‍රාහ්මණ සහ ක්ෂත්‍රිය කුලවල දරුවන් තක්සලාවෙහි අධ්‍යාපනය ලැබූ අතර බඹසරින් යුතු පිරිසිදු ජීවිතයක් ගත කළහ.
- සොලොස්විය ඉක්මවා තරුණ අවදියට පැමිණි පසු විවාහ ජීවිතයකට ඇතුලත් වී, අඹුදරුවන් පෝෂණය කරමින් ජීවත් වීම ගෘහස්ථ ජීවන අවස්ථාවයි.
- මධ්‍යම වයසට පත්වීමෙන් පසු වනගතව විමුක්තිය සොයමින් ජීවත් විය යුතු අතර එය වාන ප්‍රස්ථ අවදියයි.
- ජිවිතයේ අවසාන කාල පරිච්ඡේදය සන්‍යාසි නමින් හඳුන්වයි.එනම් සංචාරක ජිවිතයක් ගත කළ යුතුය.

## කාන්තා සමාජය

- කාන්තාවන්ට හිමි වුයේ ඉතාමත් පහත් ස්ථානයකි. ඔවුන් දුෂ්කර කටුක ජීවීතයක් ගත කළහ.
- ආගමික පිලිවෙත් හී නියැලීම ඔවුන්ට තහනම් ය.
- ගැහැනු දරුවන්ගේ උපත පිලිකුල් කළ අතර ඇය උපතින්ම චපල, මෝඩ යනුවෙන් පෙන්වා දෙන ලදි.



# 2. බුද්ධ කාලීන භාරතීය දේශපාලන පසුබිම

- බුදු රදුන් පහල වූ ක්‍රි.පූ 6 වන සියවසේදී භාරතය ඒකාධිපති පාලකයෙකුගේ අණසක නොපැවතුනි.
- එකල ප්‍රධාන රාජ්‍ය 4ක් හා සමූහාණ්ඩු කීපයක් පැවතුනි.
- සමූහාණ්ඩු 4 නම්

| | |
|---|---|
| 1. මගධ | 3. වත්ස |
| 2. කෝසල | 4. අවන්ති |

## මගධ රාජ්‍යය




- උතුරින්-ගංගා නදිය ද
- නැගෙනහිරින්-චම්පා නදියද වින්ද්‍යා කඳු වැටියද
- බටහිරින්-සෝණ නදියෙන් ද වට වූ රාජ්‍යයි

- අගනුවර - මුල් කාලයේදි අගනුවර වුයේ රජගහ නුවරයි.
- අංග ජනපදය ද මගද රාජ්‍යට අයත් විය.(සොලොස් මහා ජනපද අතුරින් එකකි.)
- ගිජ්ජකූට, ඉසිගිලි, වේභාර, වේපුල්ල සහ පාණ්ඩව යන පංච මහා පර්වතයන්ගෙන් මගධය සැදුම් ලත්ය.
- බුද්ධ කාලීන පාලකයා - බිම්බිසාර රජු
- බිම්බිසාර රජුගෙන් පසු අජාසත්ත කුමරු රාජ්‍ය පාලනය කරන ලදි.
- ගම් අසූ දහසක් පැවති මෙම රාජ්‍යයේදී සිද්ධාර්ථ කුමරු බුදු බව ලැබූහ.
- බිම්බිසාර රජු විවාහ සබඳතා මගින් ද ඇතැම් විට යුධ වැදිමෙන් ද රාජ්‍ය වර්ධනය කර ගත්හ. අජාසත්ත කුමරු විසින් බිම්බිසාර රජු ඝාතනය කර රාජ්‍ය පාලනය කල අතර පසුව අජාසත්ත රජු සසුන් ගතව සසුනට මහඟු සේවයක් ඉටු කළහ.

## කෝසල රාජ්‍ය




- දෙවන බලවත් රාජ්‍ය
- බුද්ධ කාලීන පාලකයා - පසේනදි කෝසල රජු
- බන්ධුල සේනාධිපතියා රජුට සමීපව කටයුතු කර ඇත.
- අගනුවර - සැවැත්නුවර
    - දකුණින්-ගංගා නදිය
    - උතුරින්-නේපාල ප්‍රාන්තය
    - නැගෙනහිරින්-සදානිරා නදිය
    - බටහිරින්-පංචාල රට

කෝසලට අයත් වේ.

- ප්‍රථම ධර්ම දේශනාව-බරණැස ඉසිපතන මිගදායේ යේ සිදු විය.
- බිම්බිසාර රජු සමග සමීප සබඳතා පවත්වා ඇත.
- ශාක්‍යයෝ විසින් රජුගෙන් පලි ගැනීමට දාසියකගේ දියණියක වූ "වාසභ කත්තියා" ඇසි කුමරිය රජු රවටා විවාහ කර දුන්හ.
- විඩූඩභ ඇයගේ පුත්‍රයා ය.
- දීඝකාරායන ඇමතියා කුමන්ත්‍රණයකින් විඩූඩභ කුමරා රජකමට පත් කළහ.
- කුමන්ත්‍රණයෙන් පසු අජාසත්ත රජු හමුවීමට ගිය කොසොල් රජු මගදී රෝගාතුර වීමෙන් මරණයට පත් වී ඇත.

## වත්ස රාජ්‍ය (වංශ ජනපදය)

- අගනුවර-කොසඹෑ නුවර
- වත්ස රාජ්‍ය
    - අවන්ති රාජ්‍යට-උතුරින් ද
    - කොසොල් රටට හා යමුනා නදියට-දකුණින් ද
    - කායිසි ජනපදයට-බස්නාහිරින් ද
    - චේතිය ජනපදයට-නැගෙනහිරින් ද පිහිටා ඇත.

- බුද්ධ කාලීන පාලකයා - උදේනි රජු
- ඝෝෂිතාරාමය පිහිටියේ මෙම රාජ්‍යයේ ය.
- ඝෝෂිතාරාමයේ දී ධර්මධර සහ විනයදර භික්ෂූන් අතර ගැටුමක් ඇති විය.
- බුදු රදුන් එය සමනය කිරීමට වැඩම කල නමුත් පලක් නොවූ විට උන්වහන්සේ පාරිලෝය වනයට වැඩම කල බව සදහන් වේ.

## අවන්ති රාජ්‍ය

- අගනුවර-උදේනි නගරය
- පාලකයා-චන්ඩපජ්ජෝත රජු (සැර පරුෂ පාලකයකි.)
    - දකුණින්-අස්සක රටින්ද
    - උතුරින්-සූරසේන ජනපදයෙන්ද
    - නැගෙනහිරින්-චේතිය ජනපදයෙන්ද
    - බටහිරින්-මහ මුහුදින්ද සීමා වේ.

- උතුරු සහ දකුණ ලෙස රාජ්‍ය කොටස් දෙකකට බෙදී තිබුණි.
- ගෝවින්ද" නම් බමුණෙකු විසින් තැනූ "මාහිස්සති නම් ප්‍රසිද්ධ නගරයක් මෙහි පිහිටා තිබුණි.
- රජු දැඩිව රෝගාබාධ වූ අවස්ථාවේදී බිම්බිසාර රජු විසින් ජීවක වෛද්‍යවරයා ලවා රජු සුවපත් කරන ලදි.
- බිම්බිසාර රජු අජාසත්ත රජු විසින් ඝාතනය කිරීම නිසා පච්ජෝතව රජු අජාසත්ත රජු සමග දැඩි වෛරයකින් පසු විය.
- කච්චාන හිමිගෙන් දහම් අසා රජු බුදු දහම වැළද ගත්හ.

**රාජ්‍යයේ පරිපාලනය,ආර්ථික,අධිකරණ කටයුතු මෙහෙයවූ නිළධාරී පද්ධතිය.**



- රාජාණ්ඩු පාලන ක්‍රමවල විධායක බලය රජු සතුවන අතර පුරොහිත, ඇමති සහ සෙන්පති ආදින්ගේ සභය ද එහි දී දැකිය හැක.
- රාජ්‍යත්වය දෙවු නීතියට එනම් පියාගෙන් පුතාට නැතිනම් වැඩිමල් සොයුරාහෙන් බාල සොයුරාට හිමි විය.

- අනාගත පාලකයන් පුරුදු කිරීමේ කර්තව්‍ය බමුණන් සතු විය.
- පරිපාලන කටයුතු ගම් මට්ටමින් සිදු වූ අතර පාලන නිලධාරියා "ග්‍රාම භෝජක" ලෙසත් ගම් ප්‍රධානියා "ගාමිණි" ලෙසත් හැඳින්වේ.
- ප්‍රදේශයේ බදු අය කිරීම ග්‍රාම භෝජකට භාර විය.
- පරිපාලන කටයුතු නගර මට්ටමින් සිදු වන විට නගරය සම්බන්ධයෙන් රජුට වගකිව යුතු තැනැත්තා "නගර ගුත්තික" නම් වේ.
- චතුරංගනී සේනාවකින් රාජ්‍ය බාහිර හා අභ්‍යන්තර වශයෙන් රැකවල් දෙයි.
- "ධර්ම සභාව" නම් අධිකරනය හරහා රාජ්‍ය නීති උල්ලංඝනය කරන්නවුන්ට දැඩි දඬුවම් පැමිණුනි.
- රාජ්‍යයේ ආර්ථික අංශයේ ප්‍රධානියා "භාණ්ඩාගාරික" වේ.
- ආනයනික භාණ්ඩ මිල ගණන් නියම කිරීමට වෙනම නිලධාරින් පිරිසක් සිට ඇත.
- රාජ්‍ය සේවක වැටුප් සම්බන්ධ කටයුතු "රාසි වඩ්ඪක" නිලධාරියාට භාරය.

- බුද්ධකාලීන භාරතය තුල රාජාණ්ඩු මෙන් ම සමූහාණ්ඩු (ගණතන්ත්‍ර) ද පැවතී ඇත.

## (සමූහයක් එක්ව ගෙන ගිය පාලන ක්‍රම)

1. ශාක්‍යයන්ගේ-කපිලවස්තුව
2. ලිච්ඡවීන්ගේ-විශාලාව
3. මල්ලයන්ගේ-කුසිනාරාව හා පාවාව
4. භග්ගයන්ගේ-සුංසුමාරගිරිය
5. බුලිවරුන්ගේ-අල්ලකප්පය
6. කාලාමයන්ගේ-කේසපුත්තය
7. කෝලියයන්ගේ-රාමග්‍රාමය
8. මෞර්යයන්ගේ-පිප්ඵලිවනය
9. විදේහයන්ගේ-මිථිලාව

- මේවායේ ප්‍රභල ක්‍රමවත් පාලන ව්‍යවස්ථා විය.

උදා-ලිච්ඡවින්ගේ සප්ත අපරිහානීය ධර්ම

1. නිතර රැස්වීම
2. සමගිව රැස්ව,සමගිව කටයුතු කර සමගිව විසිර යාම
3. නොපැනවූ නීති නොපැනවීම හා පැනවූ නීති නොකැඩවීම
4. වැඩිහිටියන්ට ගරු කිරීම හා ඔවුන්ගේ උපදෙස් පිලිපැදීම
5. කුල කාන්තාවන් ආරක්ෂා කිරීම
6. පූජනීය ස්ථානවලට කඩ නොකොට අවශ්‍ය වතාවත් කිරීම
7. ගුණවත් රහතුන්ට සිය රාජ්‍යයේ නිසි රැකවරණය සැලසීම

- මෙම නීති මාලාවට ක්‍රියා කල ලිච්ඡවී රාජ්‍ය අපරාජිත රාජ්‍යයක් විය.

බුද්ධකාලීන භාරතය තුල ජනපද 16ක් පැවත ඇත

1. අංග
2. මගධ
3. කාසි
4. කෝසල
5. වජ්ජී
6. මල්ල
7. චේති
8. වංශ
9. කුරු
10. පංචාල
11. මත්ස
12. සූරසේන
13. අස්සක
14. අවන්ති
15. ගන්ධාර
16. කාම්බෝජ

- නිශ්චිත භූමි භාගයක්, සැලකිය යුතු ජනගහණයත් ස්වාධීන පාලන ක්‍රමයත් පැවති මෙම ජනපද ගම් සිය දහස් ගණනකින් යුතු විය.
- එසේම මේවා අතර මත්ස්‍ය න්‍යාය ක්‍රියාත්මක වූ බව පෙනේ(විශාල රාජ්‍යයන් විසින් කුඩා රාජ්‍යයන් අත්පත් කරගැනීම.)
- බුදු දහම පෙර කල භාරත දේශයේ පහල වූයේ මෙවන් දේශපාලන තත්වයකදීය.

# 3. බුද්ධ කාලීන භාරතීය ආර්ථික පසුබිම

**ප්‍රධාන සිරස්තල කිහිපයකි**

- ❖ කෘෂිකර්මය සත්ව පාලනය සහ ධීවර කටයුතු
- ❖ විවිධ නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත කටයුතු
- ❖ භාණ්ඩ බෙදාහැරීම හා වෙළඳාම පිළිබඳ කටයුතු
- ❖ විවිධ සේවා සැපයීම වලට අදාල කටයුතු

- ➢ මෙම බෙදා වෙන් කිරීම විවිධ ජන කොටස්වල ප්‍රධාන ජීවිකා වෘත්තීන් සැලකිල්ලට ගනිමින් සිදුකර ඇත.
- ➢ එකල ආර්ථික පසුබිම මූලික වශයෙන් වැඩවසම් ලක්ෂණ පිළිබිඹු කරන්නක් විය. එනම් සමාජයේ ආර්ථික ක්‍රියාවලිය රජය විසින් මූලිකව මෙහෙයවීමක් සිදු නොවීය.

## කෘෂිකර්මය සත්ව පාලනය සහ ධීවර කටයුතු

- පුරාතන භාරතයේ ආර්ථික ක්‍රමයෙහි පදනම වී ඇත්තේ කෘෂිකාර්මික ක්‍රියාවලියයි.
- ගංගාධාරයන් ආශ්‍රිතව පදිංචි වූ ආර්ය ජනයාගෙන් භාරතීය කෘෂි ශිෂ්ටාචාරය ආරම්භ වී ඇත.
- කෘෂි කටයුතු අතර ප්‍රමුඛ වූයේ වී ගොවිතැනයි.
- ශාක්‍ය වංශික රජවරු ද කෘෂි කටයුතු සමඟ සමග සම්බන්ධතා පවත්වා ඇත. ඔවුන් සමහර අයගේ නම් වල අගට ඕදන යන කොටස එක්වී තිබීම එයට නිදසුනකි.(ඕදන යනු බත්ය)
- සුද්ධෝදන, අමිතෝදන වැනි නම් මෙයට නිදසුන් වේ.
- එකල රජවරුන් විසින් වාර්ෂික කෘෂිකාර්මික උත්සව පවත්වා ඇත.
- තත්කාලීන වෛදික බ්‍රාහ්මණ සමාජ ක්‍රමය තුළ කෘෂිකර්මය, වෙළඳාම කරනු ලැබුයේ වෛශ්‍යයන් විසිනි. නමුත් කසීභාරද්වාජ වැනි බමුණන් ගැන ද බෞද්ධ සූත්‍ර දේශනා වල සටහන්ව තිබේ.
- වී ගොවිතැන හැරුණු විට අතුරු බෝග වගාව, හේන් ගොවිතැන් එකල පැවති බවට සාධක තිබේ.
- උඳු, මුං, තල, මෑ, කුරහන් හා එළවළු පලතුරු වර්ග ක්‍රමානුකූලව සකස් කරන ලද ගොවිබිම්වල වගා කර ඇත.
- කෘෂිකර්මාන්තය ආශ්‍රිත ග්‍රාමීය කර්මාන්තයක් වන ගව පාලනය මැනැවින් සංවිධානය කරන ලද විශාල ව්‍යාපාරයක් ලෙස පැවති ඇත.
- කෘෂිකාර්මික කටයුතුවලදී ගවයා ගොවියාට බෙහෙවින්ම උපකාරී වූ බැවින් ගව සම්පතට සමාන වෙනත් සම්පතක් නැතැයි එකල සැළකිණි.
- ගව පාලනයට අමතරව එළුවන් කුකුළන් හා ඌරන් මස් පිණිස ඇති කිරීම ගෘහ කර්මාන්තයක ස්වරූපයෙන් පැවති ඇත.
- සූකරිකයෝ ඌරන්, මිගලුද්දකයෝ මුවන්ද, සකුණලුද්දකයෝ කුරුල්ලන්ද මරා විකුණා ඇත. ධීවර කාර්මිකයන් කෙවුලන් ලෙස හඳුන්වා ඇත.

## විවිධ නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත කටයුතු

- රෙදිපිළි නිෂ්පාදනය සම්භාණ්ඩ නිෂ්පාදනය, දැව භාණ්ඩ නිෂ්පාදනය, ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය, මැටි භාණ්ඩ නිපදවීම, රන් භාණ්ඩ නිපදවීම කෘෂි උපකරණ නිපදවීම, කලා භාණ්ඩ නිපදවීම ආදී නිෂ්පාදන කර්මාන්ත එකල පැවති ඇත.
- මෙම කර්මාන්ත පාරම්පරිකව උරුම වූවන් විය. ශිල්පීය කුලයක ප්‍රධානියා "ජෙට්ඨක" නමින් හැඳින්විණි
- මෙම ශිල්පීය කර්මාන්ත සඳහා ශිල්ප ශ්‍රේණි තිබී ඇත. එවැනි **ශ්‍රේණි දහ අටක්** ජාතක කතාවල සඳහන් වේ.
- කඩු ශිල්පය, දුණු ශිල්පය, හස්ති ශිල්පය,අශ්ව ශිල්පය, ගෘහ නිර්මාණ ශිල්පය මේ අතරින් මුල් තැනක් රැගෙන ඇත.
- පේෂ කර්මාන්තය සඳහාම වෙන් වූ ගම්මාන තිබී ඇති අතර ඒ සඳහා වූ යන්ත්‍ර සූත්‍ර සහ වර්ණ යෙදීමෙහි දක්ෂ ශිල්පීහු ද සිට ඇත.
- විවිධ සතුන්ගේ සම් පදම් කොට විවිධ භාණ්ඩ නිෂ්පාදනය කර ඇත.
- වඩු කර්මාන්තයේ නියුතු වූවෝ නැව්,ඔරු,රථ ආදිය නිපදවා ඇත .
- ලෝහ ආශ්‍රිත උපකරණ නිපදවන්නන් ලෝකුරුවන් ලෙසද , පුරාණ ආභරණ නිපදවන්නන් රන්කරුවන් ලෙසද , වේවැල් උණබට ආදියෙන් භාණ්ඩ නිපදවන්නන් කුළු පොතු කාරයෝ ලෙසද, මල්මාල තැනූවන් මාලා කාරයෝ ලෙසද හඳුන්වා ඇත.

## භාණ්ඩ බෙදාහැරීම හා වෙළඳාම පිළිබඳ කටයුතු

- දේශීය වෙළඳාම හා දේශාන්තර වෙළඳාම ලෙස මූලික වෙළඳාම් ආකාර දෙකක් පැවතී ඇත.
- වෙළඳාම් කටයුතු සිදු වූ ආකාරය පිළිබඳව, භාණ්ඩ උදෙසා මිල නියම කිරීම හා බදු ගෙවීම් ආදිය පිළිබඳව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වෙයි.
- මෙය වෛශ්‍යයන් ගේ ප්‍රධාන ජීවනෝපාය විය.
- ගොඩබිම් වෙළඳාම සඳහා ගැල් යොදා ගෙන ඇත. ඒ සඳහා වූ ප්‍රධාන වෙළඳ මාර්ග ගැන ද සඳහන්ව ඇත.
- එබඳු කණ්ඩායමක ප්‍රධානියා සාත්තු නායකයා ලෙස හඳුන්වා ඇත.
- බරණැස උදේනිය වැනි ප්‍රධාන වෙළඳ නගර තිබී ඇති අතර එම නගර වල සල්පිල් හා වෙළඳාම සඳහාම වෙන්වූ වීදි තිබී ඇත.
- ජල මාර්ග ඔස්සේ සිදුකරනු ලද වෙළඳාම් සඳහා විශාල නැව් මෙන්ම කුඩා යාත්‍රවන් ද යොදාගෙන ඇත.මේ සඳහාම වෙන්වූ වෙළඳ මාර්ග හා වෙළඳ තොටුපළවල් තිබී ඇත.
- තරාදි ද්‍රෝණි වැනි මිනුම් උපකරණ හා විධිමත් මිනුම් ක්‍රම ඔවුන් විසින් භාවිතා කර ඇති අතර කහවණු භාවිතය වෙළඳාමෙහි සුලබ සිද්ධියක් වී තිබී ඇත.
- ජාත්‍යන්තර වෙළඳාම ද උසස් තත්ත්වයක පැවතී ඇති අතර, විදේශීය භාණ්ඩ සඳහා මිල නියම කිරීමට නිලධාරීහුද සිට ඇත.

## විවිධ සේවා සැපයීම වලට අදාල කටයුතු

- එකල සමාජයේ ඇතැම් පිරිස් ඉහළ ශ්‍රේණිවල පුද්ගලයන්ට හා සාමාන්‍ය පොදු ජනතාවට සේවාවන් සපයා ආර්ථික වාසි ලබාගැනීම ජීවනෝපාය ලෙස භාවිතා කර ඇත.
- සෞඛ්‍ය සේවය, අධ්‍යාපන සේවය වැනි අංශද, සංස්කෘතික හා කලා ශිල්ප වැනි අංශ ද,රාජ්‍ය පාලනය හා සම්බන්ධ වූ නොයෙකුත් අංශ වලද විවිධ වූ සේවාවන් මොවුන් විසින් ඉටු කර ඇත.
- බ්‍රාහ්මණ සමාජ ක්‍රමය අනුව මෙම සේවාවන්ගෙන් උසස් තත්ත්වයක තත්වයක පැවතී ඇත්තේ රාජ්‍ය සේවයයි.
- පුරෝහිතයන්, අමාත්‍යවරු ,සෙන්පතිවරු, රාජපුරුෂයෝ, යුද සෙබලු රාජ්‍ය සේවකයන් ලෙස සැලකුණු අතර ඔවුන්ගේ සේවාව සඳහා ඔවුනට වැටුප් හෝ නින්දගම් ලබා දී ඇත.
- දිවිපැවැත්ම සඳහා උගත් ශිල්ප යොදා ගත්තවුන් පිළිබඳව සාමඤ්ඤ ඵල සූත්‍රයෙහි සඳහන් වේ.
- වෛද්‍ය සේවය ද ඇතැමුන් ජීවන මාර්ගයක් ලෙස භාවිතා කර ඇති අතර ඉතා දියුණු දේශීය වෛද්‍ය ශාස්ත්‍රයක් එකල පැවති බවද බෙහෙත් වර්ග සහ චිකිත්සා ක්‍රම තිබූ බව ද පෙනී යයි.
- ගිරග්ග සමජ්ජ මං නාට්‍ය විශේෂයක් ගැන ද කුම්භථූන කයිතාලම් නම් ක්‍රීඩාවක් ගැන ද බෞද්ධ සූත්‍රවල සඳහන් වේ.
- පරපුරෙන් උරුම වූවක් ලෙස ධනවත් පවුල් වලට සේවාවන් සැපයීම ජීවිකාව කරගත් පුද්ගලයන් ද සිට ඇත.
- ධනවතුන්ගේ රෙදි පිරිසිදු කරන්නන් රජකයෝ ලෙසද, කෙස්, රැවුල් ආදිය කපන්නන් කරණවැමි යෝ ලෙසද, ගෙන් ගෙට ගොස් ඇඟුම් මසා දෙන්නන් සන්නාලියන් ලෙසද හඳුන්වා ඇත.
- උසස් යැයි සම්මත යයි සම්මත කුලවල ට යැයි සම්මත කුල වලට පාරම්පරික ව මෙහෙවර කරන්නන් ක්ෂුද්‍රයන් ලෙස එකල හඳුන්වා ඇත.
- ගංගා මාර්ග ආශ්‍රිතව සේවාවන් සැපයූවන් තොටියා ලෙස ද,නගර සුසාන භූමි ආදිය ආරක්ෂා කරන්නන් ගුත්තික හෝ ගෝපක නමින් හඳුන්වා ඇත.
- මීට අමතරව නගර සෝබනීහු, අනාගත වාක්‍ය / පලාපල කියන්නා  වූ නිමිත්ත පාඨකයෝ, නගරවල වීථි ආදිය පිරිසිදු කර කසළ ශෝධකයන් සිට ඇත.
- රජය විසින් ඇතැම් අවස්ථාවලදී ආර්ථිකයට සම්බන්ධ වී ඇති අතර ඔවුන් ගොවීන්ගෙන් හා වෙළෙන්දන්ගෙන් බදු අය කිරීම් සිදු කර ඇත.
- මෙම ක්‍රියාවලිය භාරව සිටි නිලධාරියා වනක්කු නමින් හඳුන්වා ඇත. මීට අමතරව රජුගේ භාණ්ඩාගාරය භාරව කටයුතු කළ භාණ්ඩාගාරික තනතුරු දැරූවන් සහ අයකැමියන් සිට ඇත.

# 4. බුද්ධ කාලීන භාරතීය ආගමික හා දාර්ශනික පසුබිම

- බුද්ධ කාලීන භාරතීය ආගමික හා දාර්ශනික පසුබිම ඉතා සංකීර්ණය.
- විවිධ ආගමික ඉගැන්වීම් හා ප්‍රතිපත්ති තිබී ඇති අතර ශ්‍රමණ බ්‍රාහ්මණ ජටිල ආජීවක පරිබ්‍රාජක නිඝන්ඨ ආදී ශාස්තෘවරුන් හා පූජකයන්ද සිට ඇත.

## බමුණු ආගමික ඉගැන්වීම

- සර්වබලධාරී බ්‍රහ්මන්ගේ පරමාර්ථය සමඟ එක්වීම පරම සැපත ලෙස සළකන ලදී.
- ඊට අදාල වූ කර්ම මාර්ගයක් ලෙස යාගහෝම පැවැත්වීම මූලිකව සිදු කර ඇත.
- භාරතීය ඉතිහාසයට අනුව වේද යුගයෙන් සහ බ්‍රාහ්මණ යුගයෙන් කර්ම මාර්ගය වඩාත් කැපී පෙනී ඇත.
- අශ්වමේධ, පුරුෂමේධ, නිරග්ගල, වාජපේය ආදී නම් වලින් විවිධ යාගහෝම පවත්වා ඇත.
- බ්‍රාහ්මණ සංස්කෘතික සම්ප්‍රදාය තුළ බමුණෝ ශ්‍රේෂ්ඨතම පූජකයෝ වූහ.
- ඔවුන් "භූ සුර"(පොළොවෙහි සිටින දෙවියන්) නමින් හැඳින්වූ අතර ඔවුහු දෙවියන්ගේ නියෝජිතයෝ වූහ.
- යාගහෝම පැවැත්වීමට උපදෙස් ලබාදීම,ආගමානුකූලව මෙහෙයවීම (මන්ත්‍ර ජප කිරීම, ආගමික සූත්‍රයන් උච්චාරණය කිරීම, යාඥා කිරීම) මොවුන් විසින් සිදුකර ඇත.
- යාගහෝම සඳහා අවශ්‍ය වියදම් දැරීම බ්‍රාහ්මණ භක්තියෙන් සිටි ගිහියන්ගේ වගකීමක් විය.
- සියල්ල යාග වල බලයට යටත් බවත්, දෙවියන් සතුටට පත්වන යාගහෝම මගින් මිනිසුන්ට බොහෝ සැප සම්පත් ලැබෙන බවත් එකල අදහන ලදී.

## ශ්‍රමණ

- බ්‍රාහ්මණ ධර්මයට පටහැනිව ගිය ආගමික සම්ප්‍රදායන් සියල්ල " ශ්‍රමණ " නම් පොදු නමින් හඳුන්වන ලදී.
- ශ්‍රමණ සම්ප්‍රදායේ දී ආගමික චින්තාව හා ප්‍රතිපදාවන් වඩාත් නැඹුරු වී තිබී ඇත්තේ ඥාන මාර්ගය වෙතය.
- දීඝනිකාය සාමඤ්ඤඵල සූත්‍රයෙහි ශ්‍රමණ සම්ප්‍රදායට අයත් සුප්‍රසිද්ධ ශාස්තෘවරුන් සය දෙනෙකු පිළිබඳව සඳහන් වේ.

### 1. පූරණ කස්සප

- ❖ කුසලාකුසල කර්ම ප්‍රතික්ෂේප කරන ඔහු අකිරිය වාදිකයෙකි.

**ඉගැන්වීම්** (සාමඤ්ඤඵල සූත්‍රයට අනුව)

- සියතින් කරන්නාට ද, අනුන් ලවා කරවන්නාටද, අනුන් අත් පා සිඳන්නාට ද, සිඳුවන්නාට ද, අනුන් දඬුවමින් පෙළන්නාට ද, පෙළවන්නාට ද, පර පීඩාවන් කරන්නාටද, කරවන්නාටද පවක් සිදු නොවේ.

- සතුන් මැරීම, හොරකම් කිරීම, උවදුරු කිරීම, මං පැහැරීම, පරදාර සේවනයෙහි යෙදීම, බොරු කීම යනාදියට පවක් සිදු නොවේ.
- "හිංසා කරමින්, කරවමින් අත් අත් පා ආදිය සිඳමින්, සිඳුවමින් ගංගා නදියෙහි දකුණු තෙරට යන්නෙද ඉන් සිදුවන පවක් නැත. ගංගා නදියෙහි උතුරු තැනට දන් දන්දෙමින් යාග කරමින් කරවමින් යන්නෙද ඉන් සිදුවන පිනක් නැත."
- දානය, සංවර බව, ඉන්ද්‍රීය දමනය, සත්‍ය වචනය යනාදියෙන් පිනක් සිදු නොවේ.

## 2. මක්කලි ගෝසාල

- සියල්ල නියත ස්වභාවික පිළිවෙලකට ඉබේ සිදු වෙන්නේ ඇයි කී ඔහු නියත වාදියෙකි.

**ඉගැන්වීම්**

- හේතු ප්‍රත්‍ය රහිතවම සත්වයෝ කිලිටි වෙති, පිරිසිදු වෙති.
- තමා කළ කර්මයෙහි හෝ අනුන්ගේ උපදෙස් අනුව කළ කර්මයෙහි විපාක නැත.
- පුරුෂ බලය, පරාක්‍රමය, වීර්ය කියා දෙයක් නැති අතර සකල සත්ව, භූත, ජීව ප්‍රාණීහුම වීර්ය රහිතවම නියති සංගති ස්වභාවය අනුව ශ්‍රේෂ්ඨ ජාති හයක උපදිති.
- බාල පණ්ඩිත සියල්ලන් සසර හැසිර ඉබේම දුක් කෙළවර කරත් නම් එබඳු යෝනි දාහතර ලක්ෂ හයදහස් හයසියයකි.
- කර්ම පන්සියයකි, කර්ම පහකි, කර්ම තුනකි, ප්‍රතිපදාවන් දෙසැටකි. අන්තර් කල්ප දෙසැට කි.
- ශ්‍රේෂ්ඨ ජාති හයෙකි, පුරුෂ භූමි අටකි, ආජීවක වෘත්ති එකසිය හතලිස් නවයකි, ඉන්ද්‍රීය එකසිය විස්සකි නිරය එකසිය තිහකි.
- "යම්සේ නූල් ගුලියක් උස් තැනක සිට දමා ගසන්නේ නොරැඳී දිගහැරී යයිද නූල අවසන් වූ විට නවතීද එසේම, බාල පණ්ඩිත සියල්ලෝම ඉබේම සසර ගමන් කොට දුක් කෙළවර කෙරෙත්ය"

## 3. අජිත කේශකම්බල

- මොහු භෞතික වාදියෙකි.

**ඉගැන්වීම්**

- දුන් දෙයෙහි පල නැත, කළ මහා යාගයෙහි පල නැත, කුසල හා අකුසල කර්මයන්ගේ පල විපාක නැත, මෙලොව නැත, මෙලොව සිටියහුට පරලොව නැත.
- මවට පියාට සැලකීමෙහි පල විපාක නැත, මැරී නැවත උපදින සත්වයෙක් නැත, මෙලොව පරලොව හොඳින් දැන හැඳින පවසන නිසි මගට පිළිපන් මහණ බමුණෝ නැත.
- කෙනෙක් යම් විටක මිය යයි නම් එම ශරීරයෙහි ඇති පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතූහු බාහිර ලෝකයෙහි ඇති එම ධාතූන් සමග එක්වෙති.
- මලහු ඇඳෙක තබා සොහොනට ගෙන යන අතර එතෙක් පමණක් ඔහුගේ ගුණ කථන වන අතර අවසන දුඹුරුවන් ඇට පමණක් ඉතිරි වේ.
- දානය මෝඩ ක්‍රියාවක් බවත්, පරලොව හා කර්ම විපාක ඇතැයි කීම බොරුවක් බවත්, නුවණ ඇත්තෝ ද නැත්තෝ ද සිරුර බිඳී යාමෙන් පසු විනාශ වන බවත්, මතු ඇති නොවන බවත් ඔහුගේ ඉගැන්වීමයි.

## 4. පකුධ කච්චායන

❖ මොහු අකිරියවාදියෙකු මෙන්ම භෞතිකවාදියෙකු ලෙස හැඳින්වේ.

**ඉගැන්වීම්**

➢ කිසිවකු විසින් නොකරන ලද, විධානය නොකරන ලද, ඍද්ධියෙන් නොමවන ලද, අන් ලෙසකින් ද නො මවන ලද කිසිත් ඵලයේ ගෙන දිය නොහැකි, ස්ථිර වූ කොටස් හතක් වේ.

➢ පඨවි කාය,ආපෝ කාය, තේජෝ කාය,වායෝ කාය, සුඛ දුක්ඛ හා ජීව යනු එම හතයි.

➢ ඒවා නිශ්චල පරිවර්තනය නොවන එකිනෙකට බාධකද එකිනෙකට සුව දුක් ද ගෙන නොදෙන කොටස් 7 කි.

➢ එම කොටස් 7 තුළ නසන්නෙක් නසවන්නෙක්, අසන්නෙක් අස්වන්නෙක්,දන්නෙක් දන්වන්නෙක් නැත.

➢ "යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳී නම්;එහිලා කිසිවෙක් කිසිවෙකු මැරුවේ නොවේ. ඒකාබද්ධ ව පැවැති සප්ත ධාතූන් අතරෙන් ආයුධය ගෙන ගියේ වෙයි" යනු මොහුගේ ඉගැන්වීමයි.

## 5. සංජය බෙල්ලට්ඨිපුත්ත

❖ මොහු අමරා වික්ෂේප වාදියෙකි.
❖ කවර ප්‍රශ්නයකට හෝ ස්ථිර පිළිතුරක් මොහු විසින් ලබා දී නැත.

උදා:- පරලොවක් තිබේද(ප්‍රශ්නය)

➢ ඒ සඳහා ඔහුගේ පිළිතුර මේ ආකාරයට වේ.

> "පරලොවක් ඇතැයි මට හිතුනොත් පරලොවක් ඇතැයි මම කියමි. එහෙත් ඒ පිළිබඳව නිශ්චිත අදහසක් මට නැත. පරලොවක් නැත්තේ නොවේ යන අදහසක්ද නැත. ඊට වෙනස් අදහසක් ද නැත."

➢ මෙලොවින් පසු පරලොව උපදින සත්ත්වයෝ සිටීද,කුසලාකුසල කර්මයන්ගේ පලවිපාක තිබේද, තථාගත තෙමේ මරණින් මතු වන්නේ ද යනාදී ප්‍රශ්න වලට ද මෙලෙසටම පිළිතුරු ලබා දී ඇත.

## 6. නිගණ්ඨනාත පුත්ත

❖ ජෛන ධර්මයෙහි ප්‍රධාන ශාස්තෘවරයා ය. "මහා වීර" නමින්ද හැඳින්වේ.

❖ බුද්ධ කාලීන ෂට් ශාස්තෘන් අතර ඉතා වැදගත් දහමක් ඉගැන්වූ පුද්ගලයා වේ.(බෞද්ධ සූත්‍රයන්හි මොවුන් **තීර්ථංකරයන්** ලෙස හැඳින්වේ)

- ජෛන නිගන්ඨයෝ ආකාර දෙකකි.
- සුදු රෙදි අඳින්නත් ශ්වේතාම්බර ලෙසත් නිරුවත් ව සිටින්නන් දිගම්බර ලෙසත් හැඳින්විණි.

නිඝණ්ඨ ශාසනයෙහි නිඝණ්ඨ තෙමේ චතුයාම සංවර සීලයෙන් යුක්ත වූවන් වේ.

(i) සියලු සිහිල් දිය පාවිච්චි කිරීමෙන් වැළකීම(සබ්බවාරි වාරිතො)
(ii) සියලු සංවරයෙන් යුක්ත වෙයි(සබ්බ වාරීයුතෝ)
(iii) සියලු පවින් වැලකුණේ වෙයි(සබ්බ වාරී ධුතෝ)
(iv) සියලු පව් කම් විද නිමවූ විමුක්තියෙන් යුක්ත වූවන් වේ(සබ්බ වාරී පුටෝ)

## පරිබ්‍රාජකයෝ

- කයට අධික ලෙස දුක් දෙන අත්තකිලමතානු යෝගයෙහි හැසිරුණු පුද්ගලයන් විය.
- ගැඹුරු දාර්ශනික ප්‍රශ්න පිළිබඳව විමසමින්, වාද විවාද හා සාකච්ඡා පවත්වමින් සැරිසැරූ පුද්ගල කොට්ඨාශයක් විය.
- කෙදි වර්ගවලින් පට්ටාවලින් අස්ලොමින් හෝ කෙස් වලින් තැනූ සිවුරු දැරූ අතර දිගු කෙස් ලොම් හා නිය ඇත්තෝ වූහ. ඇත්තම පරිබ්‍රාජකයෝ නිරුවත් පැවිද්දෝ වූහ.
- ස්ථිර වාසයක් තිබී නැති අතර ත්‍රිදණ්ඩක් අතින් ගෙන වාද විවාද කරමින් හැසිරි ඇත.
- වච්චගොත්ත, දීඝනඛ, කේනිය වෙඛනස්ස වැනි පරිබ්‍රාජකයන් බුදුන් සමග ද පව්ඡා පවත්වා ඇත.
- ස්වකීය ලබ්දිය හැර බුදුන් සරණ ගිය පරිබ්‍රාජකයන් ගැනද ඉතිහාසයේ සඳහන් වෙයි.
- ඇතැම් භික්ෂූන් ද මුලදී පරිබ්‍රාජක ජීවිත ගත කර ඇත.(උදා:- සැරියුත් මුගලන් අග්‍රශ්‍රාවක දෙනම සංජය පරිබ්‍රාජකයාගේ අතවැසි ව සිට ඇත)
- සුන්දරී,ජම්බු නමින් පරිබ්‍රාජිකාවන් ද එකල වාසය කර ඇත.

## අචේලකයෝ

- මොවුහු නිරුවත් සාධුවරයෝ වෙති.
- නිරුවත් පරිබ්‍රාජකයන් මෙම නමින් හඳුන්වා ඇති බවට පිළිගැනේ.
- මොවුන් ද අත්තකිලමථානුයෝගී ව ජීවත් වී ඇත.
- නග්නව සිටිමින්, යහපත් සිරිත් ඉවත දමා, කෑමට පසුව අත ලෙවකෑම, හඬගැසූවිට නොපැමිණීම, ඉතා අඩුවෙන් ආහාර ගැනීම, වනමුල් පලාපල වැළඳීම වැනි දෑ අනුගමනය කර ඇත.
- කෙස් වලින් ද සම්වලින් ද ගස්පොතු, කෙදි ආදියෙන්ද කළ සිවුරු දැරීම, කටු, පෝරු, කුඩා බැම් ආදියෙහි නිදා ගැනීම, දූවිලි තවරා ගැනීම වැනි ව්‍රත අනුගමනය කරමින් වාසය කර ඇත.
- ඇතැම්විට ගවයන්,එලුවන්, බල්ලන් සතුන් අනුගමනය කරමින් ජීවත් වී ඇත.

## ආජීවකයෝ

- දිවි පැවැත්ම පිණිස කිසියම් ව්‍රතයක පැවිද්දෝ ය.
- ජීවකයෝ ද නිරුවත් පැවිද්දන් වූ අතර උඩුකයෙහි එක පැත්තකට පමණක් වස්ත්‍ර දැරූහ.
- ඔවුහුද අත්තකිලමථානුයෝගී ව දුෂ්කර ව්‍රත හා උපවාස ගමන් මෙය කර ඇත.
- අතින් දණ්ඩක් දැරූ මොවුන් ජනයා විසින් දෙනු ලැබූ අහාර වලින් යැපී ඇත.
- ඇතැම් ආජීවකයන් ට ආරාම තිබී ඇති අතර සමහරුන් ගිහි ගෙවල් වල නැවතී සංග්‍රහ ලැබූහ.

## ජටිලයෝ

- හිසෙහි රැඳුණු රටාවකින් යුක්ත වූ බැවින් මෙ නමින් හඳුන්වා ඇත.
- සංචාරක පැවිද්දන් වූ නමුත් තමුන්ට ස්ථිර ආරාම තිබී ඇත.
- ඒකාන්තයෙන්ම රහතුන් යයි පල කල මොවුන් ජනයාගේ විවිධ පූජෝපහාරයන් රජුන්ගේ සම්මාන ආදිය ද ලබා ඇත.
- උරුවෙල කාශ්‍යප, ගයා කාශ්‍යප,නදී කාශ්‍යප යනු බුදු සසුනට ඇතුළු වූ ප්‍රසිද්ධ තුන්බෑ ජටිලයන් වේ.
- ගිනි දෙවියන් පිදීම මොවුන්ගේ මූලික කාර්යයක් වී ඇති අතර ජලයෙහි කිමිදෙමින් හැසිරෙමින් ඉස ගනිමින් "උදක ශුද්ධිය" ශික්ෂාවක් අනුගමනය කර ඇත.

## නිගණ්ඨයෝ

- කෙලෙස් ගැට වලින් තොර යැයි කියා සිටි සාධුවරයෝ නිගණ්ඨ නම් වූහ.
- මොවුන් නිගණ්ඨනාථපුත්ත තුමන්ගේ දී ශ්‍රාවකයන් වේ.
- සිරුරෙහි මඩ තවරා ගැනීම, දූවිලි වලින් සිරුර වැසී යාමට ඉඩ හැරීම, ආහාර නොගෙන සිටීම, රතු ගල් උඩ නිදා ගැනීම, ඇණ තියා නිදාගෙනම සිටීම ආදි වූ දුෂ්කර චර්යාවල මොවුන් නිරත වී ඇත.
- සිය ශාස්තෲවරයා අනුව යමින් පරම අවිහිංසාවාදී ව ජීවත්වූ කොට්ඨාශයකි.

බුදුරදුන් පහළ වන විට භාරතයේ පැවති සමකාලීන දාර්ශනික මතවාද හැට දෙකක් පිළිබඳව බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් වේ.

| | | |
|---|---|---|
| i. | කේවල ශාස්වත වාද | 4 |
| ii. | ඒකච්ච ශාස්වත වාද | 4 |
| iii. | අන්තානන්තික වාද | 4 |
| iv. | අමරා වික්ඛෙප වාද | 4 |
| v. | අධිච්ච සමුප්පන්න වාද | 2 |

පූර්වාන්ත කල්පික වාද 18 කි.

| | | |
|---|---|---|
| vi. | සංඥී වාද | 8 |
| vii. | අසංඥී වාද | 8 |
| viii. | නෙවසංඥී නාසංඥී වාද | 8 |
| ix. | උච්ඡේද වාද | 7 |
| x. | දිට්ඨධම්ම නිබ්බාන වාද | 5 |

අපරාන්ත කල්පික වාද 44කි.

- දෘෂ්ටිවාද දෙසැට ශාස්වතය, උච්ඡේදය යනුවෙන් වර්ග කොට දැක්විය හැකිය.
- සියල්ල සදාකාලිකය, ලෝකය ද ආත්මය ද නිත්‍ය ය,ධ්‍රැවය,අවිපරිණාමීය ලෙස සැලකීම ශාස්වත දෘෂ්ටිය වෙයි.
- මරණයෙන් සියල්ල අවසන් වේ,ආත්මය ඇත,එහෙත් ඒ මරණයෙන් කෙළවර වේ යැයි පිළිගැනීම උච්ඡේද දෘෂ්ටිය යි.
- දෘෂ්ටිවාද යනු ආගමික හෝ දාර්ශනික වශයෙන් දැඩිව,අන්තගාමී ව එල්බ ගන්නා ලද මතවාදයකි.

- මෙහිදී අන්තගාමීව එල්බගත් දෘෂ්ටියම සත්‍ය බවත්,සෙසු සියලු දෘෂ්ඨී අසත්‍ය බවත් දැක්වීමට එම මහණ බමුණන් සාධක ගෙනහැර දක්වා ඇත.

බ්‍රහ්මජාල සූත්‍රයෙහි එන දෙසැටක් දෘෂ්ටි මූලික වශයෙන් ආකාර දෙකකි.

1.පූර්වාන්ත කල්පිතය - අතීතය විමසා,එයම මෙනෙහි කොට එමගින් දෘෂ්ටිවාද ගොඩනැගුවන් මෙලෙස හැඳින්විණි.

2.අපරාන්ත කල්පිතය - අනාගතය විමසා එයම මෙනෙහි කොට එමගින් දෘෂ්ටිවාද ගොඩ නැගුවන් මෙලෙස හැඳින්විණි.

- මෙම දෙසැට දෘෂ්ටි අතරින් කිසිවක් බුද්දහමට ඇතුලත් නොවේ. බුද්දහමෙහි වැදගත් ලක්ෂණයක් වන්නේ හැටතුන්වන දෘෂ්ටියක් ප්‍රකාශ කිරීමයි.
- පාලි සූත්‍රවල සඳහන් වන බුදුරජාණන් විසින් එක එල්ලේම විසඳුම් නොසපයන ලද (අව්‍යාකෘත)/ පසෙකින් තබන ලද (ඨපනීය) ප්‍රශ්න දහයකි.

**බ්‍රහ්මජාල සූත්‍රයේදී ද, අග්ගි වච්චගොත්ත,චූල මාලුංක්‍ය සූත්‍රයන්හි මෙම ප්‍රශ්න හමුවෙයි.**

1.ලෝකය ශාස්වත ද?

2.ලෝකය අශාස්වත ද?

3.ලෝකය අන්තවත් ද?

4.ලෝකය අනන්තවත් ද?

5.ජීවය හා ශරීරය එකක්මද?

6.ජීවය හා ශරීරය දෙකක්ද?

7.තථාගත මරණින් මතු වේ ද?

8.තථාගත මරණින් මතු නොවෙයි ද?

9.තථාගත මරණින් මතු වෙයි හා නොවෙයිද?

10.තථාගත මරණින් මතු නොවෙයි හා නොම නොවෙයිද?

- මෙම ප්‍රශ්න නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස, උපසමය පිණිස, අභිඥාව පිණිස, සම්බෝධිය පිණිස, නිර්වාණය පිණිස හේතු නොවන බැවින් මේවා අව්‍යාකෘත ලෙස හඳුන්වා ඇත.
- තිත්ථායතන සූත්‍රයට අනුව බුද්ධකාලීන දාර්ශනික පරිසරයෙහි පිළිගැනුණු වෙනත් මත වාද තුනකි.

1.ඊශ්වර නිර්මාණවාදය (සියල්ලටම අධිපති, සියල්ල දන්නා සියලු බල ඇති ඊශ්වර යෙකු පිළිගෙන සියල්ල ඒ අනුවම විසඳාගැනීම )

2.අහේතුක අප්‍රත්‍ය වාදය (සියල්ල අහේතුකව, අප්‍රත්‍යව හේතුවක් ප්‍රත්‍යයක් නැතිවම ඉබේම, අකස්මිකව සිදුවේ යැයි පිළිගැනීම)

3.පුබ්බේකත හේතුවාදය (සියල්ල සිදුවන්නේ පෙර කරන ලද කුසලාකුසල කර්ම අනුව ම යැයි පිළිගැනීම)

- මෙම වාදයන් සියල්ල අකිරියවාදයෙහිම වැටෙන බව බෞද්ධ අදහසයි.

## ආත්මවාදය

- ප්‍රධාන දෘෂ්ටිවාදයන් ඉපදීමට මුල්වූ වාදය වේ.
- මම යනු කවරෙක්ද? මම යනු රූපයද, වේදනාව ද,සංස්කාරය ද, විඤ්ඤාණය ද, යන ගැටලුව ඔස්සේ චින්තනය මෙහෙයවීමෙන් ආත්මවාදය ඉපදී ඇත.
- සියල්ල අනවරතයෙන් වෙනස් වන අතර නොවෙනස් වන නිත්‍ය පදාර්ථය ආත්මය යැයි පිළිගන්නා ලදී.
- ආත්මය නිත්‍ය බවත්, එය භව සංක්‍රමණික බවත්, අවසානයේ පූර්ණ පවිත්‍රත්වය ලද පසු බ්‍රහ්මන්ට එක්වන බවත් මෙහිදී සැළකිණි.
- බුදු දහම විසින් මෙය විපරිත දෘෂ්ටියක් සේ සලකා බැහැර කර ඇති අතර,පංචස්කන්ධය තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගැනීමෙන් ආත්මවාදය උපදනා බව පෙන්වා දී තිබේ.
- බුදු දහම විසින් මෙම දෘෂ්ටි දෙකම(ශාස්වත,උච්ඡේද) අන්ත දෙකක් ලෙස හඳුන්වා ඇති අතර එම අන්ත දෙකටම මධ්‍යස්ථ වූ දහමක් දේශනා කර ඇත.

# 5. ශාක්‍යයන්ගේ හා කෝලියයන්ගේ සම්භවය

- ශාක්‍යයන්ගේ හා කෝලියන්ගේ උපත පිළිබඳ වෘතාන්ත දීඝ නිකායේ අම්බට්ඨ සූත්‍ර අටුවාවේ පැහැදිලිව විස්තර කරයි.
- දීඝ නිකායේ අම්බට්ඨ අටුවාවේ සඳහන් පරිදි ශාක්‍යයන්ගේ ආදි මුතුන්මිත්තා ලෙස හඳුනාගන්නේ සූර්ය වංශයට අයත් 'ඔක්කාක' නම් රජුයි. ඔහු මහා සම්මත පරපුරේ පසුකාලීයෙකු වන අතර ඔක්කාක පරපුරේ **තෙවැන්නායි.**
- ඔක්කාක රජුට බිසෝවරු පස් දෙනෙකු සිට ඇත.
- ඉන් ප්‍රධාන බිසවට,

**1. ඔක්කාකමුඛ**
**2. කරකණ්ඩු**
**3. හත්ථිනී**
**4. කාසිනීපූර**

**යැයි පුතුන් සතරදෙනෙකු සහ**

**1. ප්‍රියා**
**2. සුප්‍රියා**
**3. ආනන්දා**
**4. විජිතා**
**5. විජිතසේනා**

**ලෙස දූවරු පස් දෙනෙකු ද සිට ඇත.**

- පසුව එම බිසව මියගිය අතර රජු වෙනත් බිසවක අග බිසව ලෙස විවහ කරගෙන ඇත. එම බිසවට ලැබුණු පුතු 'ජන්තු' නම් විය.
- පුතු උපන් අවස්ථාවේ රජු එම බිසවට දුන් පොරොන්දුවක් උපායශීලීව භාවිත කරමින් ඇය තම පුතුට රජකම ලබා දීමට රජුව කැමති කරගෙන ඇත. ඇයගෙන් තමන්ගේ වැඩිමහල් දරුවන්ට අනතුරක් විය හැකි නිසා රජු විසින් ඔවුන් කැමති දෙයක් ගෙන වනගත වන ලෙස දන්වා ඇත.
- ඔවුන් **මගුල් ඇතු, මගුල් අශ්වයා හා රථය** රැගෙන වනගත වන අතර එහි දී **කපිල නම් සෘෂිවරයෙකු** මුණගැසෙයි.
- කපිල සෘෂිවරයාගේ උපදෙස් පරිදි ජය භූමියක් ලෙස හඳුනාගෙන තිබූ ඔහුගේ ආශ්‍රමය පිහිටි ස්ථානයේ නගරයක් නිර්මාණය කරගෙන ඔවුන් සතුටින් වාසය කර ඇත.
- කපිල සෘෂිවරයාගේ උපදෙස් පරිදි ඉදිකළ බැවින් එම නගරය '**කපිලවත්ථු පුර**' ලෙස හැඳින්වීමට පටන්ගෙන ඇත.
- කුමරුන්ට විවාහ වීමට ක්ෂත්‍රිය කාන්තාවන් නොවූ බැවින්, වැඩිමහල් සොයුරිය මවු තනතුරේ තබා ඉතිරි සිවු දෙනා විවාහ කරගෙන ඇත.
- පසු කාලයේ වැඩිමහල් සොයුරියට **චර්ම රෝගයක්** වැළඳීම හේතුවෙන් ඇත වනයේ බිංගෙයක් තුළ රඳවා ඇයට ආහරපාන යවා ඇත.
- එම කාලයේ දිම **බරණැස රාම රජුගේ** ශරීරයේ ද චර්ම රෝගයක් හටගත් බැවින් ඔහු ද වනගත වී ඇත. වනයේ දී නිසි ලෙස ඖෂධ ගෙන සුව වූ රජු නැවත රජ මැඳුරට නොගොස් වනයේම ගස් බෙනයක කුටියක් නිර්මාණය කරගෙන වාසය කර ඇත.
- වනයේ දී රාම රජුට **ඔක්කාක රජුගේ වැඩිමහල් දියණිය** මුණගැසෙන අතර ඇයව සුවපත් කරගැනීමට රජුට හැකි වෙයි. ඉන්පසු ඔවුන් දෙදෙනා විවාහ වී දරුවන් ලැබ සතුටින් කාලය ගත කර ඇත.
- මහලු වූ ඔක්කාක රජු, තම දරුවන් දැන් කිනම් ස්ථානයක කෙසේ වෙසෙන්නේ දැයි සොයා බලා ඔවුන් කපිලවත්ථු නම් නගරයක් නිර්මාණය කරගෙන වෙසෙන බව දැනගෙන ඔවුන් '**දක්ෂයෝ**' **ය,** '**භාග්‍යවන්තයෝ**' **ය** ලෙස පවසා සතුටු වී ඇත.

- එම අර්ථය ඇතිව රජු විසින් ඔවුන්ව '**ශාක්‍යයෝ**' යැයි නම් තැබූ බවත්, ඔවුන්ගෙන් **ශාක්‍ය වංශය ආරම්භ වූ බවත්** සඳහන් වෙයි.
- දිනක් වනයේ දර සොයමින් ගිය එක් පුරුෂයෙක් වනයේ දී රාම රජු දැක හඳුනාගෙන, බරණැස් නුවරට ගොස් ඒ වන විට රජකම දරන රාම රජුගේ පුතුන් හට මේ බව දන්වා ඇත.
- පුතුන් විසින් වනයට ගොස් රජුට නැවත පැමිණ රජකම භාරගන්නා ලෙස දන්වනු ලබයි.
- රජු විසින් එය ප්‍රතික්ෂේප කරන ලද අතර දරුවන් කැමති නම් රජු වාසය කළ '**කෝළ' නම් ගස** වටකර නගරයක් ඉදි කරන ලෙස පවසයි. මෙසේ ඉදි කළ නගරයට '**කෝළ නගරය**' ලෙස රජු නම් තබයි.
- ඔක්කාක රජුගේ වැඩිමල් දියණිය හමු වූ ස්ථානය හරහා ව්‍යාඝ්‍රයෙකු ගමන් කළ මාර්ගය වැටී තිබුණු බැවින් එම ස්ථානය සිහිවීම පිණිස පුතුන් ලවා නගරයක් ඉදිකර එම නගරය **ව්‍යගඝපද්‍ය' හෙවත් 'ව්‍යග්ග පජ්ජ'** ලෙස නම් කරයි.
- කෝළ නගරයේ උපන් රාම රජුගේ පරපුර '**කෝළියෝ**' නම් විය, ඔවුන් පසු කාලයේ කපිලවත්ථු පුර ශාක්‍ය කුමර කුමරියක් විවාහ කරගනිමින් ඥාති සබඳතා පවත්වාගෙන ගොස් ඇත.
- පසු කලෙක ශාක්‍ය පරපුරේ '**ජයසේන**' නම් කුමාරයෙක් රජ බවට පත් වෙයි. ඔහුට '**සිංහහනු**' ලෙස පුතෙකුත්, '**යශෝදරා**' ලෙස දුවෙකුත් සිට ඇත.
- සිංහහනු කුමරා **කාංචනා** නම් කුමරියක විවාහ කරගන්නා අතර ඔවුනට,
- **සුද්ධෝදන, ශුක්ලෝදන, ධෝතෝදන, අමිතෝදන හා මිතෝදන** ලෙස පුතුන් පස් දෙනෙකු හා **අමිතා හා ප්‍රමිතා** ලෙස දූවරු තිදෙනෙකු විය.
- ජයසේන රජුට පසුව සුද්ධෝදන කුමරා රජ බවට පත් වෙයි. ඔහු දෙව්දහ නුවර කෝලිය පරපුරේ **අංජන රජුගේ** වැඩිමහල් දියණිය වන **මහාමාය** කුමරිය සමග විවාහ වෙයි.
- අංජන රජුට දරුවන් **සිවු** දෙනෙකි. පුතුන් දෙදෙනා **දණ්ඩපානි හා සුප්පබුද්ධ** වන අතර දූවරු දෙදෙනා **මහා මායා හා ප්‍රජාපතී** වෙයි.
- සුද්ධෝදන රජුට දාව මහා මාය බිසවට **සිද්ධාර්ථ** නමින් පුතණුවෙකු බිහිවෙයි.
- මහා මායා දේවිය දරු ප්‍රසූතිය සඳහා දෙව්දහ නුවරට යන අතරමග **ලුම්බිණි සල් උයනේ දී** සිදුහත් බෝසත් උපත සිදු වේ.
- කුමරු දැකගැනීමට රජ මැදුරට ගිය **අසිත තවුසා** විසින් **කුමරුගේ සිරුරේ** ඇති **මහා පුරුෂ ලක්ෂණ** දැක කුමරු ඒකාන්තයෙන්ම බුදුවන බව දක කුමරුට නමස්කාර කරයි. මෙය දකින **සුද්ධෝදන රජුද කුමරුට නමස්කාර කරයි.**
- සිදුහත් කුමරුගේ උපතින් **පස්වන දින** නම් තැබීම සඳහා **රාම, ධජ, ලක්ෂමණ, මන්ත්‍රී, කොණ්ඩඤ්ඤ, භෝජ, සුයාම හා සුදත්ත** යන බමුණන් අටදෙනා පැමිණේ.
- ඔවුන් ද කුමරුගේ ශරීර ලක්ෂණ දැක **ගිහිගෙයි සිටියහොත් සක්විති රජ බවටද පැවිදි වෙතොත් බුද්ධත්වයට ද** කුමරු පත්වන බව පවසයි. **කොණ්ඩඤ්ඤ බමුණා පමණක්** කුමරු **ඒකාන්තයෙන්ම බුදුවන** බව පවසයි.කුමරුගෙන් **ලොවට සිදුවන අර්ථය පිළිබඳ සිතා** කුමරුට **සිද්ධාර්ථ** යන නම තබයි.
- කුමරුගේ උපතින් **සත්වන දින** මහාමයා දේවිය මියයයි. එතැන් පටන් කුමරු හදාවඩා ගන්නේ මහාමායා දේවියගේ නැගණිය වන **ප්‍රජාපතී ගෝතමී දේවිය** වීසිනුයි.
- ශාක්‍යයන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වන බැවින් නම් වල අගට '**ඕදන**' යන්න යොදාගෙන ඇත. ඕදන යනු පාලියෙන් **බත්** යන්නට යොදාගන්නා සමාන පදයකි.
- සාමාන්‍යයෙන් ශාක්‍ය ජනපද වල එක් එක් කන්නයේ ගොවිතැන ආරම්භ කරන්නේ **රජුගේ ප්‍රධානත්වයෙන් පවත්වන වප් මගුල් උත්සවයකිනි.**
- වප් මගුල් උත්සවයේ දී ගසක සෙවණක තබා සිටි සිදුහත් කුමරු **භාවනායෝගීව සිටිනු** දැක විශ්මයට පත්වන රජු නැවත වරක් **කුමරුට නමස්කාර** කරයි.
- කුමරු අධ්‍යාපනය ලද්දේ ' **විශ්වමිත්‍ර' හෙවත් 'සර්වමිත්‍ර'** නම් බමුණු පඬිවරයාගෙන් ය.
- සොළොස්වැනි වියේ සිටි සිදුහත් කුමරුගේ **රාජාභිෂේකය හා විවාහය** සිදුවන්නේ එකම දිනකයි.
**යශෝදරා හෙවත් භද්ධකච්චානා** කුමරිය සිදුහත් කුමරුගේ බිසවයි.

# 6. යොවුන් විය හා ගිහිගෙය කලකිරීම

- තම පුතු සක්විති රජෙකු වනු දැකීමට සුද්ධෝදන මහ රජතුමා මහත් ආශාවෙන් සිටියේ ය. ගිහිගෙය කෙරෙහි සිදුහත් කුමරුගේ ඇල්ම දියුණු කිරීම උදෙසා සුද්ධෝදන මහ රජතුමා හේමන්ත,වස්සාන සහ ගිම්හාන ඍතු තුන සඳහා වෙන වෙනම රම්‍ය, සුරම්‍ය, සුභ නමින් මාළිගා තුනක්ද තැනවීය.

- එම මාළිගා වල සේවය සඳහා නර්ථන කණ්ඩායම් ද යොදවන ලදි.කාමභෝගී දිවියක් ගත කළා වුවද මාළිගයේ ඒකාකාරී බව කෙටි කලකින් කුමරුට අප්‍රසන්න විය.විනෝදය පිණිස උද්‍යාන ක්‍රීඩාවට පිටත් වන අතරතුරදී ඇඟ රැළි වැටුණු, පැසුණු හිසකෙස් ඇති මහලු පුද්ගලයෙක් කුමරුගේ නෙත ගැටිණි.

- මින් පෙර මහල්ලෙක් දැක නොතිබූ හෙයින් කුමරු ඒ ගැන රියදුරුගෙන් විමසන ලදි.ඔහුත් අප මෙන්ම උපත ලබා දැන් ජරාවට පත්ව සිටින අයෙකු බව රියදුරු කුමරුට පැහැදිලි කර දෙන ලදි.

- කල් යාමේදී අපටත් එවැන්නක් සිදුවේදැයි කුමරු විමසූ විට එය එසේ බව රියදුරු පෙන්වා දුන්නේ ය. මෙතෙක් නුදුටු මෙම දර්ශනය නිසා කුමරු ජීවිතය කෙරෙහි ගැඹුරින් සිතන්නට පෙළඹුණු අතරම එදින උද්‍යාන ක්‍රීඩාවට නොයා රථය හරවාගෙන මාළිගය වෙත පැමිණියේ ය.

- මේ අයුරින්ම තවත් දිනයක රෝගී පුද්ගලයෙක් නෙත ගැටුණු අතර ඔහු අප මෙන්ම ඉපිද ජරාවට පත් වූ අයෙක් බව රියදුරුගෙන් අසා දැනගන්නා ලදි. ඉන්පසු දිනයක උයන් කෙළියට යන අතරතුරදී මියගිය පුද්ගලයෙක් ඔසවාගෙන යන අවමඟුල් පෙරහැරක් නෙත ගැටුණු පසු උපත ලබන සියලු දෙනා මිය යන බව කුමරු විසින් ප්‍රත්‍යක්ෂ කර ගන්නා ලදි.

- මෙසේ මහල්ලෙක්, ලෙඩෙක් හා මළ මිනිසෙක් දුටු කුමරු ජීවිතයේ යථාර්ථය පිළිබඳව වඩ වඩාත් සිතන්නට පෙළඹිණි. තවත් දිනයක උයන් කෙළියට යන අතරමඟදී ශාන්ත ලෙසින් මහ මඟ වඩින පුද්ගලයෙකු දක්නට ලැබිණි.ඒ පුද්ගලයා දුකින් මිදීමේ මඟ සොයන පැවිද්දෙකු බව සැක හැර ගත් කුමරු එසේ නම් එසේ සමාධියට පත් වන මඟක් පැවතිය යුතු බව පසක් කර ගත්තේ ය.

- ඉහත සිදුහත් කුමරු විසින් දුටු අවස්ථා සතර පෙර නිමිති ලෙස හඳුන්වන අතර කුමරුගේ සිත තුළ චතුරාර්ය සත්‍ය පිළිබඳව මූලික සංකල්ප ඇතිවීමට මුල් වූයේ මෙම අවස්ථා සතරයි.

- බුදුරජාණන් වහන්සේ පළමුව දේශනා කරනු ලැබූ දම්සක් පැවතුම් සූත්‍රයේ සඳහන් වන ද්වාදසාංග පටිච්චසමුප්පාදය ජීවිතය පිළිබඳ ගැඹුරින් මෙනෙහි කිරීම ඇසුරින් ලත් විශිෂ්ට සොයාගැනීමකි.

- පැවිදි රුව දුටු දින කුමරුට පහළ වූ සිතිවිල්ල නම් දුක නිමාකිරීමේ මඟක් කොහෝ හෝ ඇත යන්නයි.

- ප්‍රසන්න සිතින් යුතුව එදින උයන් කෙළිය නිමවා සිටින විට සුද්ධෝදන රජතුමාගේ දූතයෙකු පැමිණ දන්වා සිටියේ යශෝධරාවට පුත් කුමරෙකු ලැබුණු බවයි. දුක නැති කිරීමේ මඟක් සොයා යන්නට තීරණය කොට සිටි කුමරුට පුත් කුමරෙකුගේ උපත මහත් බාධාවක් බව හැඟුණි.

**රාහුලොජාතො බන්ධනං ජාතං**
**එනම් රාහුලයෙක් උපන්නේ ය,බැම්මක් හටගත්තේ ය යනුවෙන් කියවිණි.**

- නැවත මාළිගය බලා යාමේදී සඳලුතලයක් මත සිටි කිසාගෝතමී නම් කුමරියක් කුමරුගේ නිවුණු ස්වරූපය දැක ඉතා සතුටින් නිබ්බුත පද ගායනා කළාය.

නිබ්බුතා නූන සා මාතා
නිබ්බුතා නූන සො පිතා
නිබ්බුතා නූන සා නාරී
යස්සායං ඊදිසොපති

මෙවැනි පුතෙක් ලද මවක්
මෙවැනි පුතෙක් ලද පියෙක්
මෙවැනි සැමියෙක් ලද අඟනක්
නිසැකයෙන් ම නිවුණා වේ.

- නිවීමේ සුවය ගැන කී ඒ ගාථාව ඇසූ සිදුහත් කුමරු තුළ නිවීම ගැන බලාපොරොත්තු තව තවත් දියුණු වූයෙන් තම ගෙල බැඳි රන් මාලය ගලවා කිසා ගෝතමියට තෑගි කොට යැව්වේ ය.

- මාළිගයට ගොස් වෙනදාට වඩා සතුටින් කල් ගත කළ ද පුතුගේ උපත තම ගමනට බාධාවක් වන අයුරු සිදුහත් කුමරුට නැවත නැවත මෙනෙහි විය.

- නාටිකාංගනාවන් වෙනදා පරිදි කුමරු ඉදිරියේ නැටුම් ඉදිරිපත් කළ ද කුමරුට ඒ පිළිබඳ ව ඇල්මක් නොවීය. නාටිකාංගනාවන් එහි ම වැටී නිදන්නට වූ පසු මීන් මොහොතකට පෙර දෙවඟනන් සේ සැරසී සිටි කතුන්ගේ යථා ස්වභාවය ද නින්දෙන් කරන විප්‍රකාරද දැක කුමරු ජීවිතයේ හරය ගැන නැවත සිතන්නට විය.

- තම ගමනට සුදුසු වේලාව එළඹ ඇති බව දැනගත් කුමරු ඡන්න ඇමතිට කතා කොට කන්ථක අසු සූදානම් කර ගන්නැයි නියම කළේය.යශෝධරාවගේ යහන් ගැබට ගොස් දුර සිට පුතු දෙස බලා මාළිගයෙන් පිටත් විය.

- කන්ථක අසු පිට නැඟී ඡන්න සමඟ රාජධානි තුනක් පසු කර අනෝමා ගංතෙරට පැමිණි සිදුහත් කුමරු එතෙරට ගොස් මඟුල් කඩුවෙන් කෙස් කපා රාජාභරණ ගලවා කසාවතක් ඇඳ පැවිදි විය.

- තමන් පැවිදි වූ බව යශෝධරාවට හා මාපියන්ට දන්වන්නැයි ඡන්න ඇමතිට පැවසූ පසු රාජාභරණ රැගෙන ඡන්න ඇමති මාළිගයට පැමිණි අතර කන්ථක අසු ස්වාමියා නොමැති ශෝකයෙන් ළය පැලී ගං ඉවුරේදීම මිය ගියේය.

- සිදුහත් බෝසතාණෝ අනෝමා ගඟ අසබඩ අනුපිය නම් අඹ වනයෙහි සතියක් විවේක සුවයෙන් සිට රජගහ නුවරට පැමිණියේ ය.සිදුහත් තවුසාණෝ ගෙයින් ගෙට පිඬුසිඟා වඩින බව බිම්බිසාර රජතුමාට සැල විය.

- තවුසා පාණ්ඩව පර්වතය වෙත වැඩි බව අසා බිම්බිසාර රජතුමා එහි ගොස් තවුසාණන්ගේ තොරතුරු අසන ලදි.සිදුහත් බෝසත් තුමා ගිහි කළ බිම්බිසාර රජතුමාගේ නුදුටු මිතුරෙක් විය.බිම්බිසාර රජතුමා සිදුහත් කුමරුට ආරාධනා කළේ තම රාජ්‍යය දෙකට බෙදාගෙන පාලනය කරන්නටය.

- තමා දුක නැති කරන්නට මඟක් සොයන හෙයින් ගිහිගෙයින් නික්මුණු බව සිදුහත් තවුසාණෝ පහදා දුන් පසු ව සම්බුද්ධත්වය ලද පසු තම රාජ්‍යයට වඩින ලෙස බිම්බිසාර රජතුමා සිදුහත් තවුසාණන්ට ආරාධනා කළේය.

- භාර්ගව නම් තාපසතුමා වෙත පැමිණි සිදුහත් බෝසතාණෝ එතුමා දත් සියලු ධර්ම ස්වල්ප දිනකින් ඉගෙන අවසන් කළේය.

- පසුව වේශාලිය සමීපයේ විසූ ආලාරකාලාම තවුසා වෙත ගොස් ආකිඤ්චඤ්ඤායතනය දක්වා සිත දියුණු කළේය.පසුව මගධරට මහී ගඟෙන් එතර විසූ උද්දකරාම පුත්ත හෙවත් රාම පුත්ත තවුසා වෙතින් නේවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා සිත දියුණු කළේය.

- ඉන්පසු උරුවේලාවේ සේනානි නියංගම අසල නිල්දලා ගංතෙරදී තවුස් පැවිද්දෙන් පැවිදි ව සිටි කොණ්ඩඤ්ඤ, වප්ප,භද්දිය, මහනාම, අස්සජි යන පස්වග තවුසන් මුණගැසුණි.ඔවුහු බෝසතාණන් වහන්සේට ඉතා කැමැත්තෙන් උපස්ථාන කළහ.

- ආලාරකාලාම, උද්දකරාම පුත්ත ආදී ආචාර්යවරුන් වෙතින් සමුගෙන කිංකුසල ගවේෂිව හුදෙකලාව නිවන සොයන්නට පැමිණි බෝසතාණෝ නේරංජනා නදී තීරයේ වන ලැහැබක උග්‍ර තවුස්දම් පිරීම අරඹන ලදි.ඒ දුෂ්කර ක්‍රියා සමය ගැන සැවැත්නුවර ජේතවනාරාමයෙහි දී ජානුස්සෝනි නම් බමුණාටත් විසාලාවේ කූඨාකාර ශාලාවේ දී සච්චක හටද විස්තර කොට ඇත.

- සිරුරට අධික ලෙස දුක් දීමෙන් තමා සොයන විමුක්තිය ළඟා කරගත නොහැකි බව අවබෝධ කර ගත් සිදුහත් බෝසතාණෝ නැවත ආහාර ගෙන මැදුම් පිළිවෙත පුරන්නට වූහ.

- බෝසතාණෝ බුදුවීමේ අදහස අත්හළ බව සිතූ පස්වග මහණුන් බෝසතාණන් වහන්සේ අතහැර බරණැස ඉසිපතනය කරා ගියහ.

- පැවිදි වී සය වන වර්ෂය වන විට නෙක්ඛම්ම,අව්‍යාපාදය,අවිහිංසාව යන සංකල්ප දියුණු කරගන්නට සිදුහත් බෝසතාණෝ සමත් විය.

- වෙසක් මස පුර තුදුස්වක දින රාත්‍රියේ අලුයම් කාලයේ දී බෝසතාණෝ සිහින පහක් දුටුවේය.

- පළමු වන සිහිනයේදී මහ පොළොව යහනක් විය.හිමාලය පර්වතය කොට්ටය විය.බෝසතුන්ගේ වම් අත පෙරදිග මුහුදෙහි ද දකුණු අත අවර දිග මුහුදෙහිද විය.දකුණු දිග මුහුදෙහි දෙපා විහිදී තිබිණි.

- සියල්ල අභිබවා බෝසතුන් බුදුබව ලබන බවට පෙරනිමිත්තක් එම සිහිනයෙන් පැවසෙන බවඋන්වහන්සේ තේරුම් ගත් සේක.

- දෙවෙනි සිහිනය වූයේ බෝසතුන්ගේ නාභියෙන් රතු ඊතණ ගසක් පැන නැඟී අහස පුරා දිග්ව පැතිර යාමයි. ශ්‍රේෂ්ඨ ආර්ය අෂ්ඨාංගික මාර්ගය අවබෝධ කර ගෙන එය ලොව පුරා දේශනා කරන බව ඉන් කියවිණි. තෙවන සිහිනය වූයේ කළු හිස් ඇති සුදු පණුවන් රාශියක් බෝසතාණන් වහන්සේගේ පාද මූලයෙන් නැඟී දණහිස තෙක් වසා ගැනීමයි.

- බොහෝ උපාසක උපාසිකාවන් බුදු රජාණන් වහන්සේගේ සරණ යන බව එම සිහිනයේ අර්ථයයි.

- සතර වන සිහිනයේදී සිව් දිගින් පියඹා ආ ඒ ඒ වර්ණයෙන් යුතු ලිහිණියන් සතර දෙනෙක් බෝසතුන්ගේ පාමුල වැටී එකම සුදු වර්ණයෙන් යුක්ත විය.

- ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය සහ ශුද්‍ර යන සිව් කුලයන්ගෙන් පැවත එන ජනයා බුදු හිමි සමීපයේ පැවිදිව එකම ආර්ය ශ්‍රාවකයන් බවට පත් වන බව ඉන් අදහස් විය.

- පස් වන සිහිනය වන්නේ කිලිටි අසූචි පර්වතයක් මුදුනේ එහි නොගැටී බෝසතුන් වහන්සේ සක්මන් කිරීමයි.

- සිව්පසයෙහි බොහෝ ලාභ ප්‍රයෝජන ලැබෙද්දී එහි නොඇලී නිරාමිස පිවිතුරු දිවියක් ගත කිරීම එහි අර්ථයයි.

- මෙම සිහින පහ අර්ථවත් කරන්නේ තමා ඒකාන්තයෙන්ම බුදු බවට පත් වන බව වටහා ගත් බෝසතාණෝ ප්‍රසන්න සිතින් අජපල් නුග රුක මුල වැඩ සිටියේය.

- එදින අලුයම සේනානී නම් නියම් ගමේ අධිපතියාගේ දියණිය වූ සුජාතාවෝ පෙර වූ බාරයක් ඔප්පු කිරීමට දිය නුමුසු කිරිබත් පිස රන්තලියක බහා රැගෙන ආවාය.

- දුරදීම බෝසතාණන් වහන්සේ දැක සිත පැහැදී කිරිබත පුදා මාගේ අදහස ඉෂ්ඨ වූවාක් මෙන් ඔබ වහන්සේගේ අදහස ද ඉෂ්ඨ වේවා යි ප්‍රාර්ථනා කළාය.

- බෝසතාණෝ එම රන් තලිය ගෙන නේරංජනා නදියෙන් දිය නා කිරිබත ගුලි හතලිස් නවයක් සාදා ඉදිරි සති හත වෙනුවෙන් ම මෙය මට ආහාර පිණිස වේවා යැයි සිතා එය වැළඳුවේය.

- කිරිබත වළඳා අවසානයේ රන් පාත්‍රය අතින් ගෙන අද මාගේ බලාපොරොත්තුව වන සම්බුද්ධත්වය නිසැකවම සිදු වේ නම් මේ රන්තලිය උඩුගම් බලා යේවායි සිතා ගඟට දැමූහ.

- රන් පාත්‍රය උඩු ගම් බලා ගොස් දිය සුළියකට හසුව ගඟේ ගිලී යනු දුටු බෝසතාණෝ තම අරමුණ සාර්ථක වන බව දැක සතුටු වූහ.

- සවස බෝසතාණන් වහන්සේ බෝ සෙවණ කරා ගමන් කරන විට අතරමඟදී විකිණීම සඳහා කුස තණ රැගෙන යන සොත්ථිය බමුණා මුණගැසුණි.

- සන්සුන් ඉඳුරන් ඇති බෝසතාණන් දුටු ඔහු පැහැදී කුස තණ අට මිටක් පූජා කළේය.

- බෝ මුළ කරා ගිය බෝසතාණෝ කුස තණ අට මිට එහි අතුරා විදුරාසනයේ අපරාජිත පර්යංකයෙන් වැඩ හිඳ චතුරංග වීර්යය ඉපදවූහ.

1. සිරුරෙහි සම ගැලවී විසිර ගියත් බුදු වී මිස නොනැඟිටිමි.
2. සිරුරෙහි නහර ගැලවී විසිර ගියත් බුදු වී මිස නොනැඟිටිමි.
3. සිරුරෙහි ඇට කටු ගැලවී විසිර ගියත් බුදු වී මිස නොනැඟිටිමි.
4. සිරුරෙහි මස් ලේ විසිර ගියත් බුදු වී මිස නොනැඟිටිමි.

- මෙම අධිෂ්ඨානය දුටු දේව සේනාවෝ සහ බ්‍රහ්ම සේනාවෝ බුද්ධත්වය ලබා ගැනීම දැක ගැනීමට රැස් වූහ.

- මෙම අධිෂ්ඨානය බිඳ දැමීමට සිතූ මාරයා මර සෙනඟ පිරිවරාගෙන මහා ශබ්ද ඇති කරමින් පැමිණියේ ය.

➢ මාරයාගේ බියකරු බව දුටු දෙවියන් සහ බ්‍රහ්මයන් හිස් ලූ ලූ අත දිවූහ.

➢ මාරයා ගිරිමේඛලා ඇතු පිට සිට මුලින් ම මහා සුළඟක් මැවීය.එම පෙදෙස කම්පාවට පත් වුවද බෝසතුන් ඉන් කැළඹීමට පත් නොවූ විට මහා ගිගුරුම් සහිත වැස්සක් මැවීය.

➢ පොළොව සිදුරු වී ගියද බෝසතුන් එම වැස්සෙන් ද කම්පා නොවූ බව මාරයා දැනගත්තේ ය. ඉන්පසු මාරයා ගිනිගෙන දැවෙන පර්වත වැස්සක් ද ආයුධ වැස්සක්ද වැලි වැස්සක් ද උණු අළු වැස්සක් ද අන්ධකාර පටලයක් ද ලෙස නවවිධි වර්ෂාවන් බෝසතාණන් වහන්සේ වෙත එවුවේ ය.

➢ ඒ අවි වැසි පවා බෝසතුන් පාමුල පිදෙන මල් මෙන් උන් වහන්සේ පාමුල පතිත විය. අවසානයේ දී මාරයා ගිරිමේඛලා ඇතු පිට සිට චක්‍රායුධයෙන් බෝසතාණන්ට දමා ගැසුවේ ය.එය බෝසතාණන් වහන්සේට ඉහළින් වියනක් සේ රැඳී සිටියේය. සිද්ධාර්ථය තොපට ඔය වජ්‍රාසනය හිමි නැතැයි මාරයා බෝසතුන්ට අභියෝග කළේය.

➢ එම්බල මාරය, පිරූ සමත්‍රිංසත් පාරමී දම් බලැති,ඥානාර්ථචරියා,ලෝකාර්ථචරියා,බුද්ධචරියා සපුරා ඇති මට මිස තට මෙය උරුම නැතැයි මාරයාට බෝසතාණෝ පිළිතුරු දුන් සේක.

➢ පාරමී දම් පිරූ බවට සාක්ෂි කවරේදැයි මාරයා විමසූ විට මේ මහ පොළොව ඊට සාක්ෂි දරණු ඇතැයි මහ පොළොවට අත දිගු කරමින් බෝසතාණෝ පිළිතුරු දුන් සේක.

➢ මහ පොළොව මහ හඬින් ගුගුරන්නට වූ අතර මාරයා හා සේනාව බියපත් වී දුවන්නට වූහ.ගිරි මේඛලා ඇතු බෝසතුන් ඉදිරියේ දණ නමා සිටියේ ය.

➢ මාරයා පලා ගිය බව දුටු දේව බ්‍රහ්ම සේනා සාධුකාර දෙන්නට පටන් ගත්තේ ය.ජාතක කතා අටුවා නිධානයේ ද,බුද්ධ වංශ අටුවාවේ ද සාංචි හා නාගර්ජුන කොණ්ඩ හා ගාන්ධාර කැටයම් වල ද මාර යුද්ධය පිළිබඳ ව විස්තර දැක්වේ.

➢ සුත්තනිපාතයේ ප්‍රධාන සූත්‍රයේ විස්තර වන අන්දමට බෝසතුන් බුදු වීමට පෙර දස මාර සේනා පලවා හැරි අතර මාරයා පරාජය කළේය.

- දස මාර සේනා,

1. කාමය
2. අරතිය
3. සාපිපාසාව
4. තණ්හාව
5. ථීනමිද්ධය
6. භය
7. විචිකිච්ඡාව
8. ගුණමකු බව හා දැඩි බව
9. ලාභ සත්කාර හා වැරදි මාර්ගයන්ගෙන් ලබන යසස
10. තමන් උසස් කොට සලකමින් අනුන් පහත් කොට තැකීම

➢ මාරයා නම් දිව්‍ය පුත්‍රයා බුදු බව ලැබී කලක් යන තුරුම නොයෙක් සතුරු කම් කරමින් බුදුරජාණන් වහන්සේ පසුපස ගමන් කළ වග සංයුක්ත නිකායේ මාර සංයුක්තයේ සමහර සූත්‍ර වල කියවේ.

- බෝසතාණන් වහන්සේ පසුදින පෙරයම් භාගයේ දී සර්වඥතාඥානය පිණිස හිත මෙහෙයවූහ.

- අනාපානසතිය ඔස්සේ පිළිවෙලින් ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය යන ධ්‍යානයන්ට සමුවැදුණහ.

- පළමුව පුබ්බේනිවාසානුස්සති ඥානය හෙවත් පෙර ආත්ම දැකීමේ නුවණ පහළ විය. ආත්මයක් නැති බව වැටහීමත් සමඟ විද්‍යාව (විජ්ජා උදපාදි ) පහළ විය.

- මෝහය දුරුවී ප්‍රඥාව (ආලෝකා උදපාදි) ඇතිවිය.

- මධ්‍යම යාමයේ දී නැවත අනුපිළිවෙලින් ධ්‍යානයන්ට සමවැදුණු විට සත්වයින්ගේ චුති සහ උප්පත්ති දෙක දැකීමේ නුවණ හෙවත් චුතූපපාත ඥානය පහළ විය.

- අනතුරුව ධ්‍යානයට සමවැදුණු විට කෙලෙස් නැති කිරීමේ ඥානය හෙවත් ආශ්‍රවක්ෂයකර ඥානය පහළ විය.

- එවිට මේ දුකය,දුකට හේතුවය,දුක නැතිකිරීමය,දුක නැති කිරීමේ හේතුවය ලෙස චතුරාර්ය සත්‍ය අවබෝධය පහළ විය.

- කාමාශ්‍රව,භවාශ්‍රව,අවිද්‍යාශ්‍රව යන ආශ්‍රව වලින් සිත මිදුණි.

- මෙසේ බෝසතාණන් වහන්සේ පිළිවෙලින් අරහත් මාර්ග ඥානය සමඟ සිව්පිළිසිඹියා,ෂඪ් අසාධාරණ ඥාන,තුදුස් බුද්ධ ඥාන,අටලොස් ආවේණික ධර්ම,දසබල සහ චතුර්වෛශාරද ආදී බුදුගුණ සපුරමින් වෙසක් පුර පසළොස්වක පොහොය දින උතුම් සම්බුද්ධත්වයට පත් වූ සේක.

# 7. උදාන සහ සත්සතිය

- බුදු රජාණන් වහන්සේ බුද්ධත්වය සාක්ෂාත් කර ගැනීමත් සමග අවබෝධ කළේ:
    - සත්වයා නැවත නැවත සංසාරයට පමුණුවන්නේ- තණ්හාව
    - තණ්හාව නැති කරන මාර්ගය - මධ්‍යම ප්‍රතිපදාව වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය
    - එහි ප්‍රතිඵලය- සිත විසංස්කාර කොට තෘෂ්ණාව ක්ෂය වූ නිර්වාණ අවබෝධය
- අතිශය දීර්ඝ කාලයක් භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වය පිණිස පාරමී ධර්ම පිරූ සේක.
- අවසානයේ ලෝකයේ යථා ස්වභාවය කිසිම ගුරුවරයෙකුගේ උපදේශයක් නොමැතිව තමන් වහන්සේ විසින් ම අවබෝධ කර ගත් සේක.
- මේ පිළිබඳ උන්වහන්සේගේ සිතෙහි හටගත් නිරාමිස ප්‍රීතිය මෙසේ උදාන ගාථාවකින් වදාළ සේක.

**අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං**
**ගහකාරකං ගවේසන්තෝ - දුක්ඛා ජාති පුනප්පුනං**
**ගහකාරක දිට්ඨෝසි - පුනගෙහං න කාහසී**
**සබ්බා තේ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං**
**විසංඛාර ගතං චිත්තං - තණ්හාණං ඛය මජ්ඣගා**

**නැවත නැවත ඉපදීම දුකකි. පඤ්චස්කන්ධය නැමැති ගෙය තනන වඩුවා සොයමින් මෙතෙක් සසර පුරා ඇවිද්දෙමි. තණ්හා වඩුව, මා විසින් තා දක්නා ලද්දේ ය. නැවත තා මට ආත්ම භව නමැති ගෙය නොසාදන්නෙහිය. තාගේ සියලු කෙලෙස් නමැති පරාළ හා අවිද්‍යා කැණි මඩල මවිසින් විනාශ කරන ලද්දේය. මාගේ සිත නිවනට පැමිණියේය. තෘෂ්ණාව ක්ෂය වූ අරහත්ඵලයට පත් විය.**

- බුද්ධත්වය ලබා සති හතක් ගතවනතුරු භාග්‍යවතුන් වහන්සේ බෝධින් වහන්සේට නුදුරු තැන්වල නිරාමිස ප්‍රීතියෙන් ගත කළ සේක.

## පළමු සතිය




- වැඩ සිටි ස්ථානය: සම්බුද්ධත්වය ලද බෝමැඩ (විජය පර්යංකය)
- බුදු රජාණන් වහන්සේ අරහත් ඵල සමාපත්තියට සමවැද විමුක්ති සුවයෙන් වැඩ සිටි සේක.
- පටිච්ච (ප්‍රතීත්‍ය) සමුප්පාද ධර්මය මුල සිට අගටත් (අනුලෝම වශයෙන්) සහ අග සිට මුලටත් (ප්‍රතිලෝම වශයෙන්) මෙනෙහි කළ සේක.
- භාග්‍යවතුන් වහන්සේ තවමත් බුද්ධත්වයට පත්ව නැතැයි දෙවිවරු සැක පහල කළහ.
- මේ සැකය දුරු කිරීමට, බුදු රජාණන් වහන්සේ ප්‍රථමවරට යමාමහ පෙළහර (යමක ප්‍රාතිහාර්ය) දැක්වූ සේක.

## 2 වන සතිය




- අනිමිස ලෝචන පූජාව සිදු කිරීම.
- එනම්: තමන් වහන්සේට බුද්ධත්වය පිණිස සෙවන සලසා දුන් බෝධි වෘක්ෂයට ගෞරවයක් ලෙස සතියක් පුරා බෝධින් වහන්සේ දෙස ඇසිපිය නොහෙලා බලා සිටීම.

## 3 වන සතිය




- රුවන් සක්මන
- එනම්: බෝමැඩත් අනිමිස ලෝචන පූජාව කළ ස්ථානයක් අතර නැගෙනහිරට හා බස්නාහිරට සක්මන් කරමින් සිටීම.

## 4 වන සතිය




- රුවන් ගෙයි වැඩ සිටීම.
- බෝධි වෘක්ෂයට වයඹ දෙසින් රුවන්ගෙය පිහිටා තිබී ඇත.
- එහිදී, තමන් වහන්සේ අවබෝධ කළ ධර්මය ගැඹුරින් මෙනෙහි කළ සේක.
- අභිධර්මය මෙනෙහි කරද්දී සිත ප්‍රසන්නතාවෙන් පවිත්‍ර විය.
- එනිසා සිරුරින් සවණක් බුදුරැස් විහිදුණි.

## 5 වන සතිය




- අජපාල නුග රුක මුල වැඩ සිටීම.
- භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ හිඳ ධර්මය නුවණින් සලකමින් විමුක්ති සුවයෙන් ගත කළ සේක.
- එක් මාන්නාධික හුහුංක ජාතික බ්‍රාහ්මණයෙක් උන්වහන්සේ වෙත පැමිණ ප්‍රශ්නයක් විමසීය.

> **“ ගෞතමය කවර කරුණු නිසා බ්‍රාහ්මණයෙක් වන්නේද? බ්‍රාහ්මණයෙකු බවට පත් කරන ධර්ම කවරේද? ”**

- බුදු රජාණන් වහන්සේගේ පිළිතුර

> **“යෝ බ්‍රාහ්මණෝ බාහිත පාප ධම්මො**
> **නිහුහුංකකො නික්කසාවො යතත්තො**
> **වෙදන්ත ගු වුසිත බ්‍රාහ්මචරියො**
> **ධම්මේන සෝ බ්‍රහ්මවාදං වදෙය්‍යා**
> **යස්සුස්සදා නත්ථි කුහිංචි ලොකෙ”**

### ගාථාවේ අදහස

- පව් දුරු කළ
- අනුන් හෙළා දැකීම් වශයෙන් හුහුංකාරී නොවන (හුම් හුම් යයි උපහාස නොකරනසුලු )
- කෙලෙස් කහට නැති
- භාවනාවෙන් සිත සංවර කළ
- සතරමග නුවණින් නිවන් කරා පැමිණිය
- මාර්ග බ්‍රහ්ම චර්යාවේ වාසය නිමා කළ
- ලෝකයේ කිසිම අරමුණක් රාග, ද්වේශ, මෝහ මාන දෘෂ්ටි වශයෙන් නොගන්න ඒ පුද්ගලයා බ්‍රාහ්මණයෙක් ලෙස ඇමතීමට සුදුසු ය.

ඒ බමුණා නළල රැළි නංවා හිස සොලවා යන්න ගියේය.

- බුදු රජාණන් වහන්සේගේ සිත සසල කිරීමට මාරයා විවිධ උපක්‍රම යෙදවීය.
  - විවිධ වෙස් ගෙන බුදුරජ ඉදිරියට පැමිණීම. (උදා: මහා ඇතෙකු සේ)
  - තම දියණියන් තිදෙනා: තණ්හා, රතී, රඟා විවිධ රූගුම් පාමින් බුදුරජුන් රාගයෙන් පෙළඹවීමට යැවීම.

- බුදු රජාණන් වහන්සේ මාරයාගේ උපක්‍රම හඳුනා ගත් සේක.
- මාරයා නැවත වරක් පරාජ විය.
- ශ්‍රී සද්ධර්මය තමන් වහන්සේගේ ගුරුවරයා ලෙස සැලකීමට බුදු රජාණන් වහන්සේ තීරණය කළ සේක.

## 6 වන සතිය



- ගත කළ ස්ථානය: අජපාල නුග රුක සමීපයෙහි මුචලින්ද නම් වෘක්ෂය මුල
- ඒ සතිය පුරාම අකලට මහා වැස්සක් ඇද හැලිණ.

- මුචලින්ද වෘක්ෂය අසළ මුලචලින්ද නම් විලක් විය.
- ඒ විලෙහි වාසය කළ මුචලින්ද නාගරාජයා බුදුරජුන් නොතෙමෙන සේ සතිය පුරාම සෙවණ සැලසීය.

## 7 වන සතිය




- ගත කළ ස්ථානය: රජායතන නම් කිරිපලු වෘක්ෂය සෙවණේ
- බුදුරජාණන් වහන්සේ අර්හත්ඵල සමාපත්ති සුවයෙන් වැඩ සිටියහ.

- උතුම් බුද්ධත්වයට පත් වූ දින සිට දින 49 ක් පුරා බුද්ධත්වය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රීතිය බුදුරාජාණන් වහන්සේ තුළ විය.
- තවද,බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ වටහාගත් ගැඹුරු ධර්මය, කෙසේ කාමයෙන් මත් වූ සත්ත්වයාට පැහැදිලිකර දිය යුතු ද යන්න මේ සත් සතිය තුළදී විමසා බැලූ සේක. ........................

# 8. බුදුරදුන් ලොවට හෙළි කළ ශ්‍රේෂ්ඨ ධර්මය

## සත්සතිය අවසානය



- සත් සතිය අවසානයේ භාග්‍යවතුන් වහන්සේ සමවත් සුවයෙන් නැගී සිටි සේක.
- වෙළඳාමෙහි ගිය තපස්සු සහ භල්ලුක වෙළෙඳ දෙබෑයන්ට බුදු රජාණන් වහන්සේ මුණ ගැසිණි.
- ඔවුන් බුරජාණන් වහන්සේට
    - මුව දෝවනය කිරීමට පැන්
    - වැළඳීමට අත්සුනු
    - මී පිඬු පිළිගැන්වීය.
- අවසානයේ ධර්මය ශ්‍රවණය කළහ.
- ප්‍රථම ද්වේවාචික උපාසකයක් බවට පත් විය.

## ධර්මය දේශනා කිරීමට සුදුස්සෙකු විමසීම

- තමන් වහන්සේ වටහා ගත් ගැඹුරු ධර්මය අවබෝධ කිරීමට හැකි අයෙකු පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ විමසා බැලූ සේක.
- මුලින් ඇසුරු කළ ආළාරකාලාම, උද්දකරාමපුත්‍ර යන තාපසවරුන් සිහිපත් විය.
- ඒ දෙදෙනා ඒ වනවිට මිය පරලොව ගොස් අසඥ තලවල උපත ලබා සිටියහ.
- එනිසා කලක් තමන්වහන්සේට උපස්ථාන කළ පස්වග තවුසන් සොයා යා යුතු යැයි තීරණය කළ සේක.
- ඒ සඳහා බරණැස ඉසිපතනයේ මුවන්ගේ අභය භූමිය බලා වැඩම කළ සේක.

## උපක හමුවීම



- අතරමග උන්වහන්සේට උපක නම් ආජීවකයා මුණ ගැහිණි.
    - **උපක:** සන්සුන් ඉඳුරන් හා ප්‍රසන්න පෙනුමෙන් යුත් ඔබ කවරෙක්ද? කා උදෙසා පැවිදි වූයේද?
    - බුදුරජ: මට වෙනත් ගුරුවරයෙක් නැත. මම සියලු පාපයන් ජයගෙන සිටින හෙයින් "අනන්ත ජින" වෙමි.
    - උපක: එසේ විය හැකිය. නැවත අවශ්‍ය වුවහොත් මම ඔබ සොයා එමි.
- මේ කතා බහ අවසානයේ උපක සමුගෙන ගියේය.
- බුදු රජාණන්වහන්සේ ඉසිපතනය බලා නැවත ගමන් ඇරඹූ සේක.

## ඉසිපතන මිගදායේ දී



- ගංගා නදියෙන් එතරව ඇසළ පුන් පොහෝ දින සවස් යාමය වන විට එහි ළඟා වූ සේක.
- දුර සිට භාග්‍යවතුන් වහන්සේ වඩිනු දුටු පස්වග තවුසන් අතර මෙවැනි කතා බහක් ඇතිවිය.
- “සිදුහත් ගෞතමයන් බුද්ධවත්වයට පත්වීමට නොහැකිව, සැපසේ දිවි ගෙවීමට කැමතිව නැවත අප කරා පැමිණෙන සේය. එබැවින් අපි පා සිවුරු පිළිගැනීම් හෝ ගෞරවාචාර කිරීම් නොකරමු. ශාක්‍ය කුලයෙහි උපත ලද්දෙකු නිසා අසුනක් පැනවීම පමණක් සිදු කරමු.”
- නමුත් භාග්‍යවතුන් වහන්සේ සමීප වන විට ඔවුන්ට එසේ සිටීමට නොහැකි විය.
- ගෞරවයෙන් බුදු රජාණන් වහන්සේ පිළිගෙන පිළිසඳර කතාවේ යෙදිණි.
- එහිදී පස්වග තවුසන් බුදු රජාණන් වහන්සේ ඇමතුවේ “ ඇවැත්නී, ගෞතමයෙනි” ලෙසිනි.
- එහිදී බුදුරජාණන් වහන්සේට “ඇවැත්නී” ලෙස ඇමතීම සුදුසු නොවන බව භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට පැහැදිලි කර දුන් සේක.
- පස්වග තවුසන්, “දුෂ්කර ක්‍රියාව තුළින් පමණක් සම්බුද්ධත්වය ප්‍රත්‍යක්ෂ කර ගත හැකිය” යන මතය දැරූහ. එබැවින් දුෂ්කර ක්‍රියාව අත්හල බෝසතාණන් වහන්සේ බුද්ධත්වය ප්‍රත්‍යක්ෂ කළ බව පිළිගැනීමට ඔවුහු මැලි වූහ.

**බුදුරජ:** මහණෙනි, තථාගතයන් වහන්සේ සම්මා සම්බුද්ධය. අර්හත්ය. නිවන ලබන ලද්දේය. මම ඔබට ධර්මය දේශනා කරමි. හොඳින් කන් යොමා අසන්න.

බුදුරජාණන් වහන්සේ නැවත නැවතත් මෙසේ ප්‍රකාශ කළද පස්වග තවුසන් ඒ බව නොපිළිගත්තේය.

**බුදුරජ:** මහණෙනි, ඔබට මීට පෙර දුෂ්කර ක්‍රියා කරද්දි මා බුදු බව ලැබුවේ යැයි කිසි දිනක අස නමක් කී බවත් මතක තිබේද?

**පස්වග තවුසන්:** ස්වාමීනී, ඔබ වහන්සේ කිසිවිටක අප බොරුවෙන් රවටා නැත.

අවසානයේ පස්වග තවුසන් සත්‍ය පිළිගෙන බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය ශ්‍රවණය කිරීමට සූදානම් විය.

## ප්‍රථම ධර්ම දේශනය



- බුදු රජාණන් වහන්සේ ලෝක සත්ත්වයන් කෙරෙහි මහා අනුකම්පාවෙන් සිදු කළ ප්‍රථම ධර්ම දේශනය “ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාවයි.”
- එම දේශනාවේ අඩංගු දහම් කාරණා කෙටියෙන් මෙසේයි.
- පැවිද්දෙක් විසින් අත්හළ යුතු අන්ත 2කි.

1. කාමසුඛල්ලිකානුයෝගය - ශරීරයට අධික සේ සැප ලබා දීම.
2. අත්තකිලමථානුයෝගය - ශරීරයට අධික ලෙස දුක් ලබා දීම.

- මේ අන්ත දෙක අතහැර නිවන පිණිස පවතින මධ්‍යම ප්‍රතිපදාව තමන් වහන්සේ අවබෝධ කළ බවත් දේශනා කළ සේක.
- එම මධ්‍යම ප්‍රතිපදාව වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය මෙසේය.

1. සම්මා දිට්ඨි - නිවැරදි දැකීම
2. සම්මා සංකප්ප - නිවැරදි කල්පනාව
3. සම්මා වාචා- නිවැරදි වචනය
4. සම්මා කම්මන්ත- නිවැරදි ක්‍රියාව
5. සම්මා ආජීව- නිවැරදි දිවි පැවැත්ම
6. සම්මා වායාම - නිවැරදි උත්සහය
7. සම්මා සති- නිවැරදි සිහිය
8. සම්මා සමාධි- නිවැරදි සමාධිය

- මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය චතුරාර්ය සත්‍ය අවබෝධය පිණිසත් නිවන පිණිසත් හේතු වෙයි.

- චතුරාර්ය සත්‍ය ධර්මයන් මෙසේයි.

1. දුක්ඛ ආර්ය සත්‍යය
2. දුක්ඛ සමුදය ආර්ය
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය

## දුක්ඛ ආර්ය සත්‍යය



- දුක්ඛ ආර්ය සත්‍යය යනු දුකයි.
- එනම්: ඉපදීම, වයසට යාම, ලෙඩ වීම, මරණය, අප්‍රියයන් හා එක් වීම, ප්‍රියයන්ගෙන් වෙන් වීම, ප්‍රාර්ථනා කරන දෙය නොලැබීම ආදි දුක්ය.
- සරලවම, මේ පංචඋපාධානස්කන්ධයම දුකකි.
- දුක්ඛ ආර්ය සත්‍ය හෙවත් දුක අප විසින් අවබෝධ කළ යුතුය.

## දුක්ඛ සමුදය ආර්ය සත්‍යය



- දුක්ඛ සමුදය ආර්ය සත්‍ය යනු දුකට හේතුවයි.
- එනම් තණ්හාවයි.
- තණ්හාව ආකාර 3කි.
  1. කාම තණ්හාව - පංච කාමයෙහි ඇලෙන සුලු බව.
  2. භව තණ්හාව - පැවැත්ම කෙරෙහි ඇති ආශාව/ ශාස්වත දෘෂ්ටිය
  3. විභව තණ්හාව - නොපැවැත්ම කෙරෙහි ඇති ආශාව/ උච්ඡේද දෘෂ්ටිය

➢ තණ්හාව ප්‍රහාණය කළ යුතුය.

## දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය

- දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය යනු දුක නැති කිරීමයි.
- එනම්, මේ තෙවැදෑරුම් තණ්හාවේ මුල් සිඳ දැමීමක් වේද, යම් දුරු කිරීමක් වේද, සම්පූර්ණයෙන් බැහැර කිරීමක්, නොඇලීමක් වේද එය මුළුමනින්ම නැති කිරීම වූ නිර්වාණයයි.
- දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය සාක්ෂාත් කළ යුතුය.

## දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය



- දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය යනු දුක නැති කිරීම පිණිස අනුගමනය කළ යුතු මාර්ගයයි.
- එනම්, ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි.
- දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය ප්‍රගුණ කළ යුතුය.

- භාග්‍යවතුන් වහන්සේ චතුරාර්ය සත්‍යයේ එක් එක් අංග,

1. සත්‍යඥාන
2. කෘත්‍යඥාන
3. කෘතඥාන

වශයෙන් පරිවර්ත තුනකින් යුතුව ආකාර 12 කින් (4×3) යුතුව අවබෝධ කළ සේක.

- මෙසේ දොළොස් ආකාරයකින් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කළ පසු තමන්වහන්සේ උතුම් සම්මා සම්බුද්ධත්වය සාක්ෂාත් කළ බව ලෝකයට ප්‍රතිඥා දුන් සේක.
- සූත්‍ර දේශනාව අවසානයේ **කොණ්ඩඤ්ඤ තවුසාණෝ** " යමක් ඇති වීම ස්වභාව කොට ඇත්තේ නම් එය නැති වීමද ස්වභාව කොට ඇත්තේය" යන වැටහීමත් සමග **උතුම් සෝවාන් ඵලයට** පත් වූහ.
- කොණ්ඩඤ්ඤ තවුසා මෙහිදි චතුරාර්ය සත්‍යය පිළිබඳ දැනීම ඇති වූ නිසා එතුමන්ට "**අඤ්ඤාකොණ්ඩඤ්ඤ**" යන නමින් බුදුරජාණන් වහන්සේ ඇමතූ සේක.
- උතුම් පැවිදි දිවියට ඇතුළු වූ පසු උන් වහන්සේ " අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ" යනුවෙන් ප්‍රකට විය.

- කොණ්ඩඤ්ඤ තවුසාට "**ඒහි භික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන්**" හිමි විය.
- එනම්: භාග්‍යවතුන් වහන්සේ " මහණ, මෙහි එන්න. දුක් කෙළවර කිරීම පිණිස ශාසන බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්න." යන ඇමතුමත් සමග තවුස් වෙස් අතුරුදහන් ව ඉබේ ම පහළ වූ සිවුරු ඉබේ ම හැඳී පෙරවී පාත්‍රයක් ද අතැතිව පැවිදි උපසම්පදාව හිමිවීමයි.



- බුදු රජාණන් වහන්සේ ප්‍රථම වස් කාලය ඉසිපතනයෙහි ගත කරමින් අනෙක් තවුසන් සතර දෙනාට මේ ධර්මය පැහැදිලි කරමින් ධර්මය දේශනා කළ සේක.
- මේ කාලය තුළ සයදෙනා වහන්සේ පිණ්ඩපාතයෙන් යැපුණහ.
- අනෙකුත් තවුසන් සිව් දෙනාද පිළිවෙලින් සොවාන්ව, ඒහි භික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි උපසම්පදාව ලැබීය.

    - ඇසළ පොහෝ දිනට පසු දින - වප්ප තවුසා
    - දෙවනි දින - භද්දිය තවුසා
    - තුන්වන දින - මහනාම තවුසා
    - සිව්වැනි දින - අස්සජී තවුසා

## අනත්තලක්ඛණ සූත්‍ර දේශනාව

- ඇසළ පෝය එළැඹී පස්වන දින බුදුරජාණන් වහන්සේ පස්වග භික්ෂූන් වහන්සේලාට අනත්තලක්ඛණ සූත්‍රය දේශනා කළ සේක.
- ඒ දේශනාව අසා පස්වග භිෂුන් වහන්සේලා උතුම් අර්හත්වයට පත් විය.
- ඒ ගෞතම බුද්ධ ශාසනයේ ප්‍රථම රහතන් වහන්සේලා පිරිසයි.

## දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවේ වැදගත්කම

- අවිද්‍යාවෙන් වැසී ගිය බඹුන් සහිත ලෝක සත්ත්වයාට ලෝකයේ පැවැත්මත්, එය ඇති කරන හේතු, ලොව නැවැත්ම හා එය කරා යන මාර්ගය නම් වූ ශ්‍රේෂ්ඨ දර්ශනයක් විවෘත වීම.
- එය වනයෙන් වැසී ගිය නටබුන් නගරයක් නැවත සොයා ගත්තා වැනිය.
- ආර්ය පර්යේෂණය තුළින් පළමුව තමන් වහන්සේ විසින්ම මේ ධර්මය ප්‍රත්‍යක්ෂ කොට ලෝක සත්වයාට සසරින් මිදීම පිණිස දේශනා කළ සේක.
- එතෙක් පහළවී සිටි කිසිදු ආගමික ශාස්තෘවරයෙක් මේ මධ්‍යම ප්‍රතිපදා දහම ගැන දැන සිටියේ නැත.
- එබැවින් එය " පුබ්බේ අනනුස්සුතේසු ධම්මෙසු", පෙර නොඇසූ විරූ දහමක් ලෙස හඳුන්වා තිබේ.
- මේ සූත්‍රය බෞද්ධ දර්ශනයේ මූලික හරය ලෙස හැඳින්විය හැක.

## ප්‍රථම රහත් හැටනම



- බරණැස් සිටුතුමාගේ පුත් **යස**, ගිහි ජීවිතය පිළිබඳව කලකිරී දහම් අසා බුදු සසුනේ පැවිදිවිය.
- ඔහුගේ සමීප මිතුරන් සතර දෙනා: **විමල, සුබාහු, පුණ්ණජී, ගවම්පති** යන සතර දෙනා දහම් අසා පැවිදිව උපසම්පදාව ලැබ උතුම් අර්හත්වයට පත් වූහ.
- මේ ආරංචිය ලද යස කුල පුත්‍රයාගේ තවත් මිතුරන් 54 දෙනෙක් ශාසනයේ පැවිදිව දහම් අසා උතුම් අර්හත්වය සාක්ෂාත් කළහ.

- බුද්ධවයෙන් මාස හයක් ගිය තැන එළැඹී ඉල්මස පුර පසළොස්වක පොහොය දින වන විට ශාසනයේ මහරහතන් වහන්සේලා හැට නමක් වූහ.

  - තම පුතු වූ යසකුල පුත්‍රයා සොයා පැමිණි **බරණැස් සිටුවරයා** දහම් අසා තෙරුවන් සරණ ගියේය.
  - එතුමා ගෞතම බුදු සසුනේ **තෙරුවණ් සරණ ගිය ප්‍රථම උපාසකයාය.**

- බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලාට දානය පිරිනැමීමට එතුමන්ගේ නිවසට ඇරයුම් කළේය.
- දානය අවසානයේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය අසා **යස කුල පුත්‍රයාගේ මව වූ සුජාතාවත් බිරිඳත්** තෙරුවන් සරණ ගියහ.
- උතුම් සෝවාන් ඵලයට පත්විය.
- ඒ දෙදෙනා බුද්ධ ශාසනයේ **ප්‍රථම තේවාචික උපාසිකාවෝ** වූහ.

# 9. ධර්ම ප්‍රචාරක කටයුතු සහ බුදුසසුනේ ව්‍යාප්තිය

## ප්‍රථම ධර්ම ප්‍රචාරය



- බුදුන් වහන්සේ විසින් ශාසනයේ ප්‍රථම රහත් සැට නම අමතා :

> “ චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දේවමනුස්සානං මා ඒකේන ද්වේ අගමිත්ථ…”
> (මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට වැඩ පිණිස, සුව පිණිස ගම් නියම් ගම්හි හැසිරෙව්. දෙදෙනෙක් එකමග නොයව්…)

- ප්‍රථම ධර්ම ප්‍රචාරයේදී බුදුන් වහන්සේ උරුවෙල් දනව්වේ සේනානි ගම බලා වැඩම කළ සේක.
- මෙය ලෝක ඉතිහාසයේ ජන සන්නිවේදනයේ සමාරම්භක අවස්ථාවයි.

## භද්දවග්ගිය කුමාරවරු

- බුදුන් කප්පාසික වනයේ වැඩ සිටින විට, සිය ආභරණ සොරාගත් වෛශ්‍යාවක් සොයමින් පැමිණි භද්දවග්ගිය කුමාරවරු බුදුන්ගෙන්:

  - “ ස්වාමීණි, මෙමගින් කතක් යනු දුටුවේදැයි” විමසූහ.

එවිට බුදුරදුන්:
  - “ දරුවනි, වඩා උතුම් වන්නේ අනුන් ගැන සෙවීමද, නැතහොත් තමන් ගැන සෙවීමද” විමසා ඔවුන්ට දහම් දෙසූසේක.
  - ‘ඒහි භික්ෂු ප්‍රවජ්ජා’ වෙන් ඔවුන් උපසම්පදා ලැබීය.

## තුන්බෑ ජටිලයන්

- උරුවෙල් දනව්වේදී තුන්බෑ ජටිලයන් වන උරුවෙල කාශ්‍යප (500ක් පිරිස සමග), නදී කාශ්‍යප (300ක් පිරිස සමග), ගයා කාශ්‍යප (200ක් පිරිස සමග) උපසම්පදාව ලබා ගත්හ.

- මෙහිදී බුදුන් විසින් ඍද්ධි ප්‍රාතිහාර්ය පැමද සිදුවිය.
- මොවුන් ගයා ශීර්ෂයේදී 'ආදිත්ත පරියාය සූත්‍රය' අසා අරහත්වය ලබාගත්හ.

## ලංකාගමනය

- බුදුරදුන්ගේ ප්‍රථම ලංකාගමනය : දුරුතු පොහෝ දින මහියංගනයේ මහානාග වනෝද්‍යානයේ යක්ෂයින් දමනය



## බිම්බිසාර රජු

- ලට්ඨිවන නම් ස්ථානයේදී බිම්බිසාර රජතුමා සෝවාන් විය.
- පසුව රජතුමා විසින් වේළුවනාරාමය බුදුරදුන්ට පූජා කළේය : ප්‍රථම ආරාම පූජාව
- බුදුරදුන් විසින් තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනාකොට රජතුමාගේ මියගිය ඥාති ප්‍රේත සමූහයට පින් ලබා දීම.

## කෝලිත හා උපතිස්ස පැවිදි වීම



- රජගහනුවර කෝලිත ගම්හි ප්‍රධාන බමුණු පුතු : කෝලිත
- උපතිස්ස ගම ප්‍රධාන බමුණු පුතු : උපතිස්ස
- ගිරග්ග සමජ්ජ උත්සවයෙන් පසු ජීවිතයේ හරය සෙවීමට සංජය පරිබ්‍රාජකයා වෙත ගොස් පැවිදි විය.

- පසුව අස්සජි තෙරුන් දුටු උපතිස්සයෝ :
- " ස්වාමීනි ඔබ වහන්සේගේ ගමන බිමන අතිශයින් ශාන්තය, සංවරය, ඉරියව් ප්‍රසන්නය, ඔබවහන්සේ කවුරුන් උදෙසා පැවිදි වූයේ ද? ශාස්තෘවරයා කවරෙක්ද? හෙතෙම කිනම් වාදියෙක් දැයි පහදා දෙනු මැනවි" විමසීය.

- අස්සජි තෙරණුවෝ :
- " සබඳ මම අලුත පැවිදි වූයෙමි. ධර්මය විස්තර වශයෙන් කියන්නට මට නොහැකිය. එහෙත් මගේ ශාස්තෲවරයාණන් හා දහම මෙසේ යැයි කියමින්, යේ ධම්මා හේතුප්පභවා..." ගාථාව වදාළහ

- කෝලිතයන්ද, සංජය හැර ඔහුගේ 250ක් වූ පිරිස ද සමග උපතිස්සයෝ බුදුරදුන් හමුවට ගොස් උපසම්පදාව ලැබීය.
- කෝලිතයෝ මොග්ගලී බැමිණියගේ පුත්‍රයා වූ බැවින් මොග්ගල්ලාන/ මුගලන් නම් විය.
- උපතිස්සයෝ රූපසාරී බැමිණියගේ පුත්‍රයා වූ බැවින් සාරිපුත්‍ර / සැරියුත් නම් විය.
- මුගලන් තෙරණුවෝ ප්‍රථමයෙන් ද උපතිස්ස තෙරණුවෝ "වේදනා පරිග්ගහ" සූත්‍රය අසා දෙවනුවද රහත් වූහ.

## කිඹුල්වතට වැඩම වීම

- සුද්ධෝදන රජතුමා විසින් බුදුරජාණන් වහන්සේ වැඩමවාගෙන එන ලෙස යැවූ කාළුදායි ඇමැතිවරයා, රහත්භව ලබාගත් පසු දිනෙක,

අඞ්ගාරිනොදානි දුමා හදන්තේ
ඵලෙසිනො ඡදනං විප්පහාය
තෙ අච්චිමන්තොව පභාසයන්ති
සමයෝ මහාවීර භගිරථීනං
බුදුරදුන්ට දේශනා කළහ.

- මේ වන විට බුදු සසුන තුළ,



- ප්‍රථම රහත් 60 නම
- භද්‍දවග්ගිය භික්ෂූන් 30 නම
- ජටිල භික්ෂූන් 1003
- සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ සමග පිරිස 252
- අංග මගධ දෙරටින් පැවිදි වූ 10000
- කිඹුල්වතින් දස වරකට පැමිණ පැවිදි වූ 10010 ලෙස භික්ෂු පිරිස 21355

- මෙහිදී බුදුරදුන් ඇතුළු භික්ෂු පිරිස නිග්‍රෝධාරාමයේ වැඩ සිටියහ.
- ශාක්‍යයන්ගේ මානය බිඳ හෙළීමට දෙවන වර යමාමහ පෙළහර දැක්වීම.
- සුද්ධෝදන රජතුමාගේ තුන්වෙනි වැඳුම
- බුදුන් විසින් ශාක්‍යයන්ට වෙස්සන්තර ජාතකය දේශනා කිරීම.
- ගෝධික, සුබාහු, වල්ලිය උත්තිය යන මල්ල රජවරුන්ගේ දරුවන් සතර දෙනා පැවිදි වීම.

## කිඹුල්වත්පුර පිඬු සිඟා යෑම

- බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා වැඩීම දුටු යශෝධරාවන් ඒ පිළිබඳව සුදෝවුන් රජතුමාට දැන්වූහ.

- රජු විසින් සිය වංශයේ කිසිවෙකු පිඬු සිඟා ගොස් නැති බවත් රාජවංශයට අවමන් නොකරන ලෙසත් බුදුරදුන්ගෙන් ආයාචනා කළේය.
- බුදුරදුන් විසින් තම වංශය බුදුවරුන්ගේ වංශය බවත්, පිඬුසිඟා යාම එහි පුරාතන සිරිතක් බවත් රජුට පැහැදිලි කළහ.

## පිය රජුට දහම් දෙසීම

- බුදුන් විසින් රජ ගෙදර පිරිසට "ධම්මං චරේ සුචරිතං..." ගාථාව දේශනා කළ අතර සුදොවුන් රජතුමා සකෘදාගාමී වී මහා ප්‍රජාපතී ගෝතමිය සෝවාන් විය.
- යශෝධරාවගේ මාලිගයේදී "චන්ද කින්නර ජාතකය" දේශනා කළ සේක.
- නන්ද කුමරුගේ රාජාභිෂේකයත් ජනපද කල්‍යාණිය සමඟ ඔහුගේ විවාහයටත් පෙර දින කුමරුන්ව පැවිදි කළ සේක. (කිඹුල්වත් පුරයට වැඩම වීමෙන් තෙවැනි දිනය)
- රාහුල කුමරුද පැවිදි කර වූ සේක.(කිඹුල්වතට වැඩම වීමෙන් සත්වන දිනය)
- මෙලෙස සියලු කුමාරවරුන්ගේ පැවිදි වීමෙන් සංවේගයට පත් සුද්ධෝදන රජතුමා දෙමාපියන්ගෙන් නොවීමසා දරුවන් පැවිදි නොකරන්නැයි ඉල්ලා සිටියේය.
- පසුදින මහා ධර්මපාල ජාතකය අසා රජතුමා අනාගාමී ඵලයට පත් විය.

# 10. බුදු සසුනේ ශීඝ්‍ර ව්‍යාප්තිය

- මල්ල රට  අනුපිය අඹ වනයේ දී භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත යන ශාක්‍ය කුමාරවරුන් හා උපාලි කපුවාණන් බුදුරදුන් වෙත පැවිදි වූහ.
- මහාලි ලිච්ඡවී රජුගේ ආරාධනයෙන් විශාලා නුවරට වැඩම කළ බුදුරජාණන් වහන්සේ රතන සූත්‍රය දේශනා කොට, අනඳ තෙරුන් ලවා නගරය වටා පිරිත් පැන් ඉස, එහි රෝග, දුර්භික්ෂ, අමනුෂ්‍ය යන තුන්බිය දුර කිරීම
- එහි ප්‍රධාන මල්කරු වූ සුමන, තෙරුවන් සරණ යෑම.




- කිඹුල්වතදී අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන්ගෙන් බණ අසා පුණ්ණ මන්තානි පුත්ත තෙරණුවෝ රහත් වීම.උන්වහන්සේගෙන් බණ අසා කිඹුල්වත්පුර කුල පුත්‍රයෝ පන්සීයයක් රහත් වූහ.
- සුප්‍රකට ජම්බුකආජීවක තෙමේ පැවිදි වීම.

## සුදත්ත සිටුවරයා

- ජේතනම් කුමාරයාගේ උද්‍යානය මිලට ගෙන ජේතවනාරාමය ඉදිකර බුද්ධ ශාසනයට පූජා කිරීම.
- සිය නිවස ද සංඝයාට දන්හලක් ලෙස පිළියෙල කිරීම.
- නිරන්තරයෙන් දන්දුන් හෙයින් "**අනේපිඬු**" නාමයෙන් හැඳින්වීම.
- පුතු කලා ද, කණිටු දියණිය සුමනා ද සැදැහැවතුන්  වීම.
- බුද්ධ ශාසනයේ අග්‍ර දායක තනතුර ලැබීම.
- ජේතවනාරාමය භික්ෂු ශාසනයේ ප්‍රධානතම මධ්‍යස්ථානය වීම.
- ආගමන්ධ සූත්‍රය ඇසූ ආගමන්ධ ඍෂිවරයා හා පිරිස රහත්වීම.
- පුණ්ණමන්තානි පුත්ත තෙරණුවෝ හා සැරියුත් තෙරුන් අතර සාකච්ඡාවෙන් සප්ත විශුද්ධි ක්‍රමය විස්තර වීම. (එය රථවිනීත සූත්‍රය වශයෙන් මජ්ඣිම නිකායේ සඳහන් වේ)
- බුදුන් විසින් දෙවියන්ට මංගල සූත්‍රය දේශනා කිරීම.

- බිම්බිසාර රජු විසින් තෙරුවන් ගුණ වර්ණනා කර පුක්කුසාති නම් මල්ල රජු වෙත යැවූ හසුනට පැහැදී පැමිණි රජුට බුදුරදුන් කුඹල් හලක මුණගැසීම.
- තව ද බිම්බිසාර රජ විසින් සෝවීර රට රෞරව පුරයෙහි තිස්ස කුමරුට යැවූ රන්පතට පැහැදී පැමිණි කුමරුට සප්ප සොණ්ඩික නම් ස්ථානයේ දී බුදුරදුන් හමුවීම.

- රජගහනුවර ප්‍රකට ක්‍රීඩා ශූරයකු වූ උග්ගසේන සිටුවරයා පැවිදි වීම.

- බුදුරදුන් විසින් කසල ශෝධකයකු වූ සුනීතව පැවිදි කරවීම. (බුද්ධත්වයෙන් සිව්වෙනි වසර)



- සිය සුළු පියා විසින් සොහොනක මිනියට තබා බැඳ තබා සිටි, රජගහනුවර චණ්ඩාලයකුට දාව උපන් සෝපාක ව පැවිදි කරවීම.
- "එක නාම කිං" ආදී සාමනේර ප්‍රශ්න විසඳු උන් වහන්සේ සත්වන වියේ දී ම රහත් වූහ.



# 11. මෙහෙණි සස්න පිහිටුවීම

## 4 වන වස ඉක්ම ගිය පසු

- බුදුරජාණන් වහන්සේ **ශාක්‍ය - කෝලිය** යුද්ධය සංසිඳ වීමට රෝහිණී නදී තෙරට වැඩම කර **"අත්ත දණ්ඩ" සූත්‍රය** දේශනා කොට දෙපාර්ශවයේ කෝපය සංසිඳවීම.

- **එන්දන, දද්දභ, ලටුකික, වට්ටක** යන ජාතක ධර්මයන් වදාරා ඔවුන් පැවිදි කළ සේක.

- එහිදී **කුණාල ජාතකය** දෙසූ විට එහි ළාබාලම භික්ෂුව සෝවාන් වීම හා සෙස්සෝ සකෘදාගාමී වීම. මෙහිදී " **උසභ** " ශාක්‍ය කුමාරයා හා " **නිසභ**" නම් කෝලිය පුත්‍රයා ද සුද්දෝධන රජුගේ පුරෝහිතගේ පුතු **"සප්පදාස"** කුමරු ද තවත් බොහෝ දෙනෙක් ද පැවිදි වීම.

- ඔවුන් සියල්ලන් රහත් වූ මොහොතේ, දෙව් බඹුන් රැස් වූ අතර ඔවුනට **මහා සමය සූත්‍රය** දේශනා කිරීම.

- අනතුරුව බුදුරුවක් මවා සම ආසනයක හිඳ **සම්මාපරිබ්බාජනීය, පුරාභේද, කළහ විවාද, චූල වියුහ, තුවටක** යන සූත්‍ර දේශනා කිරීම.

## 5 වැනි වස



- විශාලාවේ කූඨාගාර ශාලා ආරාමයේ වැඩ විසීම.

- සුදොවුන් රජු අසාධ්‍ය වූ පසු එහි වැඩමවා දහම් දෙසූහ. දේශනාවසානයේ දී රහත් භාවය ලැබූ රජු 7 වැනි දින පිරිනිවන් පෑම.

- ශාක්‍ය කෝලිය යුද්ධය සංසිඳවීමේදී පැවිදි වූ කුමාරවරුන් ගේ භාර්යාවරුන් පන්සියයත් සමග වෛශාලියේ කූඨාගාර ශාලාව වෙත පැමිණි ප්‍රජාපතී ගෝතමියට පැවිද්ද ලබා දීම බුදුහු තෙවරක් ප්‍රතික්ෂේප කළත් ආනන්ද තෙරණුවන් මව් ගුණ වර්ණනා කරමින් නැවත නැවතත් ඉල්ලීම නිසා, අෂ්ට ගරු ධර්ම පනවා ඔවුන්ට පැවිදි උපසම්පදාව ලබා දී බුද්ධ ශාසනයේ කාන්තා පැවිද්ද ආරම්භ කිරීම. - **චුල්ලවග්ග වග්ග පාලියේ භික්ඛුණී ඛන්ධකය**

- මෙහිදී **"නන්දකෝවවාද සූත්‍රය"** අසා මෙහෙණිහු රහත් වූහ. යශෝධරාවෝ ද, නන්දාව ද ප්‍රජාපතී තෙරණිය වෙත පැමිණ පැවිදිව රහත්වූහ.

## **කොසොල් රජු බුදුරදුන් හමුවීම**

- තෙරුවන් සරණ ගිය පසේනදී කොසොල් රජතුමා බුදුරදුන්ට "**රාජකාරාම** " නම් විහාරයක් පූජා කිරීම. මෙහි දී " **සුමනා** " නම් වූ රජුගේ නැගණිය සෝවාන්ව පැවිදිඋපසම්පදාව ලැබීම.

## **දෙවන ලංකා ගමන**

- බුදුහු **චූලෝදර, මහෝදර,** නා රජුන් දෙදෙනාගේ යුද්ධය සංසිඳුවීමට **සමිද්ධි සුමන** දේවතාවා සමග ලක්දිව **මණිනාග දිවයිනට** වැඩම කර **කාකෝලූක, "එන්දන" ලටුකික, වට්ටක** යන ජාතක දේශනාවන් දෙසා දෙපිරිස සමගි කරවීම. නාගයෝ යුද්ධයට මුල් වූ මිණි පළඟ ( මැණික් පුටුව) බුදුරදුනට පූජා කළහ.

## **ප්‍රාතිහාර්ය දැක්වීම සහ අභිධර්මය දේශනා කිරීම**

- **6** වැනි වස **-** සැවත් නුවර වැඩ සිටීම.
- වස් අවසන රජගහනුවරට වැඩම කළ පසු, බිම්සර රජුගේ අග මෙහෙසියක **ඛේමාවෝ** බුදුරදුන් වෙත ගොස් පැවිදි වී **මහා නිදාන සූත්‍රය** අසා රහත් වීම **- දීඝ නිකාය**
- රජගහ නුවර සිටුවරයා , අහසින් වැඩ ඍද්ධි ප්‍රාතිහාර්යය දැක්වූ **පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ට** සඳුන් පාත්‍රයක් පූජා කළේය.
- මෙයින් පසු ලාභ ප්‍රයෝජන සඳහා ඍද්ධි ප්‍රාතිහාර්යය පෑම තහනම් කළ බුදුරදුන්ට තීර්ථකයෝ ප්‍රාතිහාර්යය පෑමට අභියෝග කළත් එම තහනම බුදුරදුනට බල නොපාති යි පැහැදිලි කරන ලදී.

## **තෙවන යමා මහ පෙළහර දැක්වීම**

- **ගණ්ඩම්බ රුක් මුල්හි** දී යමා මහ පෙළහර ඇතුලු විවිධ ඍද්ධි ප්‍රතිහාර්යයන් දැක්වීම.
- පසුව තවුතිසාවට වැඩම කර මාතෘ දිව්‍ය රාජයාට අභිධර්මය දේශනා කරමින් **7** වැනි වස එහි ගත කළ සේක.
- වස් අවසන තවුතිසාහි සිට **සංකස්සපුර** නගරද්වාරයට බුදුරදුන් වඩිනා තෙක් මහ පිරිස් රැස්ව සිටි අතර මෛත්‍රී බෝසත්හු එහිදී නියත විවරණ ලදහ. (අනාගත වංස දේශනාව )
- සංකස්ස පුරයෙන් **භග්ග** දේශයට වැඩම කර එහි **සුංසුමාරගිරි** පුරය අසල **භෙසකලා** වනයෙහි **8** වන වස විසීම
- **බෝධිරාජ කුමාරයා** කෝකනද නම් පහය වැඩ නිමවා, බුදුරදුන් එහි වඩමවා දන් පිරිනැමීය. එහිදී දෙසූ දහම ඇසීමෙන් හෙතෙම සෝවාන් විය.

## **පුණ්ණ තෙරුන් සුනාපරන්තයට වැඩමවීම**

- **සුප්පාරක පටුනින්** පැමිණි **පුණ්ණ** නම් වෙළෙන්දා බුදුරදුන් වෙත ගොස් පැවිදි වී **සුනාපරන්තයට** යෑමට අවසර ඉල්ලීය. පුණ්ණ තෙරණුවන්ගේ ඉවසීම ගැන දැන ගත් බුදුරදුහු එහි යාමට අවසර දුන්හ.
- සුනාපරන්තයෙහි **අම්බාටක** පර්වතයට වැඩම කළ පුණ්ණ තෙරණුවන් එය කමටහන් වැඩීමට සුදුසු ස්ථානයක් නොවූයෙන් **සමුද්‍රගිරි** වෙහෙරට වැඩම කළහ. පසුව **මාතුලගිරි විහාරයට** වැඩමවා එය ද සම්බාධ සහිත වූ හෙයින් **මකුලාරාම** විහාරයට පැමිණ රහත් වූහ.

- බාල සොහොයුරා කුණාටුවක් නිසා අනතුරට පත් වූ බව දැනගත් පුණ්ණ තෙරණුවෝ එහි වැඩමවා ආපසු පැමිණෙන්නට ආශිර්වාද කළහ.
- ආපසු පැමිණි සොහොයුරා රත්හඳුනින් විහාරයක් කරවා බුදුරදුන්ට පූජා කළේය. බුදුරදුන් සුනාපරන්තයට වැඩම කළ එම ගමනේදි **සච්චබද්ද** නම් ජටිලයා ද පැවිද්ද ලද්දේය.
- බුදුරජාණන් වහන්සේ නර්මදා නදීතෙර සහ සච්චබද්ධ පර්වත මස්තකයෙහි සිරි පා සටහන් තැබූ සේක.

## තෙවන හා අවසන් ලංකා ගමන

- බුද්ධත්වයෙන් **8වැනි වර්ෂයේදී** **මණිඅක්ඛික** නා රජුගේ ආරාධනයෙන් ලක්දිව කැලණියට වැඩම වීම.
- අනතුරුව **සුමන** දිව්‍ය රාජයාගේ ආරාධනයෙන් **සමන්තකූඨ** මස්තකයෙහි වම් සිරිපා සටහන තැබීම.
- රුහුණ, දීඝවාපිය හා අනුරපුර සිරිමහ බෝමැඩ පිහිටි ස්ථානය, මඟුල් මහසෑය හා අකුදා නිධන් කළ ස්ථානය සේල චෛත්‍ය ආදී ස්ථානයන්හි ද වැඩසිටීම.
- බුදුරදුන් ගැන ඇසූ කොසඹෑවෙහි **සෝෂිත, කුක්කුටා, පාවාරික** යන සිටුවරු තිදෙනා ද සැවතට පැමිණ බණ අසා සෝවාන් වූහ. ඔවුහු **සෝෂිතාරාමය ද, කුක්කුටාරාමය ද, පාවාරික අම්බවනය ද,** වශයෙන් විහාර කරවා බුදුරදුන්ට පූජා කළහ.
- **කම්මාස ධම්ම** නම් නියම් ගමදී පිඩු සිඟා වඩින බුදුරදුන් දුටු **මාගන්දියා බ්‍රාහ්මණයා** මේ පුද්ගලයා තම දියණියට විවාහ කර දීමට සිතා, දියණියද බැමිණිය ද සමග බුදුරදුන් හමුවිය. මිනිස් සිරුරෙහි යථාස්වභාවය පැහැදිලි කොට දහම් දෙසූ පසු මාපියෝ පැවිදිව විදසුන් වඩා රහත් වූහ. මාගන්දියා දියණිය බුදුහු කෙරෙහි වෛරයක් ඇති කර ගත්තාය.
- උදේනි රජුගේ ප්‍රධාන බිසවක් වූ මාගන්දියාගේ නින්දා අපහාස වලින් පීඩාවට පත් ආනන්ද තෙරණුවෝ නගරය අතහැර දැමීමට යෝජනා කළත්  බුදුරදුන් එය ඉවසමින් වැඩ වසද්දී සතියකින් එය සංසිඳීමට පත්විය.
- මාගන්දියා බුදුරදුන් කෙරෙහි භක්තියෙන් සිටි උදේනි රජුගේ තවත් බිසවක් වූ **සාමාවතියගේ** මාලිගාවට ගිනි තබා සාමාවතිය ඇතුලු පන්සියයක් කාන්තාවන් මරණයට පත් කරවීමෙන් ශෝකයට පත් උදේනි රජු මාගන්දියා ඇතුලු ඇගේ ඥාති පරපුරම විනාශ කර වූයේය.

**9 වැනි වැසි සමය** - සෝෂිතාරාමයේ විසූ සේක.

- මෙකල ධර්මධර භික්ෂුවක් හා විනයධර භික්ෂුවක් අතරේ ඇතිවූ මතභේදයක් මුල් කොට භික්ෂූහු භේද වූහ.
- බුදුහු ඔවුනට **ලටුකික, වට්ටක, දිඝිති කෝසල** යන ජාතක දේශනා කර සමගියේ වටිනාකම පැහැදිලි කළත් දෙපිරිස අවවාදයෙහි නොපිහිටියහ.

- හුදකලාවම **බාලකලෝණකාරාම** ගමට වැඩ එහි විසූ භගු තෙරුණට හුදකලාව විසීමේ අනුසස් වදාරා **ප්‍රාචීනවංශ මිගදායට** වැඩම කර වාසය කළ **අනුරුද්ධ, නන්දිය, කිම්බිල** යන තෙරුවරුනටද සමගිව විසීමේ අනුසස් වදාළ සේක.



- පසුව **පාරිලෙය්‍යය** වනයට වැඩම කොට **10 වැනි වස** එම වනයේ වාසය කළහ. එහි විසූ ඇතෙක් තුන් මස පුරා උපස්ථාන කළේය.

- දන් පහන් නොලැබ පීඩාවට පත් භික්ෂුවරයෝ කළහය බැහැරලා සමගි වූහ.

- අනේපිඬු විශාඛා ආදීන්ගේ ආරාධනා පණිවුඩ ගැන ඇසූ බුදුරජාණන් වහන්සේ ඇතුගේ අවසාන දානය ද වළඳා සැවත බලා පිටත් වූහ. ඇතු ශෝකයෙන් මිය ගොස් තවුතිසාවෙහි දිව්‍ය පුත්‍රයකුව උපන්නේය.

- බුදුහු සැවැත් නුවර ජේතවනාරාමයට වැඩම කළ පසු එහි පැමිණ සමාව ගත් කළහකාරී භික්ෂූන්ට **දීඝිති කෝසල ජාතකය** දේශනා කොට වදාළහ.

## සිව්රට සැලැස්මක්

- බුදුහු දක්ෂිණා ගිරිය බලා වැඩම කරන අතරමග මගධ ක්ෂේත්‍රයෙහි මහ නියර හා කුඩා නියර බැඳි ආකාරය භික්ෂු සිවුරට සකසා ගන්නා ලෙස දැනුම් දීම.

**11 වන වස** - දක්ෂිණාගිරියෙහි වැඩ විසීම. එහිදී කසීභාරද්වාජ නම් බ්‍රාහ්ණයකු තෙරුවන් සරණ යාම.

**12 වැනි වස් කාලය**

- බුදුහු වේරංජාවේ **නලේරු පුංචිමන්ද** නම් කොසඹ රුක මුල වූ දෙවොලට වැඩම කළහ. එහිදී වේරංජා වැසි උදය බ්‍රහ්මණයා වස් ආරාධනා කළත් සිවුපසයෙන් උපස්ථාන කිරීමට නොහැකි විය.
- **උත්තරාපථයේ** සිට ගමන් කළ අස් වෙළෙඳ කණ්ඩායමක් භික්ෂු සංඝයාට ධාන්‍ය පිදූහ. බුදුහු වස් අවසන බමුණාගේ නිවසෙහි පිළියෙළ කළ දන් වළඳා බරණැසට වැඩම කළහ.



- චණ්ඩපජ්ජොත රජුගේ පුරෝහිත **කාත්‍යායන** ද තවත් සත් දෙනෙකුද බුදුරදුන්ගෙන් දහම් අසා රහත්වූහ.
- උන්වහන්සේල කංචන වනයට වැඩි බව අසා රජු එහි ගොස්ව දහම් අසා ආරාමයක්ද පූජා කළේය.
- **මක්ඛිකාසණ්ඩ** නුවර චිත්‍ර ගෘහපතියා, **ධර්මග්‍රාමයෙහි සෘෂිදත්ත** වෙත තෙරුවන් ගුණ කියා යැවූ ලිපිය බලා සෘෂිදත්ත තෙමේ මහා කාත්‍යායන තෙරුන් වෙත පැමිණ පැවිදිව රහත් විය. **සොණකුටිකණ්ණ** සිටු පුත්‍රයා හා **කණ්ඩරායන** බ්‍රාහ්මණයා ඇතුලු නගරයේ බොහෝ දෙනෙක් පැවිදි විය.
- බුදුහු විශාලාවේ කූඨාගාර ශාලා විහාරයේ වැඩ වසන කල්හි **කලන්දගම කලන්ද** නම් සිටු පුත් සුදින්න මානවකයා පැවිදි උපසම්පදාව ලබා ගැනීම. පාරාජිකා පාලියේ ප්‍රථම ශික්ෂා පදය පැනවීමට හේතුවූයේ **සුදින්න** තෙරුන්ය.

**13 වැනි වස** - වාලිකා පර්වතයෙහි විසීම.

**14 වැනි වස** - සැවැත් නුවර ජේතවනාරාමයේ විසීම. එහිදී **මහාරාහුලෝවාද සූත්‍රය** අසා රාහුල තෙරණුවෝ රහත් වූහ.

**15 වන වස** - කිඹුල්වත නිග්‍රෝධාරාමයේ විසූහ. **නන්දීය** නම් ශාක්‍යයා එහිදී දහම් අසා පැහැදුණි. බුදුනට අවමන් කළ **සුප්‍රබුද්ධ** ශාක්‍යයා රජු පොළොවෙහි මිය ගියේය.



- වස් අවසන සැවැත්පුර ජේතවනාරාමයට වැඩි කල්හි පැමිණි ශක්‍රයාට ධර්මදානය, ධර්මරසය, ධර්මයෙහි ඇල්ම, තෘෂ්ණාක්ෂය, ශ්‍රේෂ්ඨ වන්නේ යැයි පැහැදිලි කළ සේක. සැම ධර්ම දානයකම අවසන ඔවුනට පින් දෙන්නැයි කළ ඉල්ලීමද බුදුහු පිළිගත්හ.
- **ආලවක යක්ෂයා** දමනය කළේ ද මෙම වර්ෂයේදීය. එහිදී බිලි පිණිස රැගෙන ආ ආලවිපුර රජුගේ පුතු අභය දානය ලැබූ අතර, අතින් අත මාරු වූ නිසා ඔහු **හත්ථාලවක** නමින් ප්‍රකට විය.

**16 වැනි වස** බුදුහු අලවුපුරයේම විසූ සේක.

**17 වැනි වස්කාලය** - රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ විසූහ.

## නගර ශෝභනී සිරිමාවගේ මරණය

- නගර ශෝභිනියක වූ සිරිමාව මිය ගිය පසු නගර වැසියන්ව ඇගේ සොහොනට කැඳ වූ බුදුහු රූපයෙහි අනිත්‍යභාවය පැහැදිලි කරමින් දහම් දෙසුහ.

- අලවි නුවර වාසීහු පිරිනැමූ දන් වළඳා අවසන, නැති වූ ගවයන් සොයා පැමිණි දිළිඳු ගොවියකුට බුදුහු දන් පිරිනැමූ පිරිස ලවා ආහාර දෙවා කුසගින්න සංසිඳ වූහ. දහම් ඇසූ ඔහු සෝවාන් විය.

**18 වන වස**- චාලිය පර්වතයෙහි විසීම.

- එහිදී පේශකාර දියණියකට දහම් දෙසූ සේක. ඇය දේශනාවසානයේ සෝවන් විය. ඇගේ මරණයෙන් ශෝකයට පත් ඇගේ පියා බුදුරදුන් හමුවී පැවිදි ව ස්වල්ප කලකින් රහත් විය.

# 12. බුදුසසුනේ ස්ථාවරත්වය සඳහා කටයුතු පිළියෙල කිරීම

- සම්බුද්ධත්වයෙන් විසිවැනි වර්ෂය බුද්ධ ශාසනයේ තවත් වැදගත් යුගයක ආරම්භයකි.
- ශාක්‍ය පුත්‍රීය ශ්‍රාවකයෝ චාරිකා යුගය වෙනුවට ආරාමීය භික්ෂු ජීවිතයකට පරිවර්තනය වීම.
- ආරාමවල විසීමෙහිදී හික්මිය යුතු ආකාරය බුදුරජාණන්වහන්සේ විසින් **"වත්"** යන විශේෂ විනය ශික්ෂා ක්‍රමය යටතේ කරුණු දක්වන ලදී.

## භික්ෂු ශාසනය තුළ විනය නීති පැනවීමට හේතු

1. **රත්තඤ්ඤ මහත්ත** (ආසනය ආරම්භ වී කල්ගත වී තිබීම)
2. **වෙපුල්ල මහත්ත** (ශාසනය නොයෙක් අයුරින් පැතිරී විපුලත්වයට පත් වීම. )
3. **ලාභග්ග මහත්ත** (ශාසනයට නොයෙක් ලාභයන් ලැබෙන්නට වීම හා ඒ පිළිබඳ ගැටලු ඇති වීම)
4. **බාහු සච්චමහත්ත** (ශාසනයේ උගතුන් බහුල වීම නිසා විවිධ මත පලවන්නට වීම )

- ප්‍රථම ශික්ෂාපදය - පළමු වැනි පාරාජිකා ශික්ෂාපදය
  හේතුව- **වජ්ජීරට** සිට **විශාලාවට** පැමිණි **සුදින්න** භික්ෂුව කළ වරද

- **නාගිත, නාගසමාලා, සුනක්ඛත්ත, සාගත** උපවාන, රාධ, **මේඝිය, චුන්ද** ආදී තෙරවරු බුදුරදුන්ට වරින්වර උපස්ථාන කළත් මේඝිය, වැනි ඇතැම් තෙරවරු බුදුරදුන් හැර ගියහ. විසිවැනි වස ඉක්මයත්ම නිත්‍ය උපස්ථායකයාණ කෙනෙකු අවශ්‍ය බව දැනුම් දුන් බුදුහු ආනන්ද තෙරණුවෝ බුද්ධ උපස්ථායක තනතුරට පත් කිරීම.



- 20 වන වස රජගහ නුවර වැඩ විසූ බුදුහු එතැන් සිට 44 වැනි වස් කාලය දක්වා සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ විසීම.

- **පූර්ණවර්ධන** සිටුවරයාගේ බිරිය වූ **විශාඛාව** තම මේල පළඳනාව විකුණා පූර්වාරාමය කරවා බුදුරජාණන් වහන්සේට පූජා කළාය. ඇය බුදු සසුනේ අග්‍ර දායිකා තනතුර ලැබුවාය. බුදුරජාණන් වහන්සේ වරින් වර ජේවතවනාරාමයේත් පූර්වාරාමයෙත් වැඩ විසූහ.

- බුදුහු භික්ෂු ශාසනය මහ මුහුද මෙන් ආශ්චර්යය ධර්ම අටකින් යුක්ත යැයි පැහැදිලි කළහ.

1. මහ මුහුද ගොඩ සිට ක්‍රමයෙන් ගැඹුරු වේ. එසේ බුද්ධ ශාසනයෙහිත් ක්‍රමයෙන් ශික්ෂා හා ප්‍රතිපදා අනුගමනය කළ යුතු වේ. පැවිදි වූ කෙනෙහිම නිවන ලැබීම අපහසුය.
2. මහා සාගරය වෙරළ නොයික්මවයි. එසේම සැබෑ භික්ෂුවරයාණෝ බුදුරදුන් පැන වූ විනය ශික්ෂා නොයික්මවයි.
3. කිසිදු කුණු කසලක් මුහුදේ නොරැඳෙයි. භික්ෂු ශාසනයේද දුසිල් භික්ෂුවකට විසිය නොහැක.
4. නොයෙක් නදීන්ගෙන් ජලය සාගරයට එන විට එකම මහා සාගරයම වන්නා සේ විවිධ කුල ගෝත්‍ර වලින් සසුනට ඇතුළත් වුවද එකම **"අරියසාවක"** හෙවත් **"ශ්‍රමණ ශාක්‍යපුත්‍රිය"** වෙති.
5. සාගරයේ ජලය අඩු වැඩි වීමක් නොවන සේ බුද්ධ ශාසනයේත් කොපමණ රහතුන් පිරිනිවියත්, නිවනෙහි අඩුවක් නොවීම.
6. සාගරය එකම ලවණ රසයෙන් යුක්තය. බුද්ධ ශාසනයද එකම විමුක්ති රසයෙන් යුක්තය.
7. සාගර පත්ලෙහි මුතු මැණික් ඇත. බුද්ධ ශාසනයේ සත්තිස් බෝධිපාක්ෂික ධර්ම නැමැති රත්නයෝ වෙති.

8. සාගරයෙහි මහා මත්ස්‍ය ආදී සත්ව වර්ගයෝ වෙති. බුද්ධ ශාසනයෙහි සැරියුත් මුගලන් ආදී උදාර පුද්ගලයෝ වෙති.

- මින් ඉදිරියට තමන් වහන්සේ භික්ෂු සංඝයා සමග පාමොක් උදෙසීම හෝ පොහොය කර්ම කිරීම නොකරන බවත්, භික්ෂූන් එකතුව එය කළ යුතු බවත් වදාරා "**ආඥාප්‍රාතිමෝක්ෂය**" පනවා වදාළහ. - **චුල්ලවග්ග පාලිය**



- බුදුරදුන් විහාරයේ නැති විට වැඳ පුදාගැනීමට ආනන්ද තෙරුන්ගේ මෙහෙයවීමෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් සැවැත් නුවර ජේතවන භූමියෙහි රෝපණය කරන ලදී. පාරිභෝගික චෛත්‍යයක් ලෙස සලකන එය "ආනන්ද බෝධිය" නමින් ප්‍රකට විය.

- **අංගුලිමාල** නම් දරුණු මිනීමරුවකු බවට පත් වූ **භග්ග** නම් පුරෝහිත බමුණා හා **මන්තාණි** බැමිණියගේ පුත් "**අහිංසක**", දමනය කිරීම,
- ජීවක වෛද්‍යවරයා විසින් ස්වකීය අඹ වනය බුදුනට පිදීම,
- අනේපිඩු සිටුහුගේ දියණියක් වූ සැදැහැති **චූලසුභද්‍රාවෝ** විවාහ වී සිටි **උග්ග නගරයේ** සිටුවරයා සැදැහැවතියෙකු බවට පත් කිරීමද, මෙකල සිදු විය.

- කොසොල් රජු සිය බිසවක වූ මල්ලිකා දේවියගේ අනුශාසනා පරිදි සියල්ලෙන් පිරිපුන් මහා දානයක් බුදුරදුන් ප්‍රමුඛ පන්සියයක් භික්ෂු සංඝයාට පිරිනමන ලදී. - " **මහා අසදෘස දානය** "

- බුද්ධ ශාසනය දියුණුවට පත්වීමෙන් අන්‍ය තීර්ථකයෝ ලාභ සත්කාරයෙන් පිරිහී ගිය අතර, ඔවුහු බුදුන් කෙරෙහි පැවැති ප්‍රසාදය නැති කිරීමට කටයුතු කළහ. ඔවුහු සුන්දරී නම් පරිබ්‍රාජිකාව විහාරයට යවා, රහසේ ඇය මරවා ජේතවන භූමියෙහි මළ සිරුර සඟවා ශ්‍රමණ ගෞතමයන් හා ශ්‍රාවකයන් විසින් එය කල බව ප්‍රචාරය කරවූහ.එය තීර්ථකයන්ගේ උපක්‍රමයක් බව හෙළිවීමෙන් පසු නගර වැසියන්ට බුදුරදුන් කෙරෙහි ගෞරවය වැඩි විය.

- දෙව්දත් තෙර **අජාසත්** කුමරු ලවා බිම්සර රජු මරවා මගධ රාජ්‍යය තහවුරු කර ගන්නට ඔහුව පෙළඹ විය.
- භික්ෂු ශාසනයේ ද භේද ඇති කරවා බුදුරදුන්ගේ ජීවිතය විනාශ කිරීමට ද කටයුතු කර අවසානයේ ඔහු පඤ්ච යාචනයක් ඉදිරිපත් කළේය. එනම්

(1) භික්ෂූන් වහන්සේ, ජීවිතාන්තය තෙක් ආරාණ්‍යවාසි විය යුතුය.
(2) පිණ්ඩපාතික විය යුතුය
(3) පාංශුකූලික විය යුතුය
(4) වෘක්ෂ මූලික විය යුතුය
(5) මත්ස්‍ය මාංශයෙන් වැළකිය යුතුය.

- මෙම කරුණු බුදුරදුන් අනුමත නොකිරීමත් සමග **කෝකාලික, කටමෝර තිස්සක, සමුද්ද දත්ත** යන භික්ෂූන් හා **චුල්ලනන්දා** නම් භික්ෂුණිය ද සමග නවක භික්ෂූන් පන්සියයක් ද සමග **ගයා ශීර්ෂයෙහි** ආරාමයකට ගියේය.

දෙව්දතුවෝ සිදු කළ ආනන්තරීය අකුසල කර්ම
- සංඝ භේදය
- බුදුරදුන්ගේ සිරුරේ ලේ සෙලවීම



- ඔහු කලක් රෝගීව සිට ජීවිතාවසානයට පෙර බුදුරදුන් දැකීමට ජේතවනාරාමය යන අතරතුර පොළොවෙහි ගිලී මිය ගියේය.

➢ පියා මැරීමෙන් පසු තැවූ අජාසත් රජු, **ජීවක කෝමාරභච්ච** වෛද්‍යවරයා සමග බුදුරදුන් වෙත ගොස් සමාව ගෙන ශාසනයට උපකාර කළේය. ප්‍රථම සංගායනාවටද අනුග්‍රහය දැක්විය. පියා මැරීම නිසා එම ජීවිතයේදී නිවන් දැකීමට නොහැකි විය.

## බුදුරදුන්ගෙන් පිහිට ලද විවිධ පුද්ගලයෝ

1. ගිනි දෙවියන් පිදූ **සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණයාට** යාගයෙහි එන කරුණු හා මධ්‍යම ප්‍රතිපදාවෙහි ඇතුළත් කරුණු සසඳමින් දහම්දෙසීම. බමුණා පැවිදිව ටික කලකින්ම රහත් වූයේය.
2. **කුඹුරු ගොවිතැන් කළ බමුණා -** මහා වර්ෂාවකින් කුඹුර විනාශ වීම ගැන ශෝකයට පත් වූ අචිරවතී නදී තෙර විසූ බ්‍රාහ්මණයෙකුට ශෝකයට හේතුව තෘෂ්ණාව බවත් වදාරා දහම් දෙසීම. බමුණා සෝවාන් විය.
3. නොකළ සොරකමට අසු වූ **ගොවියෙකුගේ ජීවිතය බේරා ගැනීම.** සිද්ධිය මුල් කොට දෙසූ දහම අසා ගොවියා සෝවාන් වූයේය.



4. දෙව්දතුන් විසින් බැහැර කරන ලද **කුමාර කාශ්‍යප මාතාවගේ** නිවැරදි භාවය හෙළි කර ඇයගේ පුත්, කුමාර කාශ්‍යපයන්ද පැවිදි කරවා රහත් වීමට මඟ පෙන්වීම
5. පුතු මළ සොවින් සිහි විකල්ව සිටි **කිසාගෝතමියට** පිහිට වීම. පැවිදි වූ ඇය නොබෝ කලකින්ම රහත් විය.
6. සිහි විකලව සිටි **පටාචාරාව** සුවපත් කිරීම. පැවිද්ද ලැබූ ඇයද රහත් බව ලබා ගත්තාය.
7. **ගැරඬියකුට හිරිහැර කළ ළමා පිරිසක්** හිංසාවෙන් වළකා සෝවාන් වන්නට මඟ පෙන්වීම
8. දරුවන් විසින් නොසළකා හැරි සැවැත් නුවර **අසරණ මහලු පියෙකුට** පිහිට වීම.
9. පුතු මළ සොවින් සිහි විකල්ව සිටි **වාශිෂ්ඨ** නම් කාන්තාවට පිහිටවීම.
10. **පූතිගත්ත තිස්ස තෙරුන්** සුවපත් කොට රහත් වීමටද පිළිසරණ වීම.
11. **කුෂ රුදාවකින් පෙළුනු භික්ෂුවකට** ද උපස්ථාන කොට සුවපත් කිරීම
12. **පෙර ජීවිතයක මාපියන් හමුවීම.** ඔවුහු සංසයා වෙතින් දහම් අසා නිවන් අවබෝධ කොට පිරිනිවන් පෑහ.
13. **ඡත්ත මානවක** නම් බමුණු පුත්‍රයෙක්ට මරණයට වැළැක්විය නොහැකි අකුසලයක් ඇති බව දැන ගෙන පරලොව සුගතිගාමී කිරීමට මග පෑදීම
14. මරණාසන්නව සිටි **අදින්න පුබ්බක** නම් මසුරු බමුණාගේ පුත් **මට්ටකුණ්ඩලීට** පිහිටවීම. හේ මරණින් මතු දෙව් පුතකුව උපන්නේය.



## කොසොල් රජුගේ මරණය

- තම පුත්, **විඩූඩභ දීඝකාරායනගේ** සහායෙන් රාජ්‍ය බලය අල්ලා ගත් පසු රාජ්‍යය අහිමිව තනි වූ කොසොල් රජතුමා සිය බෑණනුවන් වූ අජාසත් සොයා මගධයට යන අතරමග මිය ගියේය.
- රාජ්‍යත්වය ලද විඩූඩභ ශාක්‍යයන් සමූල ඝාතනය කොට **අචිරවතී නදී** තෙර ලැගුම් ගෙන සිටියදී අකාල ගංවතුරකට හසුව පිරිස සමග මිය ගියේය.
- බුදුහු **මෙදතලුම්ප** ගමින් නික්ම **ගිජුකුළු පව්වට** වැඩම කළ කල්හි අජාසත් රජු **ලිච්ඡවි රාජ්‍යය** ආක්‍රමණයට පෙර බුදුරදුන් දැක්මට තම ප්‍රධාන අමාත්‍යවරුන් වන **සුනිධ, වස්සකාර**, යන දෙදෙනා බුදුරදුන් වෙත යැවීය.
- බුදුරදුහු ලිච්ඡවීන් සප්ත අපරිහානිය ධර්ම ආරක්ෂා කරන තාක් කිසිවකුටත් ඔවුන් ජයගත නොහැකි බව වදාළහ.

# 13. තථාගත ජීවිතයේ අවසාන සමය

## බුදුරජාණන් වහන්සේ අවසන් කාලයේ වැඩම කල ස්ථාන හා සිදු වූ විශේෂ සිදුවීම්

**1) පාටලී ග්‍රාමය -**

- නගරවැසියන් විසින් විහාරයක් පූජා කරන ලදී.
- සුනීධ වස්සකාර දෙදෙනා ඔවුන් විසින් ඉදි කල වෙළෙඳ නගරයේදී බුදුරදුන්ට දන් පිළිගැන්වීම හා බුදුරදුන් එම නගරයෙන් පිට වූ දොරටුව ගෞතම ද්වාරය ලෙසත් ගංගා නදියෙන් එතෙර වූ තොටට ගෞතම තිත්ථ ලෙසත් නම් යෙදීම.

**2) කෝටි ග්‍රාමය -**

- භික්ෂූන්ට සීල සමාධි ප්‍රඥා වැඩීමේ අනුහස් දේශනා කිරීම.

**3) ඥාතික ග්‍රාමය -**

- ජනවසභ සූත්‍රය දේශනා කිරීම.

**4) විසල් පුරය -**

- බුදුන් වහන්සේට ලෝහිත පක්ඛන්දිකා රෝගය වැළදීම.

**5) සැවැත් නුවර -**

- බුදුරදුන් සිව්මසකින් පිරිණිවන් පාන බව දැනගත් භික්ෂූන් ධර්ම සංවේග පල කිරීම. සැරියුත් තෙරණුවන් බුදු රදුන්ගෙන් පිරිනිවන් පෑමට අවසර ගෙන පිරිනිවන් පෑම. උන්වහන්සේගේ ධාතුන් චෛත්‍යයක තැන්පත් කර ඇත.

**6)රජගහනුවර -**

- මුගලන් තෙරණුවන් බුදුරදුන්ගෙන් අවසර ගෙන කාලසිලා වනයේදී පිරිනිවන් පෑම. උන්වහන්සේගේ ධාතුන් ද චෛත්‍යයක තැන්පත් කර ඇත.

**7)චාපාල චේතිය -**

- බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් හට ඡන්ද, චිත්ත, විරිය, විමංසා යන සතර ඍද්ධිපාද වැඩූ තැනැත්තෙක් සතු ආනිශංස පිළිබඳව දේශනා කිරීම.

**8) විසාලා නුවර කූටාගාරය -**

- බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් ලවා සංඝයා රැස් කර උන්වහන්සේ දෙසූ ධර්මය හකුළුවා දක්වමින් ධර්මය දේශනා කිරීම.

**9)භණ්ඩ ග්‍රාමය**

**10)හත්ථ ග්‍රාමය**

**11)අම්බ ග්‍රාමය**

**12)ජම්බු ග්‍රාමය**

**13) භෝග නගරය -**

- භික්ෂූන්ට සතර මහාපදේශයන් පැහැදිලි කිරීම.

**14) පාවා නුවර -**

- බුදුරජාණන් වහන්සේගේ චුන්ද කර්මාර පුත්‍රයාගේ අඹ උයනෙහි වැඩ සිට චුන්ද කර්මාර පුත්‍රයා විසින් පිළිගන්වන ලද සූකර මද්දව නම් විශේෂ ආහාරය වැළඳීම.

**15) බේලුව ග්‍රාමය -**

- බුදුරදුන් හට නැවතත් ලෝහිත පක්ඛන්දිකා රෝගය වැළඳීම.
  අතරමගදී බුදුරදුන්ට වෙහෙස දැනීම නිසා විවේක ගත් අවස්ථාවේ පුක්කුස මල්ලරජු දහම් අසා පැහැදී බුදුරදුන් හට මෙන්ම ආනන්ද තෙරණුවන් හටද රන් පැහැ වස්ත්‍ර පූජා කිරීම.

**16)කුසිනාරාව**

**17) කුකුත්ථා නදිය -**

- බුදුරජාණන් වහන්සේ ගඟට බැස නහා පැන් වළඳා නදීතෙර වනයට පිවිස චුන්ද තෙරුන් ලවා සඟල සිවුර පනවා එහි සැතපී ගත්හ.

**18) කුසිනාරාවේ මල්ල රජුගේ -**

- බුදුරජාණන් වහන්සේ උයනේ සල් ගස් 2ක් අතර ආසනයක උතුරට **උපවර්තක සල්උයන** හිසලා සිංහ සෙයාවෙන් සැතපීම. එහිදී සංවේග උපදවාගත් ස්ථාන 4ක් ලෙස බුදුරදුන් උපන් භූමිය , බුදුවූ ස්ථානය , දම්සක් දෙසූ ස්ථානය හා පිරිනිවන් පෑ ස්ථානය ලෙසත් බුදු, පසේ බුදු , මහරහතන් හා සක්විති යන පුද්ගලයන් ස්තූපාර්හ පුද්ගලයන් බවද දේශනා කිරීම.

පැවිදි බව ලබාගත් අවසාන ශ්‍රාවකයා
**සුභද්‍ර පිරිවැජියා**

## තථාගතයන් වහන්සේගේ අවසන් බුද්ධ වචනය

**හන්ථධානි භික්ඛවේ ආමන්තයාමි වෝ**
**වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ**

"මහණෙනි, මම ඔබ අමතමි, හේතු ප්‍රත්‍යයෙන් හටගත් සියලු සංස්කාර ධර්මයේ නැසෙන සුළු වෙති. එබැවින් අප්‍රමාදව කුසල් දහම් සම්පාදනය කරන්න"

- අනතුරුව ප්‍රථම ධ්‍යානයේ සිට චතුර්ථ ධ්‍යානය දක්වා පිලිවෙලින් වෙන වෙනම සමපත්තින්ට සමවැදී ඉන්නගිට ආකාසනඤ්චයතනය සමප්තියේ සිට ආකිඤ්චඤ්ඤයතනය දක්වා සමපත්තින්ට සමවැදුණු සේක.
- අනතුරුව නෙවසඤ්ඤායතනය දක්වා පිලිවෙලින් සමපත්තින්හි සමවැද, නැවත ප්‍රථම ධ්‍යානයේ සිට චතුර්ථ ධ්‍යානය දක්වා සමවැදී චතුර්ථ ධ්‍යානයෙන් නැගී පෙරදිගින් අරුණලු නැගෙද්දී බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ සේක.
- පුර පසළොස්වක පොහෝ දින පශ්චිම යාමයේ පරිනිර්වාණය සිදුවිය.
- භාග්‍යවතුන්ගේ ශ්‍රී දේහයට මල්ල රජ දරුවෙන් විසින් සත් දිනයක් පුරා පුද පූජා කරන ලදී.

- ශ්‍රී දේහය කපු පුළුනින් වෙලා රන් දෙනක තැන්පත් කොට මතුට දන්ධන නම් ස්ථානයේ සැදුන්දර සෑයක් ඉදිකර ආදාහන පූජෝත්සවය පැවැත්වූයේය.
  ධාතු බෙදා ගැනීමට නොසන්සුන් වූ රජවරු ද්‍රෝණ බමුණා විසින් සමාදාන කර ධාතූන් සමසේ බෙදා දුන්නේය.
- අජාසත්, ලිච්ඡවී, ශාක්‍ය , බුලි , කෝලිය, මල්ල හා මොරිය රජවරු එම ධාතූන් පෙරහරින් වැඩමවාගෙන ගොස් චෛතිය බැඳ ගෞරව කළහ.

## බුදුරජාණන් වහන්සේ වස් විසූ ස්ථාන

**1.** බරණැස ඉසිපතනය
**2.** රජගහනුවර වේළුවනය
**3.** රජගහනුවර වේළුවනය
**4.** රජගහනුවර වේළුවනය
**5.** විශාලා නුවර කූටාගාර ශාලා විහාරයේ
**6.** මකුළ පර්වතයේ
**7.** තව්තිසා දෙව්ලොව
**8.** භග්ග ප්‍රදේශයේ සුංසුමාර ගිරි පුරය අසල භේශ කල වනයේ
**9.** කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ
**10.** පරිලෙයක රක්ෂිත වනයේ
**11.** ඒකනාලා බමුණුගම
**12.** වේරංජා නුවර
**13.** චාලිය පර්වතයේ
**14.** සැවැත්නුවර ජේතවනාරාමයේ
**15.**කිඹුල්වත්පුර න්‍යග්‍රොධාරාමයේ
**16.** අලව්රට
**17.** රජගහපුර නගරයේ
**18.**චාලිය පර්වතයේ
**19.** එම ස්ථානයේම
**20.** රජගහනුවර නගරයේ
**21.** සිට **44** දක්වා සැවැත්නුවර අනේපිඬු සිටු පූජා කල ජේතවනාරාමයේ හා විශාඛාව පූජා කල පූර්වරමයේ විසූහ.

## භාග්‍යවතුන් වහන්සේගේ දෛනික දින චර්යාව

**1.**පෙරබත් කිස **-** පෙරවරු කාලය
**2.**පසුබත් කිස **-** දහවල් කාලයේ සිට හිරු බැස යනතෙක් කාලය
**3.**පෙරයම් කිස **-** රාත්‍රිය එළඹෙන කාලය
**4.**මදියම් කිස **-** මුළු මැදියම් කාලයම
**5.**පැසලුයම් කිස **-** රාත්‍රියේ පශ්චිම යාමය

## බුදුසසුනේ අග්‍රස්ථාන ලැබූ මහා තෙරුන් වහන්සේලා

**1.** චිරරාත්‍රඥයන් අතර **-** අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරණුවෝ
**2.** මහා ප්‍රාඥයන් අතර **-** සැරියුත් තෙරණුවෝ
**3.**ඍද්ධිමතුන් අතර **-** මුගලන් තෙරණුවෝ
**4.** ධූතවාදීන් අතර **-** මහාකස්සප තෙරනුවෝ
**5.** දිවැස් ඇත්තවුන් අතර **-** අනුරුද්ධ තෙරණුවෝ
**6.** උසස් කුලයෙහි උපන්නන් අතර **-** භද්දිය තෙරණුවෝ
**7.** මධුර ස්වර ඇත්තවුන් අතර **-** ලකුණ්ඨ භද්දිය තෙරණුවෝ
**8.** සිංහනාද කරන්නන් අතර **-** පින්ඩෝල භාරද්වාජ තෙරණුවෝ

9. ධර්ම කථිකයන් අතර - පුණ්ණ මන්තානිපුත්ත තෙරණුවෝ
10.කෙටියෙන් දෙසූ ධර්මය විස්තර කිරීමේ සමර්ථයන් අතර - මහා කච්චායන තෙරණුවෝ
11.මනෝමය රූප නිර්මාණයෙහි සමතුන් අතර - චූල්ල පන්ථක තෙරණුවෝ
12. අරූප ධ්‍යානයෙන් නැගිට රහත් වූවන් අතර - මහා පන්ථක තෙරණුවෝ
13. නොකිලිටි විහරණ ඇත්තන් අතර - සුභූති තෙරණුවෝ
14.දක්ෂිණාර්හයන් අතර - සුභූති තෙරණුවෝ
15.ආරණ්‍යකයන් අතර - ඛදිරවනිය රේවත තෙරණුවෝ
16. ධ්‍යානයෙහි ඇලුනවුන් අතර - කඩාබා රේවත තෙරණුවෝ
17. අරඹන ලද විර්යය ඇත්තවුන් අතර - සෝණ කෝළිවිය තෙරණුවෝ
18. මනාප කථා ඇත්තවුන් අතර - සෝණ කුටි කණ්ණ තෙරණුවෝ
19. ලාභීන් අතර - සීවලී තෙරණුවෝ
20. අධික ශ්‍රද්ධා අත්තවුන් අතර - වක්කලී තෙරණුවෝ
21.ශික්ෂාකාමීන් අතර - රාහුල තෙරණුවෝ
22. ශ්‍රද්ධාවෙන් පැවිදි වූවන් අතර - රට්ඨපාල තෙරණුවෝ
23. පළමුකොට සලාක ගන්නන් අතර - කුණ්ඩ ධාන තෙරණුවෝ
24.වැටහෙන නුවණ ඇත්තන් අතර - වංගීස තෙරණුවෝ
25.සියල්ලන් ප්‍රසාද එලවන සුළු අය අතර - උපසේන තෙරණුවෝ
26. සෙනසුන් පනවන්නන් අතර - දබ්බමල්ල තෙරණුවෝ
27. දෙවියන්ට ප්‍රිය වූවන් අතර -පිලින්ද වච්ඡ තෙරණුවෝ
28. මහා අභිඥා ලද්දන් අතර - බාහියදරුචිරිය තෙරණුවෝ
29. විචිත්‍ර කථිකයන් අතර - කුමාර කාශ්‍යප තෙරණුවෝ
30. සිවුපිළිසිඹියා පත්වූවන් අතර - මහා කොට්ඨිත තෙරණුවෝ
31. උපස්ථායකයන් , ධාරණ සමෘති ඇතියන්, භාග්‍යවතුන් වහන්සේ වදාළ තාක් එසේම දැන ගැන්මේ සමර්ථයන්, විර්යවන්තය අතර - ආනන්ද තෙරණුවෝ
32. මහපිරිස් ඇත්තවුන් අතර - උරුවෙල කාශ්‍යප තෙරණුවෝ
33. කුලයන් සසුනෙහි පහදන්නන් අතර - කාලුදායී තෙරණුවෝ
34. නිරෝගීන් අතර - බක්කුල තෙරණුවෝ
35. පූර්වේනිවානුස්මෘතිය ඇති අය අතර - සෝභිත තෙරණුවෝ
36. විනය ධරයන් අතර - උපාලි තෙරණුවෝ
37.මෙහෙණින්ට අවවාද කරන්නන් අතර - නන්දක තෙරණුවෝ
38. ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූවන් අතර - නන්ද තෙරණුවෝ
39. භික්ෂා අවවාදකයන් අතර - මහා කප්පින තෙරණුවෝ
40. තේජෝ ධාතු සමවතට සමවදනන් අතර - සාගත තෙරණුවෝ
41. ධර්ම දේශනය වැටහීමට ප්‍රත්‍ය වූ දුෂ්ටි සමුදාචාරාදිය ඇත්තවුන් අතර - රාධ තෙරණුවෝ
42. රුක්ෂ සිවුරු දරන්නන් අතර - මොසරාජ තෙරණුවෝ

## අග්‍රස්ථානලත් තෙරණිවරු

1. චිරරාත්‍රඥයන් අතර - ප්‍රජාපති ගෝතමී තෙරණිය
2. මහා නුවණැතියන් අතර - ඛේමා තෙරණිය
3.ඍද්ධිමතියන් අතර - උප්පලවන්නා තෙරණිය
4. විනය ධාරාවන් අතර - පටාචරා තෙරණිය
5.ධම්මකථිකාවන් අතර - ධම්මදින්නා තෙරණිය
6. ධ්‍යායිනින් අතර - නන්දා තෙරණිය
7. ආරබ්ද්ධ වියර්යාවන් අතර - සෝණා තෙරණිය
8.දිවැස් ඇත්තියන් අතර - සකුලා තෙරණිය
9. වහා ලත් අභිඥා ඇත්තියන් අතර - භද්දා කුණ්ඩල කේසා තෙරණිය
10. පෙර ජාති සිහිකරන්නියන් අතර - භද්දා කපිලානි තෙරණිය

11.මහා අභිඥා නුවන ලැබුවන් අතර - භද්ද කච්චායනා තෙරණිය
12. රුක්ෂ සිවුර දරන්නියන් අතර - කිසා ගෝතමී තෙරණිය
13. අධික ශ්‍රද්ධා ඇත්තියන් අතර - සිඟාල මාතා තෙරණිය

# 14. බුද්ධ චරිතයේ විශිෂ්ය ලක්ෂණ

- ලාභ- අලාභ- යස- අයස, නින්දා- ප්‍රසංශා සැප- දුක් යන අටලෝ දහමින් කම්පා නොවී සිටීම තාදී ගුණයයි.

## තාදී ගුණය පිළිබිඹු වන අවස්ථා

- අනේපිඬු හෙවත් **සුදත්ත** සිටුවරයා **ජේත** කුමරුගේ උද්‍යානය මිලට ගෙන පරිපූර්ණ මහා ජේතවනාරාමයක් තනවා පූජා කිරීම,**විශාකාව** තමාගේ මේල **පළඳනාව** විකුණා **පූර්වාරාමය** සාදවා පූජා කිරීම, **ඝෝෂිත,කුක්කුට,පාවාරික** ආදී සිටුවරු ආරාම තනවා පූජා කිරීම, **ජීවක,ද්‍රෝන හා උදේන** රජු ආදීන් ලොව අගනාම සළුපිලි පූජා කිරීම වැනි කිසිදු ලාභයක් හමුවේ උඩඟු නොවීම.
- මාරයාගේ උපක්‍රම නිසා පිණ්ඩපාතය නොලැබීම, වේරංජා ආදී වස් කාලවල සිවුපසය නොලැබීම වැනි අවස්තාවලදී අමනාප නොවීම.
- මාගන්දිය බිසව මැරවරයන් ලවා බුදුන්ට නින්දා කල අවස්ථාවේ නොසැලී සිටීම.
- තීර්ථකයන් විසින් සුන්දරිය මරවා එම වරද බුදුරදුන්ට පැටවූ අවස්ථාවේ එයට නොසැලී මුහුණ දීම.
- අක්කොසක භාරද්වාජ හා සුප්පබුද්ධ රජ වැනි අය බුදුරදුන්ට මුහුණටම දොස් කී අවස්තාවේදී පවා ඒවාට සිනා මුසු මුහුණින් ඉවසා සිටීම.

## අසරණයන්ට පිහිටවීම

**පැඤ්ඤා පාසාදමාරුය්හ - අසෝකෝ සොකිනිං පජං**
**පබ්බතට්ඨෝව භුම්මට්ඨෙ -ධීරෝ බාලේ අවෙක්ඛති**

"උස කඳු මුදුනකට නැගගත් පුද්ගලයා බිම සිටිනවුන් මැනවින් දකින්නාක් මෙන් ප්‍රඥාවේ උස් ප්‍රසාදයට නැග ගත් ශෝක රහිත වූ ප්‍රඥාවන්තයා ශෝකී වූ පෘථග්ජන අහිංසක බාල ජනයා දකින්නේ යැයි උන්වහන්සේ වරක් ප්‍රකාශ කළහ"

- රජ්ජුමාලා, සෝපාක, සුනීත වැනි අයට පිහිට වීම.
- දේවදත්තයන් විසින් පිටමන් කල කුමාර කාශ්‍යප මාතාව, භාද්‍රවතික ඇතින්න වැනි යට ජීවිත දානය ලබා දීම.
- ගිලනුන්ට උපස්ථාන කිරීම.
- පූතිගත්ත තෙරුනට පිහිට වීම.
- මහාවග්ග පාලියේ සඳහන් පරිදි උදරාබාධයකින් පෙළුණු භික්ෂු නමකට උවටැන් කිරීම.

## හික්මවිය යුත්තන් හික්මවීම

- පුරිස ධම්මසාරතී ගුණය - විශිෂ්ය ඥාන බල 10කින්ද අසමාන කාය බල 10කින්ද හෙබි තථාගත බුදුරජාණන් වහන්සේ කිසිවකුට ලංවීමට පවා නොහැකි භයානක දරුණු පුද්ගලයන් වෙත එළඹ ඔවුන් අහිංසක උපාසකවරුන් බවට පත් කිරීමට සමත් වීමේ ගුණය

- සුචිලෝම හා බරලෝම යක්ෂයන් දමනය කිරීම.
- **ආලවක** යක්ෂය දමනය කිරීම.
- **සච්චක** දමනය කිරීම.
- **සභිය** නම් පිරිවජය හික්මවීම.
- නිගණ්ඨනාථ පුත්තගේ ශ්‍රාවකයෙකු වූ **උපාලි ගෘහපතියාට** දහම් දෙස සෝවාන් කිරීම.

## ඉවසීමේ ගුණය

- **භාරද්වාජ** හා **අක්කෝසක** බමුණන්ගේ දෝෂාරෝපණ ඉවසා සිටීම.
- **චුල්ලතිස්ස** තෙරුන්ට ඉවසීමේ ගුණය දියුණු කිරීමට උපකාරී වීම.
- **අග්ගික භාරද්වාජ** බමුණාගේ දෝෂාරෝපණ ඉවසා සිට වාසල සූත්‍රය දේශනා කිරීම.
- **කසීභාරද්වාජ** බ්‍රාහ්මණයාගේ නින්දා අපහාස ඉවසා සිට ඔහුට දහම් දෙසීම.

**අහං නාගෝ ච සංගාමෙ - චාපතො පතිතං සරං**
**අතිවාක්‍යං තිතික්ඛිස්සං - දුස්සීලෝ හි බහුජ්ජානෝ**

"යුදට වන ඇතුන් සිවු දිගින් තමා කරා එන ඊසර පහර ඉවසමින් ඉදිරියට යන්නා සේ දුසිල් බොහෝ ජනයාගේ නින්දා අපහස ඉවසමින් ඉදිරියට ගමන් කරයි"

## අන්‍යමත ඉවසීමේ ගුණය

- සුද්ධෝදන රජුගේ ඉල්ලීම මත නැවත මාපිය අවසර නොමැතිව දරුවන් ශාසනයට බඳවා ගැනීම නොකළ යුතු බව තීරණය කිරීම.
- ආනන්ද තෙරණුවන්ගේ ඉල්ලීම මත කාන්තාවන්ට පැවිද්ද ලබා දීම පිලිබඳ සතුටු වීම .

# 15. බුදුරජාණන් වහන්සේ තුළ පිහිටි ලොව්තුරු මහා ගුණ විශේෂයෝ

## බුදුරජාණන් වහන්සේ මිනිස්බව ඉක්මවා ලෝකෝත්තර තලයෙහි පිහිටි උතුම් මනුෂ්‍යයෙක් බව

- උක්කට්ඨා නුවර හා සැවැත්නුවර අතරදී බුදුරජාණන් වහන්සේ සහ ද්‍රෝණ බමුණා අතර සිදුවූ සංවාදයෙන් පැහැදිලි වේ.
- මෙය **අංගුත්තර නිකායේ ද්‍රෝණ ලෝක සූත්‍රයේ** දැක්වේ.

## බුදුරදුන්ගේ නව අරහාදී ගුණ සමුදාය

- **දීඝ නිකාය කූඨදන්ත සූත්‍රයෙන්** හමුවේ.
- බුදුන් වහන්සේ මගධ දනව්වේ, ඛානුමත ග්‍රාමයේ 'අම්බලට්ඨිකා' උයනෙහි වැඩ වාසය කළහ.
- එහිදී බත්ත ඇමති කූඨදන්ත බ්‍රාහ්මණයා හට බුදුන් වහන්සේගේ නව අරහාදී ගුණ සමුදාය විස්තර කරන ලදි. ඒවානම්,

**භාග්‍යවතුන් වහන්සේ,**

1. සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූයේය. ( සො භගවා)
2. සියල්ලන්ගේ පූජාවට සුදුසුය. (අරහං)
3. මනාකොට තමන් වහන්සේ සියලු ධර්ම අවබෝධ කළ සේක. ( සම්මා සම්බුද්ධො)
4. අෂ්ඨ විද්‍යා, පසළොස් චරණ ධර්මයන්ගෙන් සම්පූර්ණයහ. ( විජ්ජාචරණ සම්පන්නෝ)
5. සොඳුරු ගමන් ඇත්තේය. ( සුගතෝ)
6. සියලු අයුරින් ලොව දැනගත් සේක. ( ලෝකවිදූ)
7. තමන් වහන්සේට වඩා ශ්‍රේෂ්ඨ වූ වෙනත් කෙනෙක් නැත්තේය. ( අනුත්තරෝ)
8. දමනය කටයුතු හෙවත් හික්මිය යුතු පුරුෂයන් දමනය කරගත්තේය. ( පුරිස ධම්ම සාරථී)
9. සියලු දෙවි මිනිසුනට අනුශාසනා කරන්නා වූ ශාස්තෘයහ. ( සත්ථා දේව මනුස්සානං)

- චතුරාර්‍ය සත්‍ය අවබෝධ කළ බැවින් භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ නම් වේ.
- බුදුරජාණන් වහන්සේ, සැරියුත් තෙරණුවෝ අමතා තථාගතයාණන් වහන්සේ තුළ විද්‍යාමාන විශිෂ්ට ඤාණ දර්ශනයන් පැහැදිලි කළ සේක.

එම උත්තර මානුෂික ගුණයන් අතර,

(1) නව අරහාදී බුදු ගුණයෙන් පිරුණු සර්වඥතාඥානය

(2) ඍද්ධි විධ ඥානය- එක පුද්ගලයා බොහෝ දෙනෙකු වීම,බොහෝ දෙනා එක් අයකු බවට පත් වීම, බිත්ති, පර්වත, ප්‍රකාර අතරින් නොගැටී ගමන් කිරීම, පක්ෂියෙකු මෙන් අහසෙහි යාම,දියෙහි මෙන් පොළවෙහිද,කිමිදීම වැනි ඍද්ධි ප්‍රාතිහාර්යන් පෑම.

(3) දිබ්බසෝත ඥානය - මිනිස් කණ ඉක්මවා සිටි පිරිසිදු දිව කනින් දෙවියන් හා මිනිසුන් පිළිබඳ වූ දේ ඇසිය හැකි බව,දුර වූද,සමීපයෙහි වූද විවිධ ශබ්දයන් ඇසිය හැකි බව.

(4) **චෙතො පරිය ඥානය -** අන්‍ය සත්වයන්ගේද, පුද්ගලයන්ගේද,සිත තම සිතින් පිරිසඳ දැනගන්නා නුවණ.

(5) **දසබල ඥානය -**

| | |
|---|---|
| 1. ඨානා ඨාන ඥානය | ➢ කාරණය කාරණය වශයෙන්ද, අකාරණය අකාරණය වශයෙන්ද ඇති සැටියෙන් දන්නා නුවණ. |
| 2. යථාභූත විපාකක ඥානය | ➢ අතීත,අනාගත,වර්තමාන යන කාලත්‍රයෙහි කර්මයන්ගේ විපාක ප්‍රත්‍ය වශයෙන්ද,ඇති සැටියෙන් දන්නා නුවණ. |
| 3. සබ්බත්ථ ගාමිණි පටිපදා ඥානය | ➢ සත්වයන් සියලු ගතිවලට යන්නා වූද,නොයන්නා වූද, මාර්ය ඇති සැටියෙන් දන්නා නුවණ. |
| 4. අනේක ධාතු නානා ලෝක ඥානය | ➢ බොහෝ ස්වභාව ධාතු ඇත්තා වූද,නොයෙක් ස්වභාව ධාතු ඇත්තා වූද ලෝකය ඇති සැටියෙන් දන්නා නුවණ. |
| 5. නානාවිමුක්තිකත්ව ඥානය | ➢ සත්වයන්ගේ නොයෙක් අදහස් (අධ්‍යාශ,අධිමුක්ති) ඇති බව ඇති සැටියෙන් දන්නා නුවණ. |
| 6. ඉන්ද්‍රීය පරෝපරියත්ත ඥානය | ➢ ඉන්ද්‍රියයන්හි තියුණු බව මුදු බව දන්නා නුවණ. |
| 7. ධ්‍යාන විමෝක්ෂ සමාධි සමාප්ති ඥානය | ➢ ධ්‍යානයන්ගේද,විමෝක්ෂයන්ගේද,සමාධීන්ගේ,<br>➢ සමාපත්තීන් ගේද කෙළෙසීම,පිරිසිදු බව නැඟීසිටීම ඇති සැටියෙන් දන්නා නුවණ. |
| 8. පුබ්බේනිවාසානුස්සති ඥානය | ➢ පෙර විසූ තැන් සිහි කරන්නාවූ නොයෙක් කල්පයන්හි විසූ තැන් සිහි කළ හැකි පූර්වේනිවාසානුස්මුරුතිය පිළිබඳ නුවණ. |
| 9. චුතිපටිසන්ධි ඥානය | ➢ සත්වයන්ගේ ච්‍යුති ප්‍රතිසන්ධි මැනවින් දන්නා නුවණ. |
| 10. ආසවකඛය ඥානය | ➢ කෙළෙස් නැති කිරීමෙන් කෙළෙස් රහිත වූ අර්හත් ඵලය තමාම දැක ප්‍රත්‍යක්ෂ කොටගෙන ඊට පැමිණ වාසය කරන්නෙමියි දන්නා නුවණ. |

(6) චතුර් වෛසාරද්‍ය ඥානය -

බුදුරදුන්,

1. "මම සම්‍යක් සම්බුද්ධයෙමි"
2. "මම ක්ෂීණශ්‍රවයෙමි"
3. "මේ ධර්මයෝ ස්වර්ග මෝක්ෂය දෙකට අන්තරාය කරයහ. මේ ධර්මයෝ අන්තරාය කර නොවෙති"
4. "මේ ධර්මයෝ නෛර්‍යාණික යැ"යි ප්‍රකාශ කළ විට එය එසේ නොවේයැයි" ප්‍රකාශ කිරීමට සමතෙකු නැත.

➢ මේ සතර ස්ථානයෙහි තම විශාරද භාවය සිහිකරන බුදුරජාණන් වහන්සේට උපදින සතුට පිළිබඳ ඥානය වේ.

(7) අෂ්ඨ පර්ෂද්හි අකම්ප්‍ය ඥානය -

1. ක්ෂත්‍රිය
2. බ්‍රාහ්මණ
3. ගෘහපති
4. ශ්‍රමණ
5. චාතුර්මහාරාජික
6. තව්තිසා
7. මාර
8. බ්‍රහ්ම යන අට පිරිස වෙතට පැමිණි කල්හි කිසිදු බියක්, තැති ගැන්මක් කිසිවිටකත් ඇති නොවීම.

(8) චතුර්යෝනි පරිච්ඡේදක ඥානය-

- අණ්ඩජ(බිත්තරයෙන්)
- ජලාබුජ (ගර්භකෝෂය තුළ)
- සංසේදජ(තෙත් ස්ථානවල)
- ඕපපාතික(ඉබේ ඉපදෙන)

මෙම සතර යෝනියන්හි උපදනා සත්වයන් ගැන මැනවින් දැකිය හැකි බව.

(9)පඤ්චගති පරිච්ඡේදක ඥානය-

1. නිරය
2. තිරිසන්
3. ප්‍රේත
4. මනුෂ්‍ය
5. දිව්‍ය

යන ගති පසෙහි උපත ලද සත්වයන් ගැනද නිවන ගැනද දැකීම වේ.

➢ බුදුරදුන් තුළ ඥාන බල දසයක් මෙන්ම කාය බල දසයක්ද වේ.

1. කාලවක
2. ගංගෙය්‍ය
3. පණ්ඩර
4. තාම්බ්‍ර
5. පිංගල
6. ගන්ධ
7. මංගල
8. හෙම
9. උපොසථ
10. ඡද්දන්ත යයි ඇත්කුළ දසයකි.

➢ මහා ශක්තියකින් යුත් ඡද්දන්ත ඇතුන් දස දෙනෙකුගේ ශක්තිය ඇති අසමාන කාය ශක්තියක් බුදුරජාණන් වහන්සේට හිමිය.

මේ හැර,

- තෙසැත්තෑ මහා ඥානයන්ගෙන්ද,
- විශිෂ්ඨ වූ ඥාන විලාසයන්ගෙන්ද,
- අලුයම් වේලේ ලොව බලා වදාරණ මහා කරුණා සමපත්තිය,
- යමක ප්‍රාතිහාර්ය පෑම

ආදී උත්තර මානුෂිය ගුණයන්ගෙන්ද යුක්ත වෙති.

➢ බුදුරදුන් අෂ්ඨ විද්‍යා ගුණයන්ගෙන් යුක්තය.ඒවානම්,

1. විදර්ශනා ඥානය
2. මනෝමය ඉද්ධි ඥානය
3. ඍද්ධි ඥානය
4. දිබ්බ සොත ඥානය
5. පරචිත්ත විජානන ඥානය
6. පුබ්බේනිවාසානුස්සති ඥානය
7. දිබ්බ චක්ඛු ඥානය
8. ආසවක්ඛය ඥානය

➢ බුදුරජාණන් වහන්සේ පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වෙති.ඒවා නම්,

1. ශීල සංවර
2. ඉන්ද්‍රිය සංවර
3. භෝජන මත්තඤ්ඤුතා
4. ජාගරියානු යුක්ත
5. ශ්‍රද්ධා
6. හිරි
7. ඔත්තප්ප
8. බහුස්සුතතා
9. පරක්කම (පරාක්‍රම)
10. සති
11. පඤ්ඤා
12. ප්‍රථම ධ්‍යාන
13. ද්විතීය ධ්‍යාන
14. තෘතීය ධ්‍යාන
15. චතුර්ථ ධ්‍යාන

# 16. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ නායකත්වය

භාග්‍යවතුන් වහන්සේගේ බුද්ධ චරිතය පුරා පැවති ශ්‍රේෂ්ඨ නායකයෙකු සතු උදාර ගුණාංග

## මහා පෞරුෂය-

අසහාය නායකයෙකු තුළ තිබිය යුතු ,

- අංග ලක්ෂණ
- රූපවත්භාවය
- තේජස්විභාවය
- දෙතිස් මහා පුරුෂ ලක්ෂණ
- අසීති අනුව්‍යඤ්ජනයන්ගෙන් මැනවින් ප්‍රදර්ශනය විය.

### ආදර්ශය-

බුදුරජාණන් වහන්සේ,

- යථාවාදී තථාකාරී ගුණයෙන් ( ප්‍රකාශ කරන දෙයම ක්‍රියාත්මක කරන)
- යථාකාරී තථාවාදී ගුණයෙන් ( ක්‍රියාත්මක කරන දෙයම ප්‍රකාශ කරන)

යුක්ත විය.

- බුදුරජාණන් වහන්සේ භික්ෂුවගේ සංවරය පිණිස ශික්ෂාවන් පනවන ලදි.
- එලෙසම භික්ෂු ශාසනයට ඇතුළත් වූ නොයෙක් අදාන්ත පුද්ගලයන් දමනයට දඬුවම් නියම කරන ලදි.

## සානුකම්පික බව-

- බුදුරජාණන් වහන්සේ තමන් පැනවූ විනය නීති වලින් ශ්‍රාවක පිරිස කරදර වනු දුටු හැම අවස්ථාවකම ඒවා ලිහිල් කළහ.
- එක් වස් කලක් අවසන, තෙමීගත් සිවුරුවලින් පීඩා විඳිමින් සිටි භික්ෂු පිරිසක් කෙරෙහි අනුකම්පාවෙන් බුදුන් වහන්සේ, වස් විසූ භික්ෂූන්ට කඨින චීවරයක් පිළිගන්නට අවසර දුන්හ.
- ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම පරිදි අතිරේක ගෘහපති පිළිගැනීමට අවසර දුන්හ.

- සැදැහැවතුන්ගේ ඉල්ලීම පරිදි තවත් අත්‍යාවශ්‍ය විවිධ පරිෂ්කාර පිළිගැනීමට අවසර දුන්හ.
- ගල්ගුහා හා රුක් මුල්හි රාත්‍රිය ගෙවමින් දුක සේ ජීවිත් වූ භික්ෂූන්ගේ පහසුව ආරාම පිළිගැන්වීමට අවසර දුන්හ.
- පර්යන්ත ජනපදවල දුකසේ විසූ භික්ෂූන්ගේ යහපත උදෙසා බුදුන් වහන්සේ විනය නීති ලිහිල් කළ සේක.
- කිසිවිටෙක භික්ෂු පිරිසේ නායකත්වය නොගෙන ක්‍රියා කළහ.
- බුදුරජාණන් වහන්සේ භික්ෂුවගේ යහපැවැත්ම උදෙසා ධර්ම විනය දෙක මැනවින් ප්‍රකාශ කර ඇතැයි පැහැදිලි කළහ.
- බුදුරජාණන් වහන්සේ තමන් කිසිවක් ගුරු මුෂ්ටි වශයෙන් තබා නොගත් අතර අවබෝධ කොටගත් සියල්ල පැහැදිලි වශයෙන් ශ්‍රාවකයන්ට දේශනා කළහ.
- තම ශාසනයේ භික්ෂුව , කාන්තාවන් කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය සහ භික්ෂු පිරිස එකිනෙකා කෙරෙහි පිළිපැදීමේදී අනුගමනය කළ යුතු පිළිවෙළද විස්තර කළහ.
- අවශ්‍ය වෙතොත් බුද්දානු, බුද්දක ශික්ෂාපද සංඝ සම්මතයෙන් වෙනස් කරගන්නා ලෙසද අවසර දුන්හ.
- භික්ෂු ශාසනයේ චිරස්ථිතිය පිණිස විශේෂ අපරිහානි ධර්ම රැසක්ද පැහැදිලි කර දුන්හ.
- බුදුන් වහන්සේ, තමාගේ පරිනිර්වාණයෙන් පසුව තමන් වහන්සේගේ ඇවැමෙන් ශ්‍රේෂ්ඨ ධර්මය හා විනය ශාස්තෲත්වයෙන් සළකන ලෙසද ප්‍රකාශ කළහ.
- තථාගතයාණන් වහන්සේගේ ජීවිතයේ අවසාන මොහොතේදී මෙන්ම මුලු බද්ධ ජීවිතයම වැය වූයේ අහිංසක සත්වයන් දුකින් මුදාලීම පිණිස ධර්මාවබෝධය ලබාදීමේ උදාර කර්තව්‍යය වෙනුවෙනි.

# 17. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ සමාජ ශෝධකත්වය

- එකල ඉන්දියානු ජන සමාජය ආචීර්ණ කල්පිත බමුණු මතවාදයන්ගෙන් ගහණ විය.
- සමාජයේ වැඩි කොටසක් පීඩාවට පත් කළ අසාධාරණ සමාජ ක්‍රමයක් පැවතිය.
- බෝසතාණෝ ශාක්‍යන්ගේ උඩඟුකම හා මානය ගර්හාවට ලක් කළහ.
- සම්බුද්ධත්වයෙන් පසු, සමාජයේ සෑම කොටසක්ම ස්වකීය ශාස්තෘත්වය පිළිගත් පසු බුදුන් වහන්සේ කිඹුල්වතට වැඩම කළහ.
- බමුණු කුල දරුවෝද සසුනෙහි පැවිදි වූහ.
- භාග්‍යවතුන් වහන්සේ තම සම්බුද්ධත්වය පැහැදිලි කිරීමට ශාක්‍යන් ඉදිරියේ යමක ප්‍රාතිහාර්ය දැක්වූහ.
- මිනිස් උරුමය ඉදිරියේ, මිනිසාගේ දිළිඳුභාවය බාධකයක් හෝ මිනුමක් ලෙස නොසැළකිය යුතු බව පැහැදිලි කිරීමට, බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා පිඩුසිඟා වඩින්නට වූහ.
- ප්‍රබල ඥාතීන්ගේ සාවද්‍ය මතවාදයන් මෙසේ අවඥාවට ලක් කළහ.
- බුද්ධිය දියුණු කොට ගෙන මානව භාවය අගය කළ හැකි සංසිඳීම ලබාගැන්ම ලොව විශිෂ්ඨම ක්‍රියාවක් බව බුදුහු පැහැදිලි කළහ.
- බුදුන් වහන්සේ ශාක්‍ය රාජ්‍යයට උරුමකම් කියූ නන්ද,රාහුල ආදී ශාක්‍ය කුමාරවරු පැවිදි කරවූහ.
- එක් අවස්ථාවක අනුරුද්ධ,ආනන්ද,භගු,කිම්බිල,දේවදත්තාදී ප්‍රකට ශාක්‍ය රාජ කුමාරවරු පැවිදි වීමට බුදුරජාණන් වහන්සේ වෙත පැමිණයහ.
- එහිදී ඔවුන් සමඟ පැමිණි උපාලි කපුවා ප්‍රථමයෙන් පැවිදි කරවූහ.
- මානවභාවය ගරු කිරීමේ ආදර්ශය ලබාදීමට ශාක්‍ය කුමාරවරුන් ලවා උපාලි තෙරුන්ට නිසි ගෞරවාචාර දක්වා ඔවුන්ට පැවිද්ද ලබා දුන්හ.
- භාග්‍යවතුන් වහන්සේ සමාජ සංශෝධන ව්‍යාපාරය, මහසල් කුලයන්ගෙන් පැවිදි වූ ශ්‍රාවක පිරිස් ලවාම ආරම්භ කළහ.
- මෙහිදී පැවිදි වූ කෝලිත,උපතිස්ස,පිප්පිලී නම් වංශවත් බ්‍රාහ්මණ කුමාරවරු ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළහ.
- මනුෂ්‍යයෙකු වසලයෙකු හෝ ශ්‍රේෂ්ඨයෙකු හෝ බ්‍රාහ්මණයෙකු වන්නේ උපතින් නොව ක්‍රියාවෙන් බව බුදුහු පැහැදිලි කළහ.
- එම දහමෙහි පැහැදුණු සුන්දරික භාරද්වාජ වැනි බොහෝ බ්‍රාහ්මණයෝ තෙරුවන් සරණ ගියහ.
- නියම බමුණා හඳුනාගන්නේ කෙසේදැයි බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්න කළ බ්‍රාහ්මණයෙකුට පිළිතුරු වශයෙන්,

"නජටාහි නගොත්තෙන
නජච්චා හොති බ්‍රාහ්මණෝ
යම්හි සච්චං ච ධම්මොච
සො සුචී සො ච බ්‍රාහ්මණෝ"

"හිස බැඳි ජටාවලින් හෝ ගෝත්‍රයෙන් හෝ,ජාතියෙන් හෝ බමුණෙක් නොවේ.යමකු තුළ සත්‍යත්, ධර්මයත් පවතී නම් නම් ඔහු පිරිසිදු අයෙකි.ඔහුම බ්‍රාහ්මණයෙකියි". විස්තර කළහ.

- බුදුරදුන්ගේ චින්තන ස්වරූපය විමසා බැලීමට පැමිණි සෝණදණ්ඩ, පොක්ඛරසාති, කූටදන්ත, වාසෙට්ඨ, ජානුස්සෝණි, භාරද්වාජ, අග්ගික භාරද්වාජ ආදී බ්‍රාහ්මණයෝ දහම් අසා තෙරුවන් සරණ ගියහ.
- බුදුරජාණන් වහන්සේ කාන්තාවන්ට සමාජයේ සම අයිතිවාසිකම් ලබා දෙමින් කාන්තා විමුක්තිය සලසා දුන්හ.
- බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ක්ෂුද්‍ර යන කවර හෝ කුලයකින් පැමිණ පැවිදිව තම ශාසනයට ඇතුළත් වූ පසු, එකම ආර්ය ශ්‍රාවක සනයට අයත් උතුම් මනුෂ්‍යයෙක් වන බව පැහැදිලි කළහ.
- ස්වාමියා සේවකයාට නිසි පරිදි යුතුකම් ඉටු කළ යුතු බව බුදුන් වහන්සේ පෙන්වා දුන්හ.
- දියුණුව අපේක්ෂා කරන පුද්ගලයා උත්සාහයෙන් ධනය ඉපයිය යුතු බවත්, එම ධනය තමන්ගේත්, තම අවට සියල්ලන්ගේත් යහපත උදෙසා යෙදවිය යුතු බවත් පෙන්වා දුන්හ.
- ශ්‍රාවක පිරිස දන් දීමට යොමු කළ අතරම ධනය, සමාජ විෂමතාවයේ මිනුම් දණ්ඩක් නොකර ගත යුතු බව පෙන්වා දුන්හ.
- තම භික්ෂු ශාසනයට ලැබුණු නොයෙක් ප්‍රත්‍යයන් සඟ සතු ක්‍රමය අනුව පිළිගැනීමට ශ්‍රාවක පිරිස මෙහෙය වූහ.
- මෙමඟින් පෞද්ගලික අයිතිය පිළිබඳ ආත්මාර්ථකාමී හැඟීම් බැහැරලා සමාජයේ සමානාත්මතාවය ඇතිකිරීමට බුදුන්වහන්සේ කටයුතු කළහ.
- මේ අනුව භාග්‍යතුන් වහන්සේ සුවිසල් සමාජ ශෝධනයක් සිදු කිරීමට අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කළහ.

# 18. සිවුවනක් පිරිස හඳුනා ගනීම

## පස්වග තවුසන් හා භික්ෂු සමාජය

- බෝසත් උපතින් පස්වන දින පැවති නම් තැබීමේ උත්සවට පැමිණි රාම , ධජ , ලක්ඛණ ,මන්ත්‍රී, කොණ්ඩඤ්ඤ , භෝජ , සුයාම , සුදත්ත යන බ්‍රාහ්මණයන් අතරින් **කොණ්ඩඤ්ඤ පමණක් බෝසතුන් අනාගතයදී ස්ථිර ලෙස බුදුවන බව පැවසීය.**

- දුෂ්කර ක්‍රියාවේ යෙදී සිටි බෝසතානන් **උරුවෙල් දනව්වේ සේනානි ගමේදී** පස්වග තවුසන් හමු විය. මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන විට හැරදමා **ඉසිපතනයට** ගියහ.

- ප්‍රථම ධර්ම දේශනාව - ඉසිපතනයේ මිගදායේ - පස්වග තවුසන් (කොණ්ඩඤ්ඤ , වප්ප ,භද්දිය , මහානාම ) අරහයාය

- එහිදී බුදුන් වහන්සේ මහණෙකු විසින් අත්තකිලමතානු යෝගය හා කාමසුකල්ලිකානු යෝගය අත්හල යුතුබව දේශනා කළහ. කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණය සෝවාන් විය.

- **අනන්තලක්කණ සූත්‍රය** අසා පස්වග තවුසන් අරහත්ඵල ලබා ගත්හ.

- කොණ්ඩඤ්ඤ තෙරණුවෝ - භික්ෂු සාසනයේ ප්‍රථමයා , චිරරාත්‍රඥ භික්ෂූන් අතර අග්‍රස්ථානය

## භික්ෂු සමාජය

- ශ්‍රාවක සමාජය භික්ෂු , භික්ෂුණී , උපාසක , උපාසිකා යන සිවුවනක් පිරිසගෙන් සමන්විතය.

- පස් වග තවුසන් , යස සහ යහලුවන් - පලමු රහත් හැට නම .
- අනතුරුව භද්දවග්ගිය , තුන් බෑ ජටිල පිරිස , උපතිස්ස ,කෝලිත ඇතුලු පිරිස සමග භික්ෂු සමාජය ව්‍යාප්ත විය.

- **දේශනා ප්‍රාතිමෝක්ෂය** යට පමණක් සීමා වූ භික්ෂු විනය , විනය නීති මගින් තහවුරු කිරීම.

- ආචාර්ය ශිෂ්‍ය හා අන්තේවාසික සද්ධි විහාරික යන ක්‍රමය යටතේ වත් අනුගමනය කිරීම.

## සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලා

- සැරියුත් මහරහතන් වහන්සේ - උපතිස්ස පරිබ්‍රාජක - උපතිස්ස ගමෙහි ,බමුණුගම පරපුරෙහි සාරී බැමිණිය මව විය.

- මුගලන් මහරහතන් වහන්සේ - කෝලිත පරිබ්‍රාජක - කෝලිත ගමෙහි ගම් ප්‍රදනියගෙ බිරිද වූ මොග්ගලී බැමිණිය මව විය.

- ගිරග්ග සමජ්ජ නාට්‍ය නරඹා කලකිරීමට පත්විය.

- පලමුව සංජය පිරිවැජ්ජියගේ ධර්මය හැදෑරීය.

- පලමුව උපතිස්ස පරිබ්‍රාජක අස්සජි තෙරුණුවෝ දේශනා කළ

  **"යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තතාගතො ආහ තෙසඤ්ච යෝ නිරෝධෝ - ඒවං වාදී මහා සමණෝ "**

  ගාථාව අසා සෝවාන් විය.

- කෝලිතද , උපතිස්ස ගෙන් එම ගාථාව ඇසීමෙන් අනතුරුව සෝවාන් විය.

- අනතුරුව සංජය ආචාර්යවරයා හැර ඔහුගේ පිරිස සමග පැවිදි විය.

- සැරියුත් තෙරණුවෝ පැවිද්දෙන් අඩ මසකට පසු රජගහනුවර සුබරකත ලෙනෙහිදී බුදුරදුන් විසින් **දීඝනඛ** පරිබ්‍රාජකයාට දේශනා කල **වේදනා පරිග්ගහ සූත්‍රය** අසා රහත් බව ලැබූහ.

- පාවානුවර මල්ල රජ දරුවන්ගේ උබ්බටඨක නම් අභිනව සන්ථාගාරයෙදී බුදුරදුන් දේශනා කල ධර්මය විස්තරාත්මකව සැරියුත් මහරහතන් වහන්සේ දේශනා කල අතර එය **දීඝනිකායේ සංගීති සූත්‍රය** ලෙස හැදින් වේ.

- **දීඝනිකායේ දසුත්තර සූත්‍රය , මජ්ඣිම නිකාය සම්මා දිට්ඨි සූත්‍රය , මජ්ඣිම නිකාය ගුලිස්සානි සූත්‍රය , දීඝනිකායේ සම්පසාදනීය සූත්‍රය** සැරියුත් මහරහතන් වහන්සේ දේශනා. කල සූත්‍ර වේ.

- සැරියුත් මහරහතන් වහන්සේ මහා ප්‍රඥාවන්තයන් අතර අග තනතුරද, ධම්ම සේනාධිපති තනතුරද ලැබීය.

- ඍද්ධිමතුන් අතර අග්‍රස්ථානය මුගලන් මහරහතන් වහන්සේට හිමි විය.

- මුගලන් මහරහතන් වහන්සේ මාරයාට කරන ලද තර්ජනයක් පිලිබද **මජ්ඣිම නිකාය මාරතජ්ජනීය සූත්‍රයේ** විස්තර වේ.

- සැරියුත් මහරහතන් වහන්සේ හා මුගලන් මහරහතන් වහන්සේ එකතුව සාකච්ඡා කල ධර්ම කරුණු **මජ්ඣිම නිකාය** අනංගන සූත්‍රයේ සදහන් වේ.

- දෙව්දත් තෙරුණ් විසින් සංඝභේදය කල අවස්තාවේ එය සමථයකට පත් කිරීමට සැරියුත් හා මුගලන් මහරහතන් වහන්සෙලා දායක විය.

## මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ

- මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ සාසනික සේවාව පිලිබද දීඝනිකායේ මහා පරිනිර්වාණ සූත්‍රයේත් , චුල්ලවග්ග පාලි හා මහාවග්ග පාලි යන විනය ග්‍රන්ථ , සූත්‍ර සාහිත්‍යය , සද්ධර්මරත්නාවලිය යන ග්‍රන්ථ වල සදහන්ව ඇත.

- මගධ රට තිත්ථගම , කපිල බ්‍රාහ්මණයාගේ එකමපුතු ලෙස පිප්පලී නමින් උපත ලැබීය.

- ගිහි කල භද්‍රකපිලානි කුමරිය හා විවාහ විය.

- පිප්පලී කුමරු හා භද්‍රකපිලානි  කුමරිය පැවදිවීම සඳහා ගිහිගෙය හැර යන අවස්ථාවේ පිප්පලී කුමරුට බුදු රදුන් හමු වූ අතර අතර මගදීම මහණ උපසම්පදාව දුන් සේක.

- මහා කාශ්‍යප ලෙස පැවිදි  වූ උන්වහන්සේ  පැවිද්දෙන් අට වන දින අරහත්වයට පත්විය.

- මහා කාශ්‍යප මහරහතන් වහන්සේ බුදුරදුන් ට බොහෝසේ සමාන වූ අතර මහා පුරුෂ ලක්ෂණ සතක් විය. බුදුරදුන්ට වඩා අගල් සතරකින් මිටි විය.

- බුදුරජාණන් වහන්සේ මහා කාශ්‍යප  මහරහතන් වහන්සේට ධූතවාදී භික්ෂූන් අතර අග්‍රස්ථානය පිරිනමන ලදී.

**මහා කාශ්‍යප  මහ රහතන් වහන්සේ ගේ ශාසනික සේවා**

- සුභද්‍ර ගේ කටුක ප්‍රකාශය නිසා , ධර්ම විනය ආරක්ෂා  කිරීමට සප්තපර්ණී ගුහා දිවාරයේ පැවති පලමු ධර්ම සංගායනාවට ප්‍රමුඛත්වය ගැනීම.

## අග්‍ර උපස්ථායක ආනන්ද තෙරණුවෝ

- සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු බුදුසිරුරේ ආදාහන කටයුතු සංවිධානය හා පලමු ධර්ම සංගායනාව සඳහා දායකත්වය ලබා දීම.

- ආනන්ද කුමරුගේ පියා වූයේ සුද්දෝදන රජුගේ සොහොයුරෙකු වූ අමිතෝදන ශාක්‍ය රජුය.

- අනුරුද්ධ , භගු , කිම්බිල ,දේවදත්ත හා උපාලි කපුවාණන් සමග මල්ලරට අනුපිය අඹ සෙවනේදී පැවිදි විය.

- ආචාර්යවරයා වූ පුණ්ණ මන්තානි පුත්ත තෙරුන් දේශනා කරන ලද ධර්මය අසා සෝවාන් විය. බෙල්ලට්ඨිය තෙරුන් උපාධ්‍යායන් වහන්සේ විය.

- බුදුන් වහන්සේට නාගිත ,උපවාන , රාධ , මේඝිය , සාගත තෙරුන් වරින් වර උපස්ථාන කලද , ආනන්ද තෙරුන් වහන්සේ **ස්ථිර උපස්ථායක** ලෙස පත් විය.

- මෙහිදී ආනන්ද තෙරුන් වර සතරක් හා ප්‍රතික්ෂේප ස්තරක් ඉදිරිපත් කරන ලදී.

**ප්‍රතික්ෂේප සතර**

1. බුදුරජාණන්වහන්සේට ලැබෙන වටිනා සිවුරු ආනන්ද තෙරුන්ට නොදිය යුතුය
2. බුදුරජාණන්වහන්සේට ලැබෙන ප්‍රණීත ආහාර පාන ආනන්ද තෙරුන් ට නොදිය යුතුය.
3. බුදුරජාණන්වහන්සේ වැඩ වසන ගන්ධ කුටියේ විසීමට ආනන්ද තෙරුන්ට ඉඩ නොදිය යුතුය
4. බුදුරජුන්ට දන් පිනිස ලැබෙන ආරාධනාවන්ට ආනන්ද තෙරුන් සමග නොවැඩිය යුතුය.

**වර සතර**

1. ආනන්ද තෙරුන් විසින් පිළිගන්නා දායක භවතුන්ගේ ආරාධනාවන්ට බුදුරජාණන්වහන්සේ වැඩම කළ යුතුය.
2. නොයෙක් ප්‍රදේශ වලින් බුදුරදුන් දැක්මට එන පිරිස් එවෙලේම බුදුරදුන් හමුවට කැඳවාගෙන ඒමට අවසර තිබිය යුතුය.
3. යම් සැකයක් ඇති වූ කෙනෙහි එය විමසා දැන ගැනීමට අවසර දිය යුතුය.
4. ආනන්ද තෙරුන් නොමැති තැන්වල දේශනා කළ ධර්මය ආනන්ද තෙරුන්ට නැවත දේශනා කල යුතුය.

- ප්‍රථම ධර්ම සංඝායනාවට ප්‍රථම සතර ඉරියව්වෙන් තොරව රහත් භාවයට පත් විය.
.
- ධර්මය එක්වරක් ඇසූපමණින් මතක තබා ගත හැකි වූ නිසා **ධර්ම භාණ්ඩාගාරික** පදවිය ලදහ.
- බුද්ධ සාසනයේ කාන්තා පැවිද්ද ඇතිකිරීමේ පුරෝගාමීව ක්‍රියා කළහ.
- වසර එකසීය විස්සක් ජීවත්ව සිටි උන් වහන්සේ පිරිනිවන් පෑහ.

## සීවලී තෙරණුවෝ

- විදර්ශී බුදුරදුන් දවස කල ප්‍රාර්ථනයකට අනුව ගෞතම **බුදු සසුනේ ලාභීන් අතර අග්‍රස්ථානය ලැබීය.**
- කෝලිය වංශයේ සුප්පාවාසා කුමරිය මව විය.
- සැරියුත් මහරහතන් වහන්සේ සමීපයෙහි පැවිදි වී නොබෝකලකින්ම රහත් විය.

## රාහුල තෙරණුවෝ

- සිදුහත් බෝසතුන්ගේ හා යශෝධරාවන්ගේ එකම පුතුය.
- රාහුල කුමරු උපන් දිනව බෝසතානන් වහන්සේගේ අභිනිශ්ක්‍රමණය සිදුවිය.
- බුදුරදුන් කිඹුල්වත් නුවරට වැඩම කල අවස්තාවේ  සැරියුත් මහරහතන් වහන්සේ සමීපයෙහි පැවිදි විය.
- දෙමාපියන්ගේ අනුමැතියකින් තොරව දරුවන් පැවිදි නොකල යුතු බවට විනය නීතියක් පැනවීමට රාහුල කුමරුගේ පැවිදි වීම හේතු විය.
- **ශික්ෂාකාමීන් අතර අගතැන් ලැබූ** උන් වහන්සේ චුල්ලරාහුලෝවාද සූත්‍රය අසා රහත් විය.
- අම්බලට්ඨක රාහුලෝවාද , මහා රාහුලෝවාද ආදී සූත්‍ර රාහුල තෙරුන් අරභයා දේශනා කරන ලදී.
- බුදුරදුන්ට පෙර පිරිනිවන් පෑහ.

## මහා කච්චායන තෙරණුවෝ

- උදේන පුරයේ චණ්ඩපජ්ජෝත රජුගේ පෙරෙවි බමුණු කච්චායන පුතු ලෙස උපත ලැබීය.
- සිරුරේ පැහැය හා ගෝත්‍ර නාමය අනුව කච්චායන ලෙස ප්‍රසිද්ධ විය.

- පියාගේ අභාවයෙන් පසු රජුගේ පුරෝහිත තනතුරට පත් විය.

- චණ්ඩපජ්ජෝත රජු බුදුරදුන් බැහැ දැකීම සඳහා කත්‍යායන පුරෝහිත තුමා යැවූ අතර බුදුරදුන් බැහැ දැකීමෙන් පසු සිව්පිළිසිඹියාව සහිතව රහත්ව ඒහිභික්ෂු ප්‍රවුජ්‍යාවෙන් පැවිදි උපසම්පදාව ලබා ගත්හ.

- නැවත රජතුමා හමුවට පැමිණි තෙරුනුවෝ උදේනි නගරයේ ධර්මය ප්‍රචලිත කිරීම සඳහා දායක විය.

- **ධර්මය විස්තර කොට අර්ථ විභාග කිරීමෙ දක්ෂයන් අතර අගතනතුර ලැබීය.**

## පුණ්ණ මන්තානිපුත්ත තෙරණුවෝ

- ගිහි කල ධනවත් වෙලෙන්දෙක්ව සිටියහ.

- පියුමතරා බුදුරදුන් දවස හංසවතී නගරයෙහි ඉපිද කල ප්‍රාර්තනාවකට අනුව ගෞතම බුදුසසුනේ පැවිදව රහත්ව **ධර්ම කථිකයන් අතුරින් අග්‍රස්ථානය ලදහ.**

- අණ්ඩාකොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේගේ බෑණනු කෙනෙකු වූ උන්වහන්සේ , ද්‍රෝණවාසිපූන බමුණු ගමෙහි .බ්‍රාහ්මණ මහාසාර කුලයට අයත් මන්තානි බැමිණියගේ පුතුව උපන්හ.

- ගිහිකල පූර්ණ මානවක නම් වූ ඔහු , අණ්ඩාකොණ්ඩඤ්ඤ තෙරුන් කිඹුල්වත් නුවරට වැඩි අවස්තාවේ පැවිදි වී , නොබෝ කලකින්ම රහත් විය.

- සැරියුත් තෙරුන් සමග **සප්ත විසුද්ධි** ක්‍රමය පිලිබඳ ඇති වූ සාකච්ඡාව **මජ්ඣිම නිකාය රථවිනීත සූත්‍රයේ** සඳහන් වේ.

## කුමාර කාශ්‍යප තෙරණුවෝ

- කුමාර කාශ්‍යප පුවත **ධම්ම පදට්ය** කතාවෙත් , **සද්ධර්මරත්නාවලියේත් , මනෝරංජනී** නම් **අංගුත්තර නිකාය සිංහල අටුවාවේත්** විස්තර වේ.

- රජගහ නුවර සිටුවරයාගේ දියනිය , මව වූ අතර ගිහිකලදී දරු ගැබක් පිහිටි අතර ඇය පැවිදි වීමෙන් පසුව කුමාර කාශ්‍යප උපත සිදු විය.

- උපතින් පසුව කොසොල් රජු විසින් දරු තනතුරේ රැක බලා ගන්නා ලදී.

- ශුද්ධාවාස වැසි බ්‍රහ්මයෙක් විසින් කුමාර කාශ්‍යප තෙරුන් ගෙන් අසන ලද ප්‍රශ්න වලට බුදුරදුන් ලබා දුන් පිලිතුරු ඇසූ කුමාර කාශ්‍යප තෙරණුවෝ රහත් බාවයට පත්විය .

- නොයෙක් උපමා දක්වමන් පායාසි රජුට පායාසිරාජඤ්ඤ සූත්‍රය දේශනා කල කුමාර කාශ්‍යප තෙරණුවෝ විසිතුරුව දහම් දෙසන්නන් අතරින් අග්‍රස්ථානය ලැබූහ.

- විසි වැනි වියට පෙර කුඩා වියේදී උපසම්පදාව ලබා රහත් වූ තෙරුන්ගෙන් අයෙකි.

# 19. භික්ෂුණී සමාජය

- භික්ෂු සමාජය ආරම්භ වී වසර පහකට පමණ පසු ආනන්ද තෙරුන්ගේ පුරෝගාමීත්වයෙන් ඇති විය.
- ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ ඉල්ලීම තුන් වන වතාවටත් ප්‍රතික්ෂේප කිරීමෙන් පසු අෂ්ඨ ගරු ධර්ම පනවා කාන්තා පැවිද්ද පිහිටවීය.

## ප්‍රජාපතී ගෝතමී තෙරණිය.

- බුද්ධ ශාසනයේ කාන්තා පැවිද්ද ආරම්භ වීමත් සමග කාන්තාවන්ට පුරුෂයා හා සමාන අයිතිවාසිකම් ලබමින් සමාජයේ නොයෙක් ක්ෂේත්‍ර කරා මෙම පරිවර්තනය විහිදී යන්නට විය.
- ප්‍රජාපතී දෙව්දහ නුවර අංජන රජුගේ බාල දියණිය වූ අතර මහමායා දේවිය වැඩිමල් සොයුරිය විය.
- මහාමායා දේවිය අභාවප්‍රාප්ත වීමෙන් පසු සුදොවුන් රජුගේ අගබිසව බවට පත් වූ අතර සිදුහත් කුමරු රැක බලා ගත්තේ ප්‍රජාපතී දේවිය විසිනි.
- පිරිවර පන්සීයක් ස්ත්‍රීන් සමග වෛශාලියෙහි කූඨාගාර ශාලාව වෙත පැමිනි ඇය ආනන්ද තෙරුන් ගේ මැදිහත්වීම්වින් අෂ්ඨ ගරු ධර්ම වලට යටත්ව පැවිද්ද ලබා ගත්හ.

1) උපසපන් වී වස් සියයක් ඉක්මවූ මෙහෙණියද එදින උපසන් වූ භික්ෂුව දැක ගරු කල යුතුය.
2) භික්ෂුණිය භික්ෂූන් නැති පෙදෙසක වස් විසීම නොකල යුතුය.
3) අඩ මසකට වරක් භික්ෂුණිය , භික්ෂූන් මුන ගැසී පොහොය විචාරීම , අවවාද ලබා ගැනීම කල යුතුය.
4) භික්ෂුණිය වස් අවසන භික්ෂු භික්ෂුණී යන උභතෝ සංඝයා ඉදිරියේ පවාරණය කල යුතුය.
5) භික්ෂුණිය අතින් ගරුකාපත්තියක් සිදු වූ විට එයින් පිරිසිදු වීමට භික්ෂු , භික්ෂුණී යන උභතෝ සංඝයා ඉදිරියේ දෙපෝයක් මානත් පුරා අබ්භාන විනය කර්මය සිදු කළ යුතුය.
6) භික්ෂුණිය උපසම්පදාවට පෙර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති පුරමින් සික්ඛ මාතාවක වශයෙන් දෑවුරුද්දක් පුගුණ කොට උභතෝ සංඝයා ඉදිරියේ උපසම්පදාව ලබා ගත යුතුය.
7) භික්ෂුණියක් කිසිම හේතුවක් නිසා භික්ෂුවට ආක්‍රෝශ නොකළ යුතුය.
8) භික්ෂුණිය භික්ෂුවට අවවාද නොකල යුතුය.භික්ෂූන් විසින් දෙන අවවාද පිලිපැදිය යුතුය.

- ප්‍රජාපතී තෙරණිය නොබෝකලකින් විදසුන් වඩා අරහත් වූ අතර අනෙකුත් භික්ෂුණීන් නන්දකෝවාද සූත්‍රය අසා අරහත් විය.
- මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය ට භික්ෂුණීන් අතර චිරරාත්‍රඥ භාවය පිලිබඳ අග්‍රස්ථානය ලැබීය.
- එකසිය විසිවැනි වියේදී පිරිනිවන් පෑ ප්‍රජාපතී තෙරණිය . පිරිනිවන් පාන අවස්තාවේ බුදුරදුන් පසුගමන් කල අතර එය බුදුරදුන් ගේ එකම පසුගමන විය.
- ආදාහනයෙන් පසු ලිච්ඡවීහු ඇයගේ ධාතු තැන්පත් කර සෑයක් ඉදි කළහ.

## භද්දකච්චායනා තෙරණිය.

- මවුපියන් වූයේ දෙව්දහ නුවර සුප්පබුද්ධ රජු හා අමිතා දේවියයි.සොහොයුරා දේවදත්ත කුමරුය.
- සිරුරේ රන්වන් පැහැය නිසාම භද්‍රකාංචනා , භද්දකච්චායනා ලෙස හැඳින්වූ ඇය යශෝධරා නමින්ද හඳුන්වා ඇත.

- සිදුහත් කුමරුගේ නික්මයාමෙන් පසුවද , සිදුහත් කුමරු ගැන ඉමහත් භක්තියෙන් යුතුව විසුවාය.

- බුද්ධත්වය ලබා ප්‍රථම වතාවට කිඹුල්වතට වැඩි අවස්තාවේ , ඇයගේ ගුණ කියමින් චන්ද කින්නර ජාතකය දේශනා කළ සේක.

- ප්‍රජාපතී ගෝතමී ය පැවිද්ද ලැබීමෙන් පසු ජනපද කල්‍යාණිය සමග ගොස් ප්‍රජාපතී තෙරණිය ළග පැවිදි විය.

- නොබෝ කලකින්ම රහත් වූ ඇය අභිඥා ලාභී භික්ෂුණීන් අතර අග්‍රස්ථානය ලැබීය.

- හැත්තෑ අටවන වියේදී පිරිනිවන් පෑවාය.

## ඛේමා තෙරණිය.

- මහා ප්‍රාඥ තෙරණීන් අතර අග්‍රස්ථානය ලැබීය.

- මගධ රට සාගල නුවර රජ කුලයක උපන් ඇය පසේනදී කොසොල් රජුගේ අග බිසවක් වූවාය.

- වේලුවන විහාරයේදී බුදුරදුන් හමුවී ත්‍රිලක්ෂණය පිලිබද දහම් ඇසූ ඇය සිව්පිළිසිඹියා පත් සහිතව රහත් විය.

## උත්පලවන්නා තෙරණිය .

- පෙර කරන ලද ප්‍රර්ථනයකට අනුව උත්පලවන්නා හා ඛේමා තෙරණිය අග්‍රශාවිකාවන් විය.

- සැවැත්නුවර ධනවත් කුලයක අතිශයින් රූමත් දියණියක් වූ ඇයගේ දෙනුවන් නිලුපුල්පෙති පැහයෙන් යුක්ත වූ නිසා උත්පලවන්නා යැයි නම් කරන ලදී.

- පැවිදි වූ උත්පලවන්නාවන් , දැල්වෙන පහන් සිලුව නිමිති කොට තේජොකසිණාරම්මණය වඩා ධ්‍යාන උපදවා රහත් විය.

- ඍද්ධිමත් භික්ෂුණීන් අතර අග්‍රස්ථානය හිමි විය.

## ධම්මදින්නා තෙරණිය

- රජගහ නුවර කුල ගෙයක උපන් ධම්මදින්නාවෝ තුරුණුවියට පත් වූ පසු විසාඛ සිටානන් හා විවාහ විය.

- විසාඛ සිටුතුමා බුදුරජාණන්වහන්සේ දහම් අසා අනාගාමී ඵලය ප්‍රත්‍යක්ෂ කලේය. ඉන්පසු ධම්මදින්නාවෝද පැවිදි විය.

- ආචාර්ය වරියකගෙන් කමටහන් ලබා ගත් ඇය නොබෝකලකින් සිව්පිළිසිඹියාව සමග රහත් විය.

- ධම්මදින්නා තෙරණිය හා විසාඛ අතර සිදු වූ ධර්ම සාකච්ඡාව **මජ්ඣිම නිකායේ චූල්ලවේදල්ල සූත්‍රයේ** සඳහන් වේ.

- ධර්ම කථික භික්ෂුණීන් අතර අග්‍රස්ථානය ලැබීය.

## අම්බපාලි තෙරණිය

- විශාලා නුවර රජ උයනේ අඹ ගසක් මුල ඕපපාතික උපන් ලෙස සඳහන් වන අතර නගර සෝබනියක විසින් හැර දමා ගොස් ඇත්දැයි නිශ්චිත ව සඳහන් නොවේ.

- ඉතා රූමත් වූ ඇය සරණ පාවා ගැනීමට  නොයෙක් රාජ කුමාර වරුන් පැමිනීම නිසා රජුඇයව විශාලාවේ නගර ශෝභනිය ලෙස පත් කරන ලදී.

- පසු කල ඇය මෙහෙණි සසුනෙහි පැවිද රහත් විය.

- වියපත් ඇය තුරුණු විය ගැන අනිත්‍යානු දර්ශනයෙන් බැලූ ආකාරය ථෙරි ගාථා පාලියේ විස්තර වේ.

## පටාචාරා තෙරණිය

- සැවැත්නුවර සිටුවරයෙකුගේ එකම දියනිය විය.

- තුරුණු වියට පැමිනීමෙන් පසු දාසයෙකු සමග ඈත ගම්මානයකට පලා ගියාය.

- දරුවන් ස්වාමියා දෙමවුපියන් අහිමි වීමෙන් පසු දරා ගත නොහැකි ශෝකයෙන් උමතුව නගරය පුරා දිව යන්නට විය.

- එහිදී බුදුරජාණන්වහන්සේ හමු වී දහම් අසා පියවි සිහිය ලැබීමෙන් පසු ජීවිතයේ අනිත්‍යතාව මෙනෙහි කොට රහත් විය.

- අතිශයින් විනයගරුක වූ ඇය විනයධර භික්ෂුණින් අතර අග්‍රස්ථානය ලැබීය .

# 20. බුද්ධ ශාසනයේ උපාසකවරු

- ප්‍රථම ද්වේවාචික උපාසක - තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන්
- තෙරුවන් සරණ ගිය ප්‍රථම උපාසකයන් - යස කුල පුත්‍රයාගේ පියා > බරණැස සිටුතුමා
- පුතු සොයා විහාරයට ගිය විට බණ අසා සෝවාන් විය.
- බුදුන් නිවසට වඩමවා දන් පිළිනැමුවේය.
- දන් වලදා අවසානයේ දෙසූ දහම් අසා සිටු බිරිද යස කුල පුත්‍රයාගේ බිරිද සෝවාන් විය.
- ඔවුන් තෙරුවන් සරණ ගිය ප්‍රථම උපාසිකාවන්ය.
- වෙනත් - අනේපිඩුසිටුතුමා , චිත්ත ගෘහපති , උග්ග සිටුතුමා ,රජගහනුවර කුක්කුට සිටුතුමා
- බිම්බිසාර රජු , පසේනදී කොසොල් රජු , මල්ල රජදරුවන්
- විශාඛා , බන්දුල මල්ලිකා
- ජීවක වෙදදුරු



## මගධ අධිපති බිම්බිසාර රජු

- වර්තමාන **දකුණු බිහාරය**
- උතුර - **ගංගා නදිය** , නැගෙනහිර - **චම්පා නදිය**,බටහිර - **සෝණ නදිය**, නිරිත - **වින්ද්‍යා වනය**
- අග නුවර - රජගහනුවර
- බුද්ධ කාලයට පෙර - වසුමතී නගරය
- වටවූ පර්වත ( ගිරිව්‍රජ නගරය) - **වෙභාර ,වෙපුල්ල , ගිජ්ජකූට , ඉසිගිලී, පාණ්ඩව**
- උද්‍යාන - **ජීවක අම්බවනය , වේලුවනය , වැල්මිවනය**
- සප්ත පර්ණී ගල්ගුහාව ,ඉන්ද්‍රසාලා ගුහාව
- චම්පා නුවර අගනුවර කරගත් අඟු රටද පසු කලෙක බිම්බිසාර රජු යටතේ විය.
- රජු වෙනත් රටවලින් පැමිනි වෙළෙන්දන් අත ඒ රට රජවරුන්ට තුටුපඬුරු යාවා මිත්‍රකරගත්තහ.සිදුහත් කුමරුද එවැනි නුදුටු මිත්‍රයෙකි.

- පැවිදි  වූ සිදුහත් බෝසතුන් රජගහනුවර පිඩු සිඟා වඩින විට රජු මේ තම මිත්‍රයා බව දැන රාජ්‍ය බෙදාගෙන පාලනයට ආරාධනා කල විට තමා මෝක්ෂය සොයා යන බව බෝසතානෝ දැන්වූහ.

- එවිට රජු බුද්ධත්වය ලද වහාම තම රාජ්‍යට වඩින ලෙස රජු ආරාධනා කලහ.

- බුද්ධත්වයෙන් පලමු වස අවසානයේම බුදුහු පැවිදි උපසම්පදාව ලද දහසක් උරුවෙල, ගයා, නදී කාශ්‍යපවරුන්ගේ තුන්බෑ ජටිල පිරිස සමග බරණැස සිට රජගහනුවරට වැඩියහ.

- රජු බණ අසා සෝවාන් විය.

- මෙහිදී රජු ප්‍රාර්ථනා 5 ක් ඉටු වුනා යැයි දැක්වීය.
    1. මගධ හි රජු වීම.
    2. තමන්ගේ රටට බුදුරදුන් වැඩමවීම.
    3. දහම ඇසීම.
    4. බුද්ධෝස්ථානය කිරීම.
    5. ධර්මය අවබෝධ කරගැනීම.

- රජු වේලුවනය ආරාමයක් කොට පූජා කළේය.

- රජු විවාහ වූයේ කොසොල් රජුගේ නැඟණිය සමඟය.

- කොසොල් රජුගේ නැඟණියය.

- රජුගේ **ඛේමා** නම් බිසව රූප මදයෙන් සිටි නමුත් පසුව බුදුරදුන්ගෙන් බණ අසා පැවිදිව ඛේමා තෙරණිය වූවාය.

- රජුගෙන්  දැනුවත් වීමෙන් පුක්කුසාති රජු ද වින්ධ්‍යාවෙන් උතුරෙහි **සෝවීර** දේශයේ **රෝරුව** නගරයේ තිස්ස රජුද රාජ්‍ය අතහැර බුදුන් සොයා ආහ.තිස්ස රජු පැවිදිව රහත් විය.

## පසේනදී කොසොල් රජතුමා



- කෝසල දේශයේ රජුය

- **හිමාල** කදුවැටියෙන් දකුණු පස පිහිටි **ශාක්‍ය ජනපදයද** මෙයට අයත්ය.

- බටහිරින් පඤ්චාල රට, නැගෙනහිර **සදනිරා** (ගණ්ඩක්) නදියත්, උතුරින් නේපාලයත්, දකුණත් **ගංගානදියත්**

- අගනුවර - **සැවැත්නුවර**

- **සාකේත,අයෝධ්‍යා, කුසාවතී ,උක්කට්ඨා** නගර හා **කාසි** ජනපදය රජු පාලනය කලේය.

- පියා - මහා කෝසල

- කුඩාකල නම - අග්නිදත්ත

- ප්‍රථමයෙන් බිම්බිසාර රජුගේ සොයුරියක් හා විවාහව සිටියහ.

- සැවැත්නුවරට වැඩම කල බුදුරදුන්ගෙන් බොහෝ පිරිස ඇති ප්‍රසිද්ධ වයෝවෘද්ධ මහණ බමුණන් තමන් සම්මා සම්මා සම්බුද්ධ යයි නොකියන නමුත් තවමත් තරුණ වූ ඔබවහන්සේ සම්මා සම්බුද්ධ යැයි ප්‍රකාශ කරන්නේ මන්දයැයි විමසූ විට බුදුරදුන් , රජතුමාත්, සර්පයාත්, ගිනිදලුවත්, කුඩා සාමණේර වහන්සේත් ලදරුවයි කියා අවමන් නොකල යුතුය ලෙස දැක්වීය.

- එයින් පැහැදුණු රජු බුදුන් සරණ ගියේය.

- බුදුරදුන්ගේ නෑයෙක් වීමට අවශ්‍ය වූ රජු, ශාක්‍ය ජනපදයෙන් බිසවක් ඉල්ලූ විට උඩඟු ශාක්‍යයෝ මහානාම ශාක්‍යට දාව දාසියකට උපන් වාසභඛත්තියා නම තැනැත්තිය එවීය.අගමෙහෙසිය වූ ඇයගේ පුතු විඩූඩබ නම් විය.

- රජු හා බුදුරජාණන් වහන්සේ අතර වූ සාකච්ඡා සංයුක්ත නිකායේ කෝසල සංයුක්තයේ අඩංගුය.

- බුදුරදුන් රජුගෙන් තමන් වහන්සේ කෙරෙහි මහත්සේ ගරු සත්කාර කරන්නේ මන්ද යැයි විමසූ කල්හි " භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය , ධර්මය ස්වාක්ඛාතය, සංඝයා සුපටිපන්නය.බුදුරදුන් මා වැනි කොසොල් රට වැසියෙකි.බුදුරදුන් මා වැනි අසූවෙනි වියෙහිය.මේ හේතුන් නිසා බුදුරදුන් කෙරෙහි අප්‍රමාණ ගෞරවයක් ඇති බව දැක්වීය.

- බිම්බිසාර රජුගේ අභාවයේ ශෝකයෙන් මල වේදීහිකා බිසව කොසොල් රජුගේ සොහොයුරිය විය.මෙයින් කෝපයට පත් කොසොල් රජු අජාසත් රජුට විරුද්ධව යුද්ධ කලේය.

- යුද්ධයෙන් පැරදුණු අජාසත් රජු පලාගොස් උද්‍යානයේ ගිමං හරින විට නගරයේ මල්කරුගේ දියණියක වූ මල්ලිකාගේ සැලකුම් ලැබූ රජු ඇයව අගබිසව කරගත්තේය.

- කොසොල් රජුගේ අනවබෝධයක් නිසා බන්දුල සෙන්පතිට හා පුතුන් තිස් දෙනා මරවනු ලදී.නමුත් පසුව ඒ පිලිබඳ ශෝක වී ඔහුගේ බෑණනුවන වූ දීඝකාරයන්ට සෙන්පති පදවිය දුන්හ.

- සිය මයිලනුවන් මැරීමේ කෝපයෙන් සිටි ඔහු, බුදුරදුන් ශාක්‍ය ජනපදයේ **මේදතලුම්ප** ගම වැඩ සිටින බව අසා එම ප්‍රදේශයේ චාරිකාවේ සිටි රජු බුදුරදුන් දැකීමට විහාරයට ගිය විට රජු හැරදා සේනාව සමග නැවත රාජ්‍යට පැමිණ විඩූඩබ කුමරු රජ කලේය.

- අජාසත් රජු හා මිත්‍රව සිටි කොසොල් රජු මගධය කරා ගිය නමුත් දොරටු වසා තිබූ බැවින් රජු වෙහෙස ගමන් පීඩාව හා සීතල නිසා දොරටුව අසල ශාලාවක මිය ගියේය.



## අජාසත් රජතුමා

- බිම්බිසාරගේ පුතුය

- කුණික - අප්‍රකට නම

- ප්‍රථම ධර්ම සංගායනාවට අනුග්‍රහය
- විවිධ ස්ථානවල බුදුරජාණන් වහන්සේ ගේ ධාතු නිදන් කරවා වෙහෙර කරවීම.
- කසී රාජ්‍ය සදහා යුද වැදුණු කොසොල් රජුගේ දෙවැනි ප්‍රයත්නයෙන් ජීවග්‍රහයෙන් අල්ලාගත් අජාසත්ත හොදින් ක්‍රියාකරන්නට එකගවූයෙන් තම දියණිය වජිරා කුමරිය කොසොල් රජු පාවා දුනි.
- බුද්ධ පරිනිර්වාණයෙන් වසර 24 කට පසුව තම පුත් උදය භද්‍ර විසින් මරන ලදී.

## අනේපිඬු සිටුතුමා



- සැවැත්නුවර සුමන සිටු පුත් - සුදත්ත
- විවාහය - රජගහනුවර සිටුවරයාගේ සොයුරිය සමග
- ගැල් සාත්තු වලින් නොයෙක් ජනපදවලට භාණ්ඩ යැවීමෙන් හා ගෙන්වීමෙන් විශාල ධනවතෙකුය.
- රජගහනුවර සිටු වරයාගෙන් බුදුරදුන් පිලිබද අසා පැහැදී  බුදුරදුන් දැක්මට ගොස් බණ අසා සෝවාන් විය.
- බුදුරදුන් උදෙසා ජේත කුමරාගෙන් දහඅට කෝටියක් කහවණු වැය කර මිලට ගත් උද්‍යානය සියලු පහසුකම් සපිරි ආරාමයක් කර බුදුපාමොක් මහ සඟනට පූජා කළේය.
- සම්පූර්ණ වියදම - මසුරන් පනස් හතර කෝටියක්
- විශාල පිරිසකට එකවර දහම් ඇසීමටටි , විශාල භික්ෂු පිරිසකට පහසුවෙන් නවාතැන් ගැනීමටත්, එහි වඩාත් ඉඩකට තිබීම හා දුර බැහැර සිට පැමිණි නොයෙක් දෙනාට පහසුවෙන් බුදුරදුන් හමුවීමට හැකිවීමත් නිසා බුදුරජාණන් වහන්සේ වැසිකාලයන්හි වැඩි වාරගණනක් එහි වාසය කල බව පෙනේ.
- අනාථයන්ට නිතර දන් දුන් නිසා - අනාථපින්ඩික
- දියණිය සුමනාද සකදාගාමීය.මියයන විටදී ශෝකයෙන් සිටි පියාට සිහි නුවණ ඇති කිරීමට මලනුවනි ලෙස ඇමතුවාය.
- පුතු කාල හට උපක්‍රමයෙන් ධර්මය ඇසීමට සලස්වා තෙරුවන් කෙරෙව් පැහැදුවේය.
- පසු කලෙක දිළිඳු වූද දන්දීම නැවැත්වූයේ නැත.

- මිය යෑමට පෙර සැරියුත් තෙරුන් ප්‍රමුඛ මහා සංඝයාගෙන් බණ ඇසීය.

- උසස් දෙව් පුතකුව ඉපදුනි.

## ධම්මික උපාසකතුමා



- පුතුන් සත් දෙනෙක් මෙන් දූවරු සත් දෙනෙක් විය.

- සියල්ලෝම මාපියන් සේ සැදහත්ය.

- සියල්ලෝ නිතර දන් පහන් දී ධර්මිකව ජීවත් විය.

- රෝගීව ගිලන් වූ විට වැඩම කල භික්ෂු සංඝයා සතිපට්ටානය දේශනා කල විට ගති නිමිති පහල වී පැමිනි දෙව් රථ වලට ටිකක් නවතින්න යැයි කී විට එයින් භික්ෂූන් තමාට යැයි සිතා එයින් ඉවත් වූහ.

- පසුව බුදුරජාණන් වහන්සේ ඇත්ත පෙන්වා දී මරණින් මතු දෙව්ලොව උපදී බව දැක්වීය.

# 21. බුද්ධ ශාසනයේ උපාසිකාවෝ

විශාඛා, බන්දුල මල්ලිකා , සුප්පාවාසා , සාමාවතී , මල්ලිකා

## විශාඛාවෝ



- අග්‍ර දායිකා
- අගුරට භද්දිය නුවර මෙණ්ඩක සිටු පුත් ධනංජය හා සුමනා දේවියගේ දියණිය
- සත් අවුරුදු වියේදීම බුදුන්ගෙන් බණ අසා සෝවාන් විය.
- භද්දිය නුවර සිටි සිටුවරුන් - **ජෝතිය ජටිල , මෙණ්ඩක , පූර්ණක කාකාවලි**
- කොසොල් රට ධනවත් සිටු වරුන් නොවූ බැවින් කොසොල් රජුගේ ඉල්ලීමකින් බිම්බිසාර රජු ධනංජය සිටු පවුල කොසොල් රටට යැවීය.
- කොසොල් රට සාකේත නුවර වාසය කළහ.
- සැවැත්නුවර මිගාර සිටු පුත් පූර්ණවර්ධන සිටු පුත් සමග විවාහ විය.
- ධනංජය සිටුවරයා විශාඛාට දුන් අවවාද

1. ඇතුලත ගිනි කිසිවිටක පිටතට නොදිය යුතුය. (එනම්, නැදිමයිලන්ගේ හෝ සිය ස්වාමියාගේ හෝ අඩුපාඩු පිටනදී නොකිය යුතුය.)

2. පිටත ගිනි කිසිවිටක ඇතුලට නොගත යුතුය. ( නැදි, මයිලන් හෝ ස්වාමියා ගැන පිටතදී කිසිවකු දොස් කිවහොත් එය ගෙදර අයට නොකිය යුතුය.)

3. දෙන්නහුටම දිය යුතුය. (මිල මුදල් ආදී කිසිවක් ණයට ගෙන ආපසු දෙන අයටම දිය යුතුය.)

4. නොදෙන්නහුට නොදිය යුතුය. (ණයට ගෙන ආපසු නොදෙන අයට නොදිය යුතුය.)

5. දෙන්නහුටද නොදෙන්නහුද දිය යුතුය. ( දුප්පත් නෑයන් පැමිණ යමක් ඉල්ලුව හොත් ආපසු දුන්නත් නුදුන්නත් මැනවැයි සිතා දිය යුතුය.)

6. සුවසේ හිඳිය යුතුය. (නැදි මයිලන් ආදී දැක නැගී නොසිටියත් වරදක් නොවන පරිදි සුදුසු තැනක හිඳිය යුතුය.)

7. සුවසේ අනුභව කළ යුතුය. (නැදි ආදීන්ට සියතින් සත්කාර කළ යුතුය. ඒ අය ආහාර අනුභව කළ පසු සේවක සේවකාදීන් ගැනද සොයා බලා අනුභව කළ යුතුය)

8. සුවසේ නිදීම කළ යුතුය (නැදි මයිලන් හා ස්වාමියාටද අවශ්‍යා දේ සපයා ඔවුනට පසු ගෙයද පරීක්ෂා කොට බලා නින්දට යා යුතුය. එවිට නින්ද අතරතුරදී අවදි වන්නට උවමනා නොවේ.)

9. ගිනි පිදිය යුතුයි. ( නැදි මයිලත් ගිනි ලෙස සළකා ඔවුනට යටත්ව කීකරුව විසිය යුතුය.)

10. ඇතුලත දෙවියන් වැදිය යුතුය. (නැදි, මයිලක් හා ස්වාමියා ඇතුළත දෙවියන්ය. ඔවුනට සියලු සත්කාර නොඅඩුව කළ යුතුව.)

- මිසදිටු සිය ස්වාමියාගේ පවුල ඇයගේ මැදිහත් වීමෙන් බුදුන් සරණ ගියෝය.
- මේ නිසා ඇගේ ස්වාමිපුරුෂයාගේ පියා වූ මිගාර සිටුවරයා ඇය සිය මව් තනතුරෙහි තැබීය - මිගාරමාතා
- ජේතවනාරාමයයේ අමතකව පැමිනි මේගපලදනාව විකුණා ලබා ගත් මුදලින් සැවැත්නුවර පූර්වාරාමය කරවීය.( මිගාර මාතුපාසාද විහාරය)
- බුදුරදුන්ගෙන් ඉල්ලූ කැපවර අට

    1.වැසි සලු පිදීම
    2.ආගන්තුක බත් පිදීම
    3.ගමික බත් පිදීම
    4.ගිලන් බත් පිදීම
    5.ගිලානෝපස්තායක බත් පිදීම
    6.ගිලනුන්ට බෙහෙත් පිදීම
    7.භික්ෂූන්ට බෙහෙත් පිදීම
    8.භික්ෂූන්ට නහන සලු (දියසලු)

- පුතුන් හා දියණිවරු 10 බැගින්
- වසර 120 ක් ජීවත් විය

## කෝසල මල්ලිකා



- මහා අසදෘශ දානය දුනි.
- රජුට සිහිනයකින් බියකරු හඬක් ඇසී එයට කිරීමට ගිය සර්වශතක යාගය නවත්වා බුදුරදුන් දැකීමට රජු යැවීය.
- බුදුරදුන් එහිදී එය දුගතියේ උපන් රජුගේ නැදෑ පිරිසක් ලෙස පෙන්වා දී ඔවුනට පින් අනුමෝදම් කරන ලෙස දැක්වීය.
- කරන ලද එක පාපකර්මයක් සිහි වී සත් දිනක් අවීචියෙහි උපන්නීය.සත්වන දින එයින් මිදී තුසිතයේ උපන්නාය.

## සාමාවතී බිසව

- භද්‍රවතී නුවර භද්‍රවතී සිටුතුමාගේ දියණිය
- අභිවාතක රෝගය නිසා සිටු පවුල නුවරින් පලා ගොස් හිතවත් ඝෝෂක සිටුතුමාගේ නිවසට ගියහ.
- අධික කුසගින්නෙන් සිටි ඔවුන් ඝෝෂක සිටුවරයාගෙ දන් හලෙන් ආහාර ගැනීමට සිතා , දියණිය දන් හලට ගොස් කෑම ගෙනාහුය.
- බලවත් කුසගින්නෙන් සිටි සිටුවරයා වැඩියෙන් ආහාර ගෙන දිරවාගැනීමට නොකැකිව මිය ගියේය.
- පසුව නැවත දියණිය ගෙනා කෑම වැඩියෙන් අනුබව කල මවද දිරවාගැනීමට නොකැකිව මිය ගියේය.
- අහර පිනිස දන් හලට ගිය දියණිය තනි පුද්ගලයෙක්ට පමණක් මෙවර ආහාර ගත් බව දුටු දන්හලේ පාලකයා හට සිය විස්තර කී විට කනගාටුවට පත් දන්හල පාලකයා ඇයට දියණියක සේ හදා වඩා ගත්තේය.
- පසුව විස්තර දැනගත් ඝෝෂක සිටුවරයා ඇය ගෙන්වා දුවෙකු සේ පෝෂණය කලේය.
- පසුව උදේනි රජු ඇය හා පිරිවට ස්ත්‍රීන් පන්සියයක් දෙනා බාර බාරගත් රජු සාමාවතීව අගමෙහෙසිය කරහත්හ.
- රජුට සිටි ප්‍රදාන බිසෝවරු - වාසුලදත්තා , මාගන්දියා



- ඛුජ්ජුත්තරා නම් රජගෙදරට මල් ගෙනෙන සේවිකාවගෙන් බුදු බණ අසා මුලු පිරිසම සෝවාන් විය.
- මාලිගයෙහි බිත්ති වල සිදුරු සාදා ඒවායින් මහ මග වඩින බුදුන් හා සග පිරිස දැක සතුටු විය.
- මේ බව දැනගත් උදේනි රජු පිටත බැලීමට දැල් කවුළු සාදා දුන්හ.
- මාගන්දියා සාමාවතීගේ මාලිගයේ සයනයට සර්පයෙකු දමා රජු බිය වැද්දීය.එයින් කිපුණු රජු සාමාවතිය තමන් මැරීමට උත්සාහ කලා යැයි සිතා දුන්නෙන් විද ඇය මැරීමට තැත් කල නමුත් මෛත්‍රී සිතින් සිටි නිසා ඇයට අනතුරක් නොවුණි.
- පසු කලක මාගන්දියා සිය සුලු පියා ලවා සාමාවතිය ඇතුලු පිරිස මාලිගයේ සිටියදීම එයට ගිනි තබා විනාශ කලෝය.

## ඛුජ්ජුත්තරා

- පසේ බුදු කෙනෙකුට අපහාස කල නිසා උපතින්ම කුදු වී කුදු උත්තරා ඛුජ්ජුත්තරා විය.
- සාමාවතී බිසවගේ උපස්තායක වී සුමන මල් කරුවාගෙන් මාලිගයට මල් ගෙනාවේය.

- මල්කරුගේ නිවසේ මල් ගෙන ඒමට ගිය විට එහි බුදුරදුන් හා මහාසඟනට දන් පිළියෙල කර තිබූ බැවින් මල් රැගෙන යෑමට එහි නැවතී සිටි අතර, දන් වළදා අවසානයේ දෙසූ දහම අසා සෝවන් විය.

- පෙරදී මල් වලින් බාගයක් සඟවා ගන්නා ඛුජ්ජුත්තරා මෙදින සියලු මල් රැගෙන ගියේය.පෙරට වඩා මල් තිබූ බැවින් කරුනු විමසූ සාමවතී ඇතුලු පිරිස ඇගෙන් බණ අසා සෝවන් විය.

- සතුටට පත් පිරිස ඇයව මව් තනතුරේ තැබීය.

- ඇය බුදුරදුන්ගෙන් අසන ධර්මය දරගෙන් විත් සමාවතී ඇතුලු පිරිසට ප්‍රකාශ කළහ.

## බුදුසසුනේ තනතුරුලත් උපාසකවරු

(1) **තපස්සු භල්ලුක** වෙළෙඳ දෙබෑයන් බුදුන් දහම් සරණ ගිය ප්‍රථම ද්වේවාචික උපාසකවරු වූහ.

(2) **සුදත්ත** හෙවත් **අනේපිඬු සිටුවරයා** අග්‍රදායක පදවිය ලද්දේය.

(3) **චිත්ත ගෘහපතියා** ධර්ම කථිකයන් අතර අග්‍රස්ථානය ලද්දේය.

(4) හත්තාලවක රජු සතර සංග්‍රහ වත්ථුයෙන් රට වැසියාව සංග්‍රහ කළවුන් අතරින් අග්‍රස්ථානය ලද්දේය.

(5) අග්‍ර ප්‍රණීත දායකයා වූයේ **මහානාම ශාක්‍ය රජුය.**

(6) රිසි දැ දෙන්නවුන් අතරින් අග්‍ර වූයේ **උග්ග ගෘහපතියාය**.

(7) අචල ශ්‍රද්ධා ඇත්තවුන් අතරින් අග්‍ර වූයේ සුරම්බට්ඨය

(8) පුද්ගලික ප්‍රසාද ඇත්තන් අතරින් **ජීවක කෝමාරභච්ච** විට ප්‍රමුඛස්ථානය ලද්දේය.

(9) සංඝොපස්ථායකයන් අතර අග්‍රස්ථානය ලද්දේ **උග්ගහ ගෘපතියාය.**

(10) විශ්වාස කථා ඇතියවුන් අතර අග්‍රස්ථානය ලද්දේ **නකුල පිතු ගෘහපතියාය.**

## බුදුසසුනේ තනතුරුළත් උපායිකාවෝ

(1) **සුජාතාව** බුදුන් සරණ ගිය ප්‍රථම උපාසිකාව වූවාය.

( 2 ) අග්‍රදායිකාව වූයේ **විශාඛාවය**.

( 3 ) ප්‍රණීත දැ දෙන දායිකාවන් අතර අග්‍රස්ථානය ලද්දේ **සුප්පවාසාවයි.**

(4) **උත්තරා** ධ්‍යානීන් අතර අග්‍රස්ථානය ලද්දීය.

(5) බහුශ්‍රැතාවියන් අතර **ඛුජ්ජුත්තරාව**

( 6 ) නොසෙල් වෙන සැදැහැ ඇත්තවුන් අතරින් **කාකියානි**

( 7 ) විශ්වාස කථා ඇත්තියන් අතරින් **නකුල මාතා**

(8) මෛත්‍රී විහාර ඇත්තියන් අතරින් **සාමාවතී**.

(9) ආරංචියෙන් බුදුගුණ අසා පැහැදුන වුන් අතරින් **කාලි**.

(10) ගිලානෝපස්ථායිකාවන් අතරින් **සුප්පියාද** යන මේ පිරිස අග්‍රස්ථාන ලැබූහ.